**වසර 2500 පසු**
**මේ ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීමයි.**

# සත්‍ය ධර්මය අවදි විය

(දහනමවන වෙළුම)

# අති විශේෂ දේශනා

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදයේ ප්‍රකාශනයකි.

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලුම ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළකිරීම් සපුරා තහනම් ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරේ.


**අති විශේෂ දේශනා**

බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය - 2022 දෙසැම්බර්

ධර්ම ග්‍රන්ථය පිළිබඳ විමසීම්
Email: buddothpado@gmail.com
Tel +94 703 518 747 - බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ

පරිගණක මුද්‍රණ සැකසුම
**වාක්‍යා රූ**
අංක 42/8, මකුළුදූව, පිළියන්දල.
දුරකථනය 011 2 708377

මුද්‍රණය
**K.S.U. ග්‍රැෆික් (පුද්) සමාගම**
අංක 510, රාජගිරිය පාර, රාජගිරිය
දුරකථන 011 2 884701

අන්තර්ජාලයේ ධර්ම දේශනා ශ්‍රවණය කිරීමට
www.buddothpa.com / www.buddothpado.lk

facebook හරහා ශ්‍රවණය කිරීමට
https://www.facebook.com/Buddothpado

1. Buddothpado -
https://youtube.com/@buddothpado

2. Buddothpado Aryanwahanse -
https://youtube.com/@buddothpadaaryanwahanse

3. Buddothpado Unity -
https://youtube.com/@BuddothpadoUnity

4. Buddothpado English -
https://youtube.com/@weeejj

5. Buddothpado Tamil -
https://youtube.com/@buddothpadotamil

6. Buddothpado Zoom Discussion -
https://youtube.com/@Zoom-up2ik

7. Buddothpado Night Discussion -
https://youtube.com/@BuddothpadoNightDiscussi-zj2bk

8. Buddothpado English Zoom Discussion -
https://youtube.com/@BuddothpadoEnglishZoom

9. Buddothpado Radio Damma Discussion -
https://youtube.com/@BuddothpadoRDD

10. Buddothpado TV Damma Desana -
https://youtube.com/@BuddothpadoTVdammaDesana

## නිවන් මඟ යායුතු අනුපිළිවෙල

(සත්‍ය කෘත්‍ය කෘතක් ද්වාදසාකාරක තිපරිවට්ටම්)

**බුදුන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රය තුලින් ප්‍රථම වතාවට නිවන් මඟ යා යුතු ආකාරය අනුපිළිවෙලින් මෙසේ වදාළ සේක.**

1. **පූර්ව භාග ප්‍රතිපදාව** (පළමුව කලයුතු දේ) සත්‍යඥාණ අවබෝධය
2. **අපරභාග ප්‍රතිපදාව** (දෙවනුව කලයුතු දේ - ප්‍රායෝගිකවන ආකාරය)

   2.1 කෘත්‍යඥාණය - ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම

   2.2 කෘතක්ඥාණය - ආත්මීය භාවයෙන් මිදීමේ අත්දැකීම

1. **පූර්ව භාග ප්‍රතිපදාව (සත්‍යඥාණ අවබෝධය) ශ්‍රාවකයාගේ උත්සාහය මත සහ කල්‍යාන මිත්‍රයාගේ පණිවිඩය මත පවතී**

   බුද්ධදර්ශනය අවබෝධකරගැනීම (දර්ශන ඥාණය = සත්‍යඥ්ඥාණය)

   - සිත හැදෙන හැටි අවබෝධකරගැනීම
   - සිත මායාවක් බව අවබෝධකරගැනීම සිත යනු අරමුණම බව දැනගැනීම
   - අරමුණෙහි සත්‍ය දැකීම, අරමුණට නොරැවටීම
   - ආත්මීය භාවය හැදෙන ආකාරය අවබෝධකර ගැනීම අරමුණම ආත්මය බව දැකීම
   - ශූන්‍යතා අවබෝධය
   - ත්‍රිවිද්‍ය දැනගැනීම (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතූපපාත ඥාණය, ආසවක්‍යාඥාණය)
     (සිත = අරමුණ = ආත්මය)

   1.1 කල්‍යාණ මිත්‍රයාගෙන් පණිවිඩය අසාදැන ගැනීම

   1.2 නැවත නැවත සද්ධර්මශ්‍රවනය

   1.3 යෝනිසෝමනසිකාරය

   1.4 ධම්මානුධම්ම ප්‍රතිපදාව
   **ශ්‍රාවකයා උට්ඨාන වීර්යෙන් කලයුතු දෙයින් වැඩි ප්‍ර තිශතයක් ඇත්තේ පූර්ව භාග ප්‍රතිපදාව තුලයි.**

**බුදුන් වහන්සේ කී පරිදි, නිවන් මඟයන ශ්‍රාවකයා කලයුතු සියල්ල හිමාලය පර්වතය නම්, පූර්ව භාග ප්‍රතිපදාවෙන් පසු තව කලයුතු වන්නේ අත ඇති ගල් කැටයක පමණ දෙයකි.**

- සක්කාය දිට්ඨි ප්‍රහානය මෙතැනදී සිදුවේ.
- ශ්‍රාවකයා ආර්‍ය භූමියට පිවිසේ.

2. අපරභාග ප්‍රතිපදාව

2.1. **කෘත්‍යඥාණය** - අසාදැනගත් ධර්මය ප්‍රායෝගිකව අත්දැකීම - (ධර්මය තමාතුලින් දැකීම = සතර සතිපට්ඨානය වැඩීම).

2.1.1. **අරමුණෙහි සත්‍ය දැකීම**; --දර්ශනය තුල සිත හැදෙන හැටි දකින ආකාරය ප්‍රායෝගිකව අත්දැකීම(යථාභූත ඥාණය = යෝනිසෝ මනසිකාරය)

2.1.2. **අරමුණෙහි සත්‍ය දැක මිදීම**
අරමුණ සත්‍යක් නොවන බව ප්‍රායෝගිකව අත්දැකීම
ඒ අනුව ආත්මයක් නැතිබව ප්‍රායෝගිකව අත්දැකීම
සවිතක්ක සවිචාර සමාධිය අත්දැකීම (විදර්ශනා සමාධි.)

2.1.3. **ත්‍රි විද්‍ය ප්‍රායෝගිකව අත්දැකීම** (පුබ්බේනිවාසානුස්සති ඥාණය, චුතුපපාත ඥාණය, ආසවක්‍ෂය ඥාණය)

2.2. **කෘතක්ඥාණය (ශ්‍රාවකයාට කලහැකි කිසිවක් නැත. සොභාදහමේ අනාවරනයක් පමනි. ඥාණයට හසුවේ. බුද්ධ වචනයට අනුව මෙහිදී දැඟලුවහොත් පාරුව ගිලේ.) - සම්මා සමාධි, සම්මා විමුක්ති**

ආත්මයක් නැතිබව ප්‍රායෝගික අත්දැකීමෙන්, මිදීම අත්දැකීම (ආත්මීය භාවයෙන් මිදීම නිසා ඇතිවන සමාධිමත් ස්වභාවය)

අවිතක්ක අවිචාර සමාධිය - අනිමිත්ත ශුන්‍යත අප්‍රනීත චේතෝ විමුක්තිය - අරහත්ත සමාධිය - නිස්සත්තෝ නිර්ජීවෝ ශුන්‍යෝ

ශාන්ත ප්‍රනීත නිර්වාන සම්පත්තිය

# බුද්ධෝත්පාදෝ

- නිවැරදි නිවන් මඟ හඳුනා ගැනීම (සත්‍ය, කෘත්‍ය, කෘතක්)
- නිර්වාණය සකස් කරගැනීම සඳහා ප්‍රායෝගිකව ඔබ කටයුතු කළ යුතු ආකාරය.
- බුදුරජාණන් වහන්සේ දම්සක් පැවතුම් සූත්‍රයේ පැහැදිලි කරන ආකාරයට "එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඥාණදස්සනං සුවිසුද්ධං අහොසි"
- සත්‍ය ඥානය
- කෘත්‍ය ඥානය
- කෘතක් ඥානය

ලෙස නිවැරදිව නිවන්මග දේශනා කර ඇත.

- මේ පිළිවෙළට නිවන් මඟ වැඩීම තුළ ආත්ම දෘෂ්ටිය දුරුවී, ආත්ම සංඥාව දියවී, අනාත්ම ස්වභාවයට පැමිණෙන ආකාරය පැහැදිලි කර ඇත.
- එනම් ඔබට සතියක් තුළ නිවන් මග මුල, මැද, අග ලෙස කටයුතු කරන ආකාරය පහතින් පෙන්වා ඇත.

**1. පළමුවෙනි දිනය**

බුද්ධ දර්ශනය පැහැදිලි කිරීම. (සත්‍ය ඥානය අවබෝධ කරගත යුතුයි.) ආත්මය හැදෙන හැටි.

**2. දෙවෙනි දිනය**

බුද්ධ දර්ශනය පැහැදිලි කිරීම. (සත්‍ය ඤාණය අවබෝධ කරගත යුතුයි) ආත්මය හැදෙන හැටි, ආත්ම සංඥාව, ආත්ම දෘෂ්ටිය දැනගැනීම.

**3. තුන්වන දිනය**

අරමුණ බාහිර ඇත්තක් නොවන බවත්, එය සිතිවිල්ලක් බවත් දකිමින් කටයුතු කිරීම.

**4. හතරවන දිනය**

අරමුණ සිතිවිල්ලක් බවත්, සිතිවිල්ලක් සත්‍යක් නොවන බවත්, දකිමින් කටයුතු කිරීම.

**5. පස්වන දිනය**

බාහිරත් සිතත් සත්‍යක් නොවන බව දකිමින්, මිදෙමින් කටයුතු කිරීම.( ක්‍රියා සිත දකිමින් කටයුතු කිරීම) ආයතන දැකීම.

**6. හය වන දිනය**

අරමුණ ආත්මය වශයෙන් නොගෙන ක්‍රියාවලිය දකිමින් කටයුතු කිරීම.

**7. හත්වන දිනය**

විවේක සුවයෙන් කටයුතු කිරීම.

- මෙය සතියක් වඩන ආකාරය ඉහත දැක්වේ. තවදුරටත් මේ ආකාරයෙන් සති දෙක, තුන සහ මාසයක් යන ආකාරයට වැඩි වෙන ලෙස සකස් කරගත හැක.
- මෙය මූලාශ්‍ර කොටගෙන කෙන කෙනාට සුදුසු ආකාරයෙන් සකස් කර ගත හැක.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# පෙරවදන

මෙය ඇසෙන ඔබ මහා භාග්‍යවන්තයි. ඔබ කොහේද යන්නේ, මුලාව රැවටීම හරි භයානකයි. සත්‍ය කුමක්ද? ඔබ සංසාර චක්‍රයක අතරමං වෙලා. විටෙක ඔබ සතුටින්, විටෙක ඔබ දුකෙන්, සැපේ දුකේ දෝලනය වන මේ ජීවිතය හරි භයානකයි. ඔබ සත්‍ය දන්නේ නෑ. ඒ සත්‍ය ඔබ අවබෝධ කළ යුතුයි. ඔබ සංසාර දුකින් මිදෙන කතාවයි මේ.

මෙම දේශන මාලාව මඟින් ඔබට සත්‍ය ධර්මය අවබෝධය සඳහා යම්කිසි උපකාරයක් ලැබෙනවා. සියලු දුකින් මිදෙන තැන හමුවන ඒ 'සදාතනික සුවය' මෙම දේශන මාලාව මගින් අත්දකින්නට ඔබට ද හැකියාව ලැබේ. බාහිර ඇත්ත කරගෙන සිටින තාක් ඔබ ඉන්නේ මිත්‍යාදෘෂ්ටියේමයි. ඒතාක් ඔබට දුක උරුමයි. සිතද මායාවක් වන තැන

සිතේ මායාවෙන් මිදුනු තැන,
බාහිර ඇත්තක් නොවන තැන
සිතද සත්‍යයක් නොවන තැන
ඒ සිතෙන් මිදෙන තැන
ඒ බාහිර ඇත්තක් නොවන තැන
'අජ්ජත්ත බහිද්ධා' කියන තැන
අන්ත දෙකම මිදුන තැන, එනම්,

ධර්මය තුළ සඳහන් වන නාම, රූප අන්ත 2න් මිදීමයි නිවන් මග වන්නේ. මෙලොව උපදින සියලු සත්ත්වයෝ නිවනින්මයි සැනසීම ලබන්නේ. ධර්මය නම් ධර්මතාවයයි. ඒ පටිච්චසමුප්පාද ධර්මයයි. එනම් ඉදප්පච්චතාවයයි. එනම් දෙයක් නැති බවයි. දෙයක් නැති බව බුද්ධ ස්භාවයයි. දෙයක්

නැති තැන චේතෝවිමුක්තියයි. එනම් අනිමිත්ත, ශූන්‍යත, අප්ප්‍රනිත චේතොවිමුක්තියයි. ඒ බුද්ධ ස්වභාවයයි. මේ දහම අවබෝධ වේ නම් ඔබ අප සියලු දෙනාම ඒ බුද්ධ ස්වභාවටයි අවදි වෙන්නේ. ඒ බුද්ධ යනු ශූන්‍යතාවයි.

"නිස්සත්වෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ"

පහන නිවීගිය පසු ගිය තැනක් කොහින්ද? ඒ නිවීමමයි නිවන. ඒ කෙලෙස් ගින්නේ නිවීයාමයි. ඒ සසර ඕඝයේ නිමාවයි. ඒ විඤ්ඤාන නිරෝධයට ගිය තැන සියලු දුකෙන් මිදීමයි.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතෝ පභං
එත්ථ ආපෝච පඨවි ච - තේජෝ වායෝ න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපංච - අසේසං උපරුජ්ජති
විඤ්ඤානස්ස නිරෝධෙන - එත්තෙ තං උපරුජ්ජති

සිතෙන් මිදෙන මඟ
නිවන් දකින මඟ
දුකින් මිදෙන මඟ
එයයි නිස්සරණ මඟ

නිවැරදි නිවන් මඟ ඔබටත් හමුවේවි. ධර්මය සොයන්නාට බුදුන් හමු වේ. බුද්ධ යනු සොබාදහමයි. ප්‍රායෝගික පුහුණු විය යුතු ආකාරය හඳුනාගෙන අවබෝධ කළ යුතු ධර්මයකි.

**බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේ**

# හැඳින්වීම

මේ ගෞතම බුද්ධ ශාසනය තුළ අපි හැමදෙනාටම අවශ්‍ය වන්නේ නිවීමක්, සැනසීමක්, දුකින් මිදීමක්. නිරන්තර පවත්නා රාග, ද්වේශ, මෝහ. නිවා ගැනීමයි නිවන කියන්නේ. කිසාගෝතමී, පටාචාරා, අම්බපාලි වැනි බොහෝ පිරිස් බුදුරජාණන් වහන්සේ අභියස ඒ ගිනි නිවා සදාකාලික සැනසීම ලැබුවා.

අද බෞද්ධ සමාජයට මේ නිවීම සැනසීම අහිමි වෙලා බොහෝ පිරිස් නොයෙකුත් රාමුවලට සිරවී, ග්‍රන්ථ ධූරයට පමණක් සීමාවෙලා සිටින්නෙ. ඒ තුළින් සත්‍ය දැකීම අපහසුයි. විදර්ශනා ධූරය සමාජයෙන් ඈත් වී ඇති මෙවන් යුගයක නැවතත් ඒ ගිලිහී ගිය බුද්ධ දර්ශනය, විදර්ශනා ධූරය තුළින් ම ඉස්මතු වෙනව. ඒ අති ගම්භීර, නිර්මල, පරම සත්‍යය අපට අහන්න ලැබෙනවා. මේ නිවැරදි බුද්ධ දර්ශනය පෙර නොඇසූ විරූ දහම, ධම්ම චක්ඛුෂය අපි අවබෝධ කරගත යුතු වෙනව. මේ සත්‍ය දර්ශනය බාහිරින් හමුවන දෙයක් නොවේ. බාහිර ඇත්ත වූ තැන පවතින්නෙ ආත්මීය ස්වභාවයක්.

මේ අනාත්ම ධර්මය උතුම් බුද්ධ දර්ශනය 'බුද්ධෝත්පාද ධර්ම ග්‍රන්ථ මාලාව' තුළින් ඔබට කියවන්න ලැබෙනව. එය හොඳින් කියවන්න. ධාරණය කරගන්න. ඔබට සත්‍ය අවබෝධයට මෙය උපකාරී වේවි. මේ අප ගන්නා උත්සාහයේ එක් අවස්ථාවක් පමණි.

**අප කල්‍යාණ මිත්‍ර මෙහෙණින් වහන්සේ**

**"සබ්බදානං ධම්මදානං ජිනාති"**

මේ උතුම් සත්කාරය සඳහා අර්ථයෙන්, ධර්මයෙන්
සියළුම ආකාරයෙන් උදව් උපකාර කළා වූ
සියළුම දනන් හට, මෙම ධර්ම දානය තුළින්
ජනිත වන්නා වූ පුණ්‍ය ශක්තිය
මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම
ඒ උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය
අවබෝධ කරගෙන සංසාර දුකින් මිදී
නිවනින් ම සැනසීම ලබන්නට
හේතු වේවා !

# පිදුම



යමෙක් පෙරවිසූ කඳ පිළිවෙල
දනී ද, දෙව්ලොව හා
අපායත් දනී ද, දතයුතු දේ
මනාව දැන නිම කළේ ද,
මුනි බවට පත්වී ද,
බඹසර වැස නිම කළේ ද,
ඔහු උත්තම පුරුෂයෙකි.
සෑම සියළු දෙනාමත්
මේ ‘සත්‍ය ධර්මය’ නුවණින්
විමසමින්, සත්‍ය අවබෝධ කොට
සසර දුකින් මිදීමට අධිෂ්ඨානය
කරමින් නිවන්මඟට පිළිපන්
විය යුතුයි. ඒ උතුම් අවබෝධයන්
සාක්ෂාත් කර නිස්සරණ මඟ
ඇවිදයන්නට මේ
‘ශ්‍රී සද්ධර්මය’ නිවනටම
උපනිශ්‍රය වේවා!

# පටුන


| | | පිටුව |
|---|---|---|
| | බුද්ධෝත්පාදෝ | 6 |
| 01 | ගිහි පැවිදි සියල්ලන්ටම නිවන් මග විවරයි | 15 |
| 02 | 'මම' 'මගේ' 'මගේ ආත්මය' හැදෙන හැටි | 28 |
| 03 | සත්‍ය දන්නෝ සහ නොදන්නෝ | 38 |
| 04 | සංඥා අභිසංකරණයක්ය මහණෙනි ජීවත්වීම | 51 |
| 05 | ධර්මයේ සිසිලස ඔබමය | 56 |
| 06 | අනුත්තර ස්වභාවයි නිවනේ අත්දැකීම | 59 |
| 07 | තමාගේ ආත්ම ස්වභාවය හඳුනා ගන්න | 82 |

# 01

# ගිහි පැවිදි සියල්ලන්ටම නිවන් මග විවරයි

**ආර්යයන් වහන්සේ :** තෙරුවන් සරණයි. ඔබතුමා බාහිර ගැනද ඔය කියන්නේ.

**උපාසක :** ඔව් බාහිරෙන් කියන්නේ අපිට පේනවනේ ස්ක්‍රීන් එකේ.

**ආර්යයන් වහන්සේ :** නෑ.නෑ. දැන් ඇස් අන්ධ වුනොත් පේනවද?

**උපාසක :** ඒක තමයි අන්ධ වුනොත් පේන්නේ නැහැනේ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඇහැට මොකක් හරි වුනොත් රොඩ්ඩක් හරි තිබ්බොත් ඒකත් එක්කනේ පේන්නේ.

**උපාසක :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඇහේ මොකක් හරි වර්ණ අන්ධතාවයක් තිබ්බොත්, ඒකත් එක්ක නේද පේන්නේ. ලොකු වෙලා පෙනුනොත් ඒක ලොකු වෙලා පේන්නේ, පොඩි වෙලා පෙනුනොත් පොඩි වෙලා පේන්නේ. ඇහැට පේනවා කියන එක, ඒක තමයි කිව්වේ මට පේනවා නෙවෙයි කියලා.

**උපාසක :** මට පේනවා නෙවෙයි කියලා නේද එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඇත්තටම එළියේ තියෙන එකක් පේනවා නෙවෙයි, ඇහැටනේ පේන්නේ. ඇහැට මැවෙන එකක්නේ පේන්නේ. දැන් ඔය කම්පනය වන එක එළියේ තියෙන එකක් නෙවෙයි. ඇහැට

මැවෙන එකක් අපි දකින්නේ. ඇහැට මැවෙන එකක් අපි දකිනවා මිසක් විඤ්ඤාණ මායාවට මැවෙන එකක් කොහේවත් තියෙනවා නෙවෙයි. ඒකයි අර 'අප්පටිත්ඨිත විඤ්ඤාණය' කියන්නේ, 'අනි දස්සන විඤ්ඤාණය'. දැන් පෘතග්ජන ස්වභාවයන් තුළ තියෙන්නේ 'පටිත්ඨිත විඤ්ඤාණයි. විඤ්ඤාණය කියන්නේ වචනයක් විතරයි. විඤ්ඤාණය කියලා දෙයක් නෑ. විඤ්ඤාණය කියන්නේ දැනෙන ස්වභාවයට මේ ප්‍රායෝගික පැත්තෙන් තමයි මේක අහුවෙන්නේ තියෙන එකක් නෙවෙයි. විඤ්ඤාණය කියන්නේ අර කම්පන වේගෙට දෙයක් වගේ දැනෙන ගතිය. ගිනි බෝලෙ කැරකෙන කොට ගිනි වලල්ල වගේ පේනවා, වලල්ල වගේ පෙනුනට එහෙම එකක් නෑ. ඒක තමයි විඤ්ඤාණය. විඤ්ඤාණය කියන්නේ මායාවක් නිකන් නෙවෙයි. විඤ්ඤාණය කියන මායාව කොහෙවත් තියෙන එකක් නෙවෙයි. **සිතට මැවෙන ලෝකේ කොහෙවත් තියෙනවා නෙවෙයි කිව්වේ ඒකයි. ඒක 'පැන්ටසි' එකක් වෙන්නේ. ඒක නිසා තමයි සැබෑ ලෝකයේ සත්‍ය සිහිනය.** එතෙන්ට ගියොත් තමයි අන්න මෙතන අනුසෝතයෙන් පටිසෝතයට එනවා වෙන්නේ.

එහෙම නැත්නම් අනුසෝතයේ ඒ කියන්නේ පෘතග්ජන කෙනා සතා සිව්පාවා ඔක්කොම ඉන්නේ බාහිර කියල හිතාගෙන. ඒක තමයි දෙයක් තියෙනවා මාත් ඉන්නවා, ලෝකෙත් තියෙනවා, දිව්‍ය ලෝකෙත් තියෙනවා නිරයත් තියෙනවා. ඔක්කොම තියෙනවා. බලන කොට ඒ තියෙනවා කියල ගත්තට එහෙම එකක් නෑ. දෘෂ්ටියක් තියෙන්නේ. අපි හිතන දේවල් කොහේවත් නෑ. අපිට බාහිර අත් දකින්න ක්‍රමයක් නෑ. විඤ්ඤාණ මායාවෙන් ගන්නකොටම ඒක සිතුවිල්ලක් වෙලා ඔබ තුමා කොයි පළාතෙද?

**උපාසක :** තව එකක් තියෙනවා ආර්යයන් වහන්ස අපි මේ භවයේදීම අපිට දැන් සෝවාන් සකෘදාගාමි, අනාගාමි, අර්හත් කියන ඒ කියන්නේ අපි අහල තියෙන්නේ සෝවාන් වෙලා ඊළඟ භවයේ දී තමයි අනිත් ඵල ලැබෙන්නේ. මේ භවයේදීම අපට ලබන්න පුළුවන්ද ඒ හතරම.

**ආර්යයන් වහන්සේ :** ඇත්තටම කියනවා නම් ඔය ආත්ම 7ක් කියන්නේ 'සප්ත බෝජ්ඣංග මේ මොහොතෙමයි ඔක්කොම වෙන්නේ. එහෙම කවුරු හරි බණක් කියනවා නම් ඒ බණ අහන්න එපා. එයාට

මේ 'ක්ෂණ සම්පත්තිය' ගැන අවබෝධයකුත් නෑ. සාන්දිට්ඨික ධර්මය ගැන අවබෝධයකුත් නෑ. අකාලික දහම ගැන අවබෝධයකුත් නෑ. එයා ඉන්නේ සම්මුතියක හිර වෙලා. සම්මුතියේ තියෙනවා. පෘතග්ජන භූමිය තුළ ලොකු කතාවක් තියෙනවනේ. අශ්‍රැතවත් පෘතග්ජන මිථ්‍යාදෘෂ්ටික උම්මත්තක භූමිය කියන්නේ මේ ක්ෂණය විතරයි කියන්නේ, තියන එකක් නෙවෙයි. ඒ අශ්‍රැතවත් මිථ්‍යාදෘෂ්ටික භූමිය දෙයක් තියෙනවානේ. දෙයක් තියෙනවා කියන තැන කම්පනයක් තියෙනවානේ. මේ **කම්පනය තුළ සියල්ල සකස් වෙන එකක් තියෙනවා. දෘෂ්ටි ගත කෙනා කියන්නේ 'සිරස' වගේ නාලිකා ඔක්කොම හැම තැනම අහුවෙනවා. හැබැයි දෘෂ්ටියෙන් මිදෙනවා කියන්නේ 'සිරස' ඉවරයි. 'සීරෝ' තමයි. එතකොට මොකද වෙන්නේ, ආයි සිරසක් නෑ. ඔන්න ඔතන තමයි නිවන තියෙන්නේ.**

**මේ ධර්මය අහනවා කියන්නේ කෙලින්ම ශූන්‍යත පටිසංයුක්ත දේශනානේ. ශූන්‍යත පටිසංයුක්ත දේශනා තමයි බුද්ධෝත්පාද දේශනා. බුද්ධෝත්පාද දේශනාවල දෘෂ්ටිගත ලෝකයක් තියාගෙන කරන කතා නෑ. ඒවා තියෙන්නේ මිථ්‍යා දෘෂ්ටික භූමියේ. කර්ම භූමියේ. ඒ හේතුඵල දහමේ මේවා නෑ.** බුදුන් වහන්සේ දේශනා කරන්නේ හේතුඵල දහම හේතුඵල දහමේ මේ මොහොතේ ඇති වෙනවා නැති වෙනවා දකින එකක්. එතකොට කර්ම භූමියේ දෙයක් තියෙනවා. දෙයක් තියෙන හින්දා එයාට දෘෂ්ටියකුත් තියෙනවා. ඇත්තටම එයාට සසර ඕඝයකුත් තියෙනවා. ඔබ තුමා දැන් කල්පනා කරන්න ඕනා මෙය ආත්ම හතක් තියෙන්නේ ඔක්කොම තියෙන්නේ 'සසර ඕගයක්' තියෙන කෙනාටනේ. දැන් එතනින් මිදෙනවා හේතුඵල දහම අහන කොට, ආයි ඒ ගොඩට පනින්න විදිහක් නැහැනේ. එහෙනම් කර්ම භූමිය, නිගන්ඨනාථ පුත්‍රගේ ධර්මය තියෙන්නෙ.

ධර්මය තුළ තියෙනනවා ආත්ම 7ක් කියලා කියන්නේ මොකක්ද? භවය කියන්නේ, මේ මැරිලා උපදින එකක් නෙවෙයි **භවය කියන්නේ, මේ මොහොතේ මේ 'ක්ෂණයේ' භව සංඥා කියන්නේ, මේ මොහොතෙමයි භවය සකස් වෙන්නේ.** භවය කොහේවත් තියෙන එකක් නෙමෙයි. 'අජ්ජොසායතිට්ඨති යා රූපේ නන්දී' 'තදුපාදානං භවෝ' මේ කියන්නේ මේ 'අජ්ජෝසායතිට්ඨති' කියන්නේ මේ අරමුණ. **අරමුණ බැස ගත්තොත්**

**දෙයක් කර ගත්තොත්, නන්දියකුත් තියෙනවා. උපාදානයකුත් තියෙනවා. භවයකුත් තියෙනවා. භවයකුත් තියෙනවා කියන එක හැබැයි මේ භවය මේ මොහොතේ සකස් වුනා මිසක් භවය තියෙන එකක් නෙවෙයි.** 'භව නිරෝධෝ නිබ්බාණෝ' කිව්වේ, මේ මොහොතේ දෙයක් නැති බව දකින එකයි හේතුඵල දහම තුළ අකාලික දහමක් වෙන්නේ.

මේ **ක්ෂණයේ භවයයි ඔක්කොම සකස් වෙන්නේ, අන්න 'පෝනෝභවිකා' මේ භවය ඊගාව භවය. මේ පැත්ත බලනකොට එක භවයක් 'බිත්තිය' පේනවා, මේ පැත්ත බලනකොට තව භවයක් පුටුව පේනවා, මේ පැත්ත බලන කොට තව භවයක් ඇඳ පේනවා. දැන් මේවා ඔක්කොම තියෙන්නේ 'පෝනෝභවිකා' ඔක්කොම ටික තියෙනවා වගේ එකට එකතු වෙලා වගේ. ඕක තමයි 'උපාදාන භවෝ' කියලා කිව්වේ.** ඒ කියන්නේ අර ගැට ගැහෙනවා කියලා. 'පටිච්ච' වෙනවා. පටිච්ච වෙන එක ගැට ගැහෙන එක 'පටිච්ච සමුප්පාදය' තුළින් පෙන්වනවා. අවිද්‍යා පච්චයා සංඛාරා' මේක ඇත්තටම කම්පනය වන වේගෙට, මේ වේගයක් තුළයි මේ සේරම 'ස්පාක්' වෙන වේගෙට දෙයක් වගේ දැනෙන්නේ ලෝකේ තියෙනවා.

**මේ පැත්ත බලන කොට පුටුව තියෙනවා. මේ පැත්ත බලන කොට බිත්තිය තියෙනවා. ආයි මේ පැත්ත බලන කොට කලින් පුටුව දැනුත් තියෙනවා. හරිනේ හෙටත් ඇවිල්ලා බලන කොට ඒ පුටුව තියෙනවා. හරි නේද? එතකොට තුන් කාලෙම තියෙනවා අකාලික දහම හම්බවෙයිද? නෑ. එයා ඉන්නේ කර්ම භූමියේ එයාට කර්ම විපාක තියෙනවා.** එයාට ඔක්කොම තියෙනවා. දෘෂ්ටිත් තියෙනවා සේරම තියෙනවා. දිව්‍යලෝකෙත් තියෙනවා. නිරත් තියෙනවා ඔක්කොම තියෙනවා. මොකද **එයා 'සිරස' වගේ නාලිකා අහුවෙනවා ප්‍රීකොන්ස්' එකක්. මේ ප්‍රීකොන්ස්' එක ශූන්‍ය කරන එක තමයි නිවන් දකිනවා කියන්නේ** හේතුඵල දහම අහපු ගමන් ටක් ගාල එන්නේ අනික් පැත්තට, ක්ෂණ සම්පත්තියටයි.

මේ 'දුර්ලභං මනුස්සත්තං' 'දුර්ලභං සද්ධර්මස් ශ්‍රවනං' 'දුර්ලභං ක්ෂණ සම්පත්තිං' 'දුර්ලභං පති රූපදේශ වාසෝච' මේ ක්ෂණ සම්පත්තිය කියන්නේ බුද්ධක්ෂණය දකිනවා කියන්නේ, මේ මොහොතේ දෙයක් නැති බව දකින තැන ආත්මයකුත් නෑ. අන්න බුද්ධක්ෂණයට අවධි

වෙන එකයි ක්‍ෂණ සම්පත්තිය. අන්න 'දුර්ලභං මනුස්සත්තං' දුර්ලභං ක්‍ෂණ සම්පත්ති' කිව්වේ හේතු ඵල දහම තුලයි ක්‍ෂණ සම්පත්තිය තියෙන්නේ.

හේතුඵල දහම දේශනා කරන කිසි කෙනෙකුට කර්ම භූමිය හම්බ වෙන්නේ නෑ. හේතුඵල දහමට එන කෙනෙක් බෞද්ධයෙක් වෙනවා. ඒ බෞද්ධයාට කර්ම භූමිය ඉවර වෙනවා. හේතුඵල දහම නැතුව කර්ම භූමියේ ඉන්නවා නම් නිගන්ඨ නාථ පුත්තගේ කර්මය තුළ දෘෂ්ටිය තුළ හිරවෙලා ඒකයි 'දස ධම්ම' සූත්‍රයේ 'යං කම්මං කරිස්සාමිති කල්‍යාණංවා' 'පාපකංවා තස්ස දායාදේ භවිස්සාමීති' කිව්වේ. එන සිතුවිල්ල කර්මයෙන් කියන එක බැහැර කලොත් විතරයි භික්ෂුවක් වෙන්නේ කිව්වේ. ඇත්තටම හේතුඵල දහම දැන් විවරයි. ප්‍රායෝගිකව, අත්දැකීම් සහිතව ලෝකයාට විවර කරනවා පටිච්ච සමුප්පාද ධර්මයෙන් නිවන් මග ඇතැඹුලක් සේ ඔබට හම්බ වෙනවා දැන්. පටිච්ච සමුප්පාද ධර්මය මේ ක්‍ෂණ සම්පත්තිය තුළ දැන් හම්බවෙනවා. 'චතුරාර්ය සත්‍ය ධර්මය ක්‍ෂණ සම්පත්තිය තුළ හම්බ වෙනවා.

දැන් ඔය ඉපදනෙ මැරෙන භවය තියෙන්නේ කර්ම භූමියේ, ඒක තියෙනවා කර්ම භූමියේ ඉන්නේ. එයා හේතුඵල දහම දන්නේ නෑ. අද ඉන්නවා මිථ්‍යාදෘෂ්ටික බෞද්ධයෝ මේ කිව්වහම 'භික්ෂු භික්ෂුණී' ' උපාසක උපාසිකා' සිව්වනක් පිරිසම. ඒ වගේ තමයි සම්මා දිට්ඨියෙත් ඉන්නවා, මිථ්‍යාදෘෂ්ටියෙත් ඉන්නවා. මේ ධර්මය අවබෝධ කරන කොට ආර්ය භූමියෙත් ඉන්නවා ගිහියෝ. එහෙනම් 'ඝටීකාර' අපි අහනවා ආර්ය භූමියේ නෙවෙයිද කියලා. එහෙනම් සෝවාන් සකෘදාගාමි, අනාගාමී අරිහත්වයට පත්වෙන්නත්, මේ මාර්ග සිත්, ඵල සිත්, කිරිය සිත් තියෙන්නේ. කර්ම විපාක පනවන්න බෑ සෝතාපන්න ආර්යයන් වහන්සේලාට කර්ම විපාක කොහොමද පනවන්නේ ඒ කිරිය සිත් තියෙන්නේ. කොහොමද? පනවන්නේ 'නියත සම්බෝධිපරායන' වෙන්නේ කොහොමද? එහෙනම් නිවනින්ම සැනසීම ලබන්නේ කොහොමද එහෙම නම් සිත් 89 කොහොමද ලෝකෝත්තර සිත්වලට දැම්මේ 'සෝවාන් සකෘදාගාමී, අනාගාමී, අරිහත් සිත් හතර, ඵල සිත් හතරයි ඒකට හේතුව.

මේක දකින කොට මෙතන දෙයක් නැති බවයි දකින්නේ. ඒ මාර්ග යවත් නැත්තම් සෝතාපන්න වෙන්නෙත් නෑ. දැන් වැඩේ තියෙන්නේ සෝතාපන්න ආර්යයන් වහන්සේ හඳුනා ගන්නේ නැතිකම. සෝතාපන්න ආර්යයන් වහන්සේ අඳුනන්නේ නැතුව ආර්ය භූමියේ 'අරියානං දස්සාමි' කියලා කියන්න බෑ. හිතුවා කියල සෝවාන් වෙන්නේ නෑ. මේක තමයි මේකේ තියෙන, හිමාල පර්වතය වගේ තමයි කෙලෙස් සංසිදෙන තැන. **එයා එන්න ඕනේ සියලු දෘෂ්ටීන් කුඩු කරගෙන, සම්මා දිට්ඨියට එන්න ඕනේ. එහෙනම් එයා 'දිට්ඨි විශුද්ධියට එන්න ඕනේ. කොහොමද එතනට එන්නේ. මෙතන සත්වයෙක් නැති බව දකින්න ඕනා. ආත්මයක් නැති බව දකින්න ඕනා.** ඒක දැනගෙන හරියන්නේ නෑ. ඒක අභ්‍යන්තරයට දැනෙන්නත් ඕනේ. 'සක්ඛාය දිට්ඨිය' ප්‍රහීන කරන්න ඕනා. ගොඩක් අය දැනුම තිබ්බට ආත්ම දෘෂ්ටියේ ඉන්නේ.

පෝට්ල භික්ෂුව කියන්නේ ගෝලයෝ රහත් වෙනවානේ. ඒ කියන්නේ මාර්ගය හරියට පෙන්වනවානේ. එහෙනම් දැනුම තියෙනවා. හැබැයි කෙලෙස් සංසිදෙන මග නැහැනේ. දැනුම තිබ්බට සෝවාන් වෙන්නේ නෑ කවුරුත්. මුල මැද අග හොඳින් ගලපා ගත්තොත් මේ ටික හොඳට තේරෙනවා මෙය. සෝතාපන්න වෙන එක හිතන තරම් ලේසි නෑ. අපට හම්බ වෙනවා පෘතග්ජන භූමියේ ඒ කියන්නේ ගිහි වතේ වැඩ සිටින ආර්යයන් වහන්සේලාත් ගිහිවතේ පෘතග්ජනයොත් ඉන්නවා. අද හම්බ වෙනවා පැවිදි වගේ, පෘතග්ජන භික්ෂූන් වහන්සේලා අද යුගයේ හම්බ වෙනවා. භික්ෂුව කිව්වොත් ඒ වචනේ අද දාන්න බෑ. එයා භික්ෂුව වෙන්නේ කොහොමද? ඒ වචනේ දාන්න බෑ. මේ යුගයේ අද පැවිදි වතෙත් ඉන්නවා පෘතග්ජන භික්ෂූන් වහන්සේලා ආර්ය භූමිය හඳුනනන අයයි. ඒ වගේම ගිහි වතෙත් ඉන්නවා ආර්ය භූමිය හඳුනන අය.

එහෙනම් ඇත්තටම ඕනම කෙනෙකුට තේරෙනවා භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා' සිව්වනක් පිරිසම මග ඵල ලබනවා නම්, එහෙනම් ඔය සිව්වනක් පිරිසට අමතරව කවුරු හරි ඉන්නවාද? භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා අවුරුදු හතේ වුනත් කොච්චර වයස ගියත් ප්‍රශ්නයක් නෑ නේද? දහමක් අවබෝධ වෙනවානම් ප්‍රශ්නයක් නැහැ නේද? එහෙනම් ඕනම කෙනෙකුට සිතක් තියෙනවා නම් අන්න සිතේ සත්‍ය දැක්කොත් මිදීමකුත් තියෙනවා තේරෙනවද ඔය කතාව.

**උපාසක :** එහෙමයි.

**උපාසක :** දැනට තියෙන එකම මාර්ගය බුද්ධෝත්පාද ආර්යයන් වහන්සේගේ ධර්මය තමයි.

**ආර්යයන් වහන්සේ :** බුද්ධෝත්පාද දේශනාවල නිර්මලව හේතුඵල දහම පැහැදිලි කරනවා. පුළුවන් තරම් ශුද්ධ කරලා, ශුද්ධ කරලා ශුද්ධ කරලා මේ යුගයේ අපේ මෙහෙවර ඉටු කරනවා. හැබැයි අපිට ඇත්ත ඕනේ. ලෝකෙට ඇත්ත දෙන්න ඕනේ. මේ විදර්ශනා ධුරය මේ තරම් බුද්ධෝත්පාද දේශනාවල හෙළි කරන ආකාරය දැක්කොත් ඇත්තටම ආශ්චර්යයි, අත් භූතයි. මේකට අත් දැකීම් නැතුව බැහැ. ගොඩ ඉදන් පීනන්න බෑ. අනිවාර්යයෙන්ම වතුරට පනින්න වෙනවා. සමථය වැඩුවොත් තේරෙයි සමථය තුළ ඕක හම්බ වෙන්නේ නැති බව. ඇත්තටම කිව්වොත් මේ විදර්ශනා ධූරය බුද්ධ දර්ශනයත් එක්ක තියෙන්නේ, පටිච්චසමුප්පාද ධර්මයත් එක්ක තියෙන්නේ. මේක හරි සරලව ආර්යයන් වහන්සේ ලෝකයට හෙළි කරනවා. මේ සිත හැදෙන හැටි, සිතෙන් මිදෙන මග, දුකින් මිදෙන මග, නිවන් දකින මග එයයි නිස්සරණ මග කියලා ඇත්තටම සුන්දර කතාවක් මේකේ තියෙනවා.

**උපාසක :** සුන්දරයි. ආශ්චර්යයි. ඔබ වහන්සේ ලෝක සත්ත්වයා ගොඩ දාන්නේ.

**ආර්යයන් වහන්සේ :** ආර්යයන් වහන්සේගේ ඉල්ලීම නම් ධර්මය ගන්න කියන එකයි. අපිට බුදුන් වහන්සේ හොඳටම දැනෙනවා නේද ධර්මය දකින කොට, කොයි තරම් උතුම් දහමක්ද මේ ලෝකයට දීලා තියෙන්නේ කියලා අපිට ඒක දැනෙන්නේ ධර්මය දැනෙන කොට නේද? බුදුන් වහන්සේගේ අදහස තියෙන්නේ ඔබ මේ ධර්මය දැකලා ඔබේම කෙලෙස් ස්වභාවය දැකලා, මමයා දැකලා, ඔබ ඔබේම මමයා නැති කර ගෙන, මමෙක් ඉන්නවා නම් නේ ඒ අදහසුත් එන්නේ. ඔක්කොම තුනී වෙනවා නේද? කෙනෙකුත් නෑ නේද? ඒකට තමයි එන්න ඕනා. ධර්මය තමයි දකින්න ඕනේ. ධර්මය දකිනවා නම් මෙතන කෙනෙක් පුද්ගලයෙක් ආත්මයක් නෑ. දෙයක් තියෙනවා නම් ඒ දැනෙන ගතියනෙ මේ ප්‍රායෝගික පැත්තට හරවන්නේ, ගොඩක් එතන ප්‍රායෝගික පැත්තට

හැරෙන්න එපැයි. මමයා කොහෙද ඉන්නේ, මමයා දැනෙන තැනනේ ඉන්නේ. ඉන්නවා වගේ දැනෙන තැනනේ මමයා ඉන්නේ. ඒකෙ මගේ රාග, ද්වේශ, මෝහ කෙලෙස් කියන්නේ ඒක දියවෙන්න ඕනා නේද?

**උපාසක :** එහෙමයි එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** තමන්ව හඳුනා ගන්න එපැයි ඉස්සෙල්ලාම. තමන්ගේ සිහියටනේ හසුවන්නේ. තමන් කොච්චර බලවත් වෙලාද? තමන් කොච්චර දියවෙනවද? කියන එක නේද?

**උපාසක :** මම එහෙම කිව්වට, බුද්ධං සරණං තමයි.

**ආර්යයන් වහන්සේ :** ඒක තමයි ඒක නැත්තම් අහන් ඉන්න අය කෙනෙක් විදිහට ගන්නවා නේ. ඒක තේරුමක් නෑ. ධර්මය දකින කොට පුදුම සැහැල්ලුවක් දකිනවා. ගිහි පැවිදි භේදයකින් තොර මේ නිවන් මග දකිනවා. මේ කොරෝනා වසංගතයක් ඇවිල්ලා යන කොට ලෝකේ මිනිසුන්ට තේරුණා මේක. කටවල්වලට ප්ලාස්ටරයක් ගැහුවනේ ස්වභාදහමෙන්ම, ගහලා ඔක්කොටම තේරුණා. ඒකම තමයි මේ 'මැසෙන්ජර්' එක, නැවතත් ගෞතම බුද්ධ සාසනයේ පිබිදෙන 'මැසෙන්ජර්' එක. එතනින් තමයි සත්‍ය අවධිවෙන බව මැසෙන්ජර් එකට එන්නේ. ඇයි මේ හොඳටම මිනිස්සුන්ට පෙන්නලා දුන්නානේ. සොබාදහමෙන්ම පෙන්නුවානේ. හියුමන් රේස් එකේ තේරුමක් නෑ කියලා. නැති කෙනෙක් හදාගෙන, නැති මමෙක් හදාගෙන නේද?

දැන් බලන්නකෝ බුද්ධ ධර්මය කියන්නේ මොකක්ද කියලා. බුද්ධ ස්වභාවයට අවධි වෙනවා කියන එකත් තේරෙන්නේ නෑ. ගොඩක් අයට මොකක්ද මේ බුද්ධ ස්වභාවය කියන්නේ, මොකක්ද මේ 'අනිමිත්ත ශූන්‍යත අප්‍රනිත චේතෝ විමුක්තිය' මේකේ විමුක්තිය ගැන අවබෝධයකුත් නෑ. දැන් 'ක්ෂණ සම්පත්තිය' ගැන අවබෝධයකුත් නෑ. **මේක අකාලික දහමක් වෙන්නේ කොහොමද? මේ මොහොතේ දෙයක් නැත්නම් මෙතන දෙයක් තියෙන්න එපැයි. අතීතයක් තියෙන නිසානේ අනාගතයක් තියෙන්නේ. දෙයක් තියෙන්න එපැයි පිං කරන්න හරි පවු කරන්න හරි.** මේ දෙයක් නෑ කියන කොටම පටිච්චසමුප්පාද ධර්මය තුළ දෙයක්

නැති බව මතුවෙන කොටම මොකද වෙන්නේ, දුටු දෙයක් නැත්තම් දුටු කෙනෙක් නෑ. කියන කොට මොකද වෙන්නේ කර්ම භූමිය කොහේද තියෙන්නේ එතකොට. යන්න පුළුවන්ද කර්ම භූමියට. එහෙනම් යන්න එපැයි අංගුලිමාල කර්ම භූමියට, 'හේතුඵල දහම' දැනගන්න කොට 'කර්ම භූමිය' ඉවර වෙනවා. මේ හේතුඵල දහම ඒකයි දහම් පාසල් පොතේ නෑ කිව්වේ. දහම් පාසලේ කර්ම භූමිය උගන්වනවා තියාගෙන. 'ධර්මය' උගන්වන්න ඕනි හේතුඵල දහම.

බලන්න අස්සජි මහ රහතන් වහන්සේ බුදුන් වහන්සේ හඳුන්වා දෙන හැටි. අර සැරියුත් හිමියන්, ගිහිකල 'උපතිස්ස' මුගලන් හිමියන් 'කෝලිතනේ.' කොහොමද 'අස්සජී' මහරහතන් වහන්සේ හඳුන්වා දෙන්නේ 'උපතිස්ස' බ්‍රාහ්මණයාට, මම වැඩිය දන්නේ නෑ තථාගතයන් වහන්සේ නම් මේක දන්නවා. මේ සත්‍ය ධර්මය දන්නවා කියලනේ කියන්නේ, එතනදි කියනවානේ 'යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතු තථාගතෝ' ඒ තථාගතයන් වහන්සේ දේශනා කරන්නේ හේතුඵල දහම කියලා. අද මෙතන හුස්ම ගියත්, තව අවුරුදු 10කින් හුස්ම ගියත්, ඒ මොහොතේ එක සිතයි නේද තියෙන්නේ. දැන් මේ මොහොතේ හුස්ම ගියොත් දැන් මේ සිතනේ, හුස්ම යන සිත නේද? ඒ සිතම නේද? එක සිතයි නේද තියෙන්නේ. හැම මොහොතෙම තියෙන්නේ එක සිතයි.

ඒකයි කිව්වේ අඹ ගහේ කොළ පන්දාහක් තිබුනට එක අඹ කොළේක නාරටි වින්‍යාසය දැක්කොත්, අඹ ගහෙ කොල පන්දාහම දැක්කා වගේ. අපිට කොච්චර සිතුවිලි ආවත් එක සිතුවිල්ලක් අපි හරියට මේ අවබෝධ කරලා මේ නිවන් දකින එකක් තියෙන්නේ තේරුණාද මේ කතාව.

**උපාසක :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** ඒකයි අර මාරයා අහන ප්‍රශ්නේ ඔබට දුකද මහණ, මොනවා නැති වුනාටද මාරය. නැතිවුනා නම් නැති වුනේ ඉන්නවා කියලා හිතපු සිතුවිල්ල විතරයි. දැන් කවුරු හරි ඉන්නවද? ඔබ තුමා කියලා කෙනෙක් ඉන්නවා ද? ආර්යයන් වහන්සේ කියලා කෙනෙක් ඉන්නවාද? මරුන්, බඹුන්, දෙවියන් සහිත අශ්‍රැතවත් පෘතග්ජන මිත්‍යා දෘෂ්ටික

උම්මත්තක භූමියෙන් මම මිදුන්නැත්තම්, මහණෙනි සම්මා සම්බුද්ධ යයි නොකියමි. ඔන්න ඔය නිසයි 'සම්බෝධි සූත්‍රයට' ගියහම 'බුද්ධ' කියලා කියන්නේ කවුද? මේ මිථ්‍යා දෘෂ්ටික භූමියේ, මිත්‍යා දෘෂ්ටියෙන් මිදුනා මේ ධර්මය තුළ මනා කොට පේනවා. **'ක්‍ෂණ සම්පත්තිය' මතයි මේ සියල්ලම තියෙන්නේ. මේ ක්‍ෂණයේ මේ මොහොතේ මේ අරමුණ දෙයක් කියල ගත්තොත්, දෙයක් කියල දැනුනොත් එතනම තමයි ඒ දැනෙන දැනීමමයි දෙයක් තියෙනවා නම් 'ඒතං මම' මම ඉන්නවා ඒකත් තියෙනවා.** 'ඒතෝ හමස්මිං'-'එමේසෝ අත්ථා' 'මම' 'මගේ' 'මගේ ආත්මය' කියන්න දෙයක් තියෙනවා. හැබැයි දෙයක් නැත්නම් මාත් නෑ.

එහෙනම් බලන්න ඕනා මේ එක අරමුණක් ඉස්සෙල්ලා හරියට. ඒකයි කිව්වේ ධර්මය දකිනවා කියලා. ධර්මය දකිනවා කියන්නේ, ධර්මය කියන්නේ මේ අරමුණ. අරමුණමයි සිත කියන්නේ. ඒකමයි ආත්මය කියන්නේ. එහෙනම් එක අරමුණක් ධර්මය දකින්න ඕනා. එක සිතයි දකින්න තියෙන්නේ, සිත හරියට දකින්න ඕනා කොහොමද හැදෙන්නේ. අන්න අර පර්යාය ආර්යයන් වහන්සේ පැහැදිලි කරනවා. කම්පන වේගෙට මැවෙන ආලෝකයක්, කම්පන වේගෙට මැවෙන ශබ්දයක්, කම්පන වේගෙට මැවෙන ගන්ධයක්, රසක්, පහසක්, උණුසුමක්, සීතලක් 'රුප්පංති කෝ ආවුසෝ රූපං' ශබ්ද රූප, වර්ණ රූප, ගන්ධ රූප, රස රූප, පොට්ඨබ්භ රූප, රූප කියන්නේ 'රුප්පනයට' මැවෙන නිසයි. අන්න 'කොන්ටම්' තියරි එක වගේ ශබ්ද තරංග වර්ණ තරංග එකතු වෙලා හැදෙන චිත්ත තරංග.

ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස සේරම මේ මොහොතේ තත්පරයට කෝටි වාරයක, අපි කියනවා චිත්තක්ෂණයක්. එක සිතක් පහළ වෙන කොට තත්පරයට, කෝටි වාරයක් චිත්තක්‍ෂණ කෝටි වාරයක් තියෙනවා කියනවා එක සිතක් පහළ වෙන කොට. අභිධර්මය උගන්වන කොට ඔය වචන ටික තියෙනවා. ගලපා ගෙනයි නැත්තේ. ඒ කියන්නේ තත්පරේට කෝටි වාරයක වේගයෙන් 'ස්පාක්' වුනොත් මොකද වෙන්නේ, අන්න ආලෝකයක් මැවෙනවා. මැවෙන එකක් කොහේවත් තියෙනවා නෙමෙයි. ඔබේ ඇස් ගුලිය ගැලෙව්වොත්, ඒකයි කිව්වේ අන්ධකාරයි කියලා. **ඇහැට මැවෙන වර්ණ ටික කොහේවත් තියෙනවා නෙවෙයි. අපි බාහිර**

**ඇත්තක් කරගෙන එළියේ තියෙන ආලෝකය එනවා කියල, ඒකෙන් තමයි එතනමයි නිවන වැසුණු තැන. පොකුණට එබුනු නිසා පොකුණේ බල්ලෙක් පේනවා කියන අන්න ඒ උපමාවෙන්, හොඳට මෙතන මේ මොහොතේ සිතන නිසා පේන ලෝකයක්, සකස් වෙන ලෝකයක්. කොහේවත් තියෙන එකක් පේනවා නෙවෙයි, ඇහැට මැවෙන ලෝකය කොහේවත් තියෙනවා නෙවෙයි කිව්වේ ඔන්න ඕක නිසයි.** එන්න ඔතනින් හරියට ගලපා ගත්තොත් බාහිර තියෙන දෙයක් කවදාවත් දැකලත් නෑ මුකුත් වෙලා නෑ මේ සේරම විඤ්ඤාණ මායාවට මැවෙන එකක් කියන එක. අන්න එදාට එයා නිවන් දකිනවා.

**පවතින හිතකුත් නෑ, මේ මොහොතේ මේ ක්‍ෂණයේ ඇතිවෙලා නැති වෙන එක දකින්න ඕනා. මේ මොහොතේ ඇතිවෙන එක හරියට දැක්කෙත් එතන දෙයක් නැති බව දකින එකයි නැති වෙනවා කියන්නේ.** එහෙම නැතුව මේ පැත්ත එහෙම නැතුව මේ පැත්ත බලන කොට බිත්තිය පේනවා. මේ පැත්ත බලනකොට පුටුව පේනවා. ආයි මේ පැත්ත බලන කොට බිත්තිය තියෙනවා. උපාදාන වෙනවා නැති වෙන්නෑ. ආයෙ හෙටත් එන කොට ඒ බිත්තිය තියෙනවා. මේකේ නැති වෙන්නේ මේ අරමුණ බිත්තිය පේන කොටම බිත්තිය කියලා දෙයක් නැති බව දැක්කොත් විතරයි. අන්න 'සමුදය ඥනං' කියන තැන 'සමුදය ඥානං' කියන්නේ හැදෙන එක දකින හැටි. එහෙම දැක්කොත් විතරයි 'අත්තගමය' තියෙන්නේ. ඒකට කියනවා 'උදය වැය ඥානය' කියලා. උදය වැය ඥානය කියන්නේ මේ මොහොතේ මේ අරමුණේ දෙයක් නැත බව දකින එකයි. නැතුව ඇතිවෙලා නැති වෙන එක නෙවෙයි ඕක නෙමෙයි ධර්මය. ධර්මය කියන්නේ හැදෙන හැටි දෙයක් කොහොම ද මැවෙන්නේ කියලා දැක්කොත් අන්න එතන දෙයක් නැති බව සිතක් නැති බව දැක්කොත් විතරයි 'අත්තගමය' කියන එක තියෙන්නේ අරමුණෙන් මිදීම. සත්‍ය දැකලා මිදීමයි මේක අසුවෙන්නේ සිහියට. 'යෝනිසෝ මනසිකාරය' 'යථා භූත ඥානය' කිව්වේ ඒකයි.

මේ මොහොතේ මේ ක්‍ෂණයේ දෙයක් කියලා ගත්තොත් තමයි උපත. මහණෙනි ඇසේ උපතයි උපත කිව්වේ ඒකයි. බිත්තිය කියලා ගත්තොත් බිත්තිය කියලා දැනෙනවා නම්, බිත්තිය තියෙනවා නම්,

බිත්තිය තියෙනවා කියන්නේ ඒ මොහොතේ ඉපදීමක්. අන්න ඉපදුනා අන්න ඔබතුමා ඉපදුනා. අන්න භවය එතනමයි. 'අජ්ජෝසාය තිට්ඨති - යාරූපේ නන්දී' තදුපාදානං භවෝ' ඕකයි 'භව පච්චයා ජාති' එහෙනම් ජාතියත් එතනමයි. ඉපදිලා තියෙන්නේ ජරා, මරණ, ශෝක පරිදේව තියෙනවා. ඒ රැවටෙන කෙනාට ඉපදුනොත් අන්න මරණයක් තියෙනවා. මේ මොහොතේමයි ඉපදෙන්නේ මේ මොහොතේමයි මිය යන්නේ, අන්න අකාලික දහම හම්බ වෙනවා. 'ක්ෂණ සම්පත්තිය' දකිනවා. එහෙනම් මේ මෙහොතේමයි භවය සැකසෙන්නේ, දෙයක් කියලා ගත්ත එකමයි භවය කියන්නෙ මේ මොහොතේ උපත මරණය දෙක ජය ගත්තා කියන්නේ ඔන්න ඕකයි, ධර්මය දැක්කා කියන එක.

**මේ මොහොතෙත් කෙනෙක් නෑ. දෙයක් නැත්නම් ඉපදුනේ කවුද? මැරුණේ කවුද? අන්න එතන දකිනවා 'ක්ෂණ සම්පත්තිය' අන්න 'බුද්ධ ස්වභාවයට' අවධිවෙනවා.** දැන් මෙන්න මේ අවබෝධය හොඳින් ප්‍රකට වෙන්න ඕනි. **මේ අවබෝධය ඇතිව එන එන අරමුණ මේ විදිහට මෙනෙහි වෙන්න ගත්තොත් අන්න එතන මාර්ගයට පිළිපන්න යෝගාවචරයෙක් ඉන්නවා.** අන්න එයා 'උපාදානස්කන්ධයෙන් මිදෙන, 'ශීලය' රකිනවා. 'ආර්යකාන්ත ශීලය' රකිනවා. අන්න රාග, ද්වේශ, මෝහ කෙලෙස් සංසිදෙන මාර්ගයට ප්‍රවේශ වෙනවා. අන්න දෙයක් නැති බව දකින තැන, ඇලෙන ගැටෙන ස්වභාවයක් නැති. දෙයක් තිබ්බොත් ඇලෙනවා, ගැටෙනවා, **දෙයක් නැත්නම් ඇලෙන ගැටෙන දෙයක් නෑ. අන්න සමුදය දකිනවා. හැදෙන හැටි 'අත්තගමය' අන්න එතන අතෑරෙනවා. අන්න 'ආශ්වාදයක්' දකිනවා, එතන ලබන්න ආශ්වාදයක් දෙයක් නෑ. 'ආදීනවය' දකිනවා, අන්න 'නිස්සරණයට' යනවා. අන්න 'ආශ්වාද' ආදීනව කෙලෙස් ක්ෂය වෙන එකයි 'භික්ඛු' කියලා කිව්වේ** අන්න භික්‍ෂුවක්. අද ඉන්නේ පෘතග්ජන ගිහියෝ.

ගිහි අතරේ ඉන්නවා අද ගිහිවතේ වැඩ සිටින ආර්යයන් වහන්සේලා, ඒ වගේම පැවිදි වතෙත් ඉන්නවා අද ආර්යයන් වහන්සේලා. ඒ වගේම අද පැවිදි වතෙත් පෘතග්ජන භික්ෂූන් ඉන්නවා. එහෙම තමයි මේක, විග්‍රහ කරන්න වෙන ක්‍රමයක් නැහැ. ඇත්තටම භික්ෂුව කියන තැන, පෘතග ්ජන ස්වභාවයක් දාගන්න බෑ. මොකද ඒ 'භික්ෂුව' කියන්නේ ආශ්‍රව කෙලෙස් 'ක්ෂය' වෙන්නේ 'සත්‍ය' දකින කෙනාට. නමුත් අද සම්මුතිය

තුළ පැවිද්ද ඇත්තට ම විශාල පිරිහීමක් පෙන්වනවා. හැබැයි මේක මුල මැද අග හොඳින් ගලපා බැලුවොත් මේ මාර්ගයේ යන යෝගාවචරයාට අවසානයේ දී මේ සිවුරු දරාගන්න තරමට දියුණුවට පත්වෙනවා. මොකද 'සිව්පසය' නැතුව ඇත්තටම යැපෙන්න බැහැ, එතෙන්ට එන්නේ. අපි කිව්වා ගිහිවතේ යුතුකම් තියෙනවා නම් 'ඝටීකාර' වගේ ආර්ය භූමියට ප්‍රවේශ වුනොත්, ආර්ය භූමිය තුළ යුතුකම් ඉෂ්ට වෙනවාමයි අන්ධ දෙමාපියන් බලා ගත්තා වගේ. මොකද මෙතන අති නිර්මලයි අති පාරිශුද්ධයි. ඒ යුතුකම්වලින් අවසාන වීමෙන්. අන්න එතකොට ඒ ආර්ය භූමිය අනාගාමී, අරහත්වය කරා යන අවසාන කොටස සිද්ධ වෙනවා.

ඇත්තටම කිව්වොත් අනාගාමී කියන්නේ නැවත උප්පත්තියක් නෑ ඒකයි ශුද්ධාවාස පෙන්වන්නේ 'ශුද්ධාවාස' ඔය බ්‍රහ්ම ලෝක දිව්‍ය ලෝක එළියේ හොයන අයට කවදාවත් හම්බ වෙන්නේ නෑ. ඒකත් මේ සිතේම සකස් වෙනවා. **මේ අරමුණේම මේ මොහොතේ ඔබට දෙයක් නැති බව දැනෙන කොට ඔය තුන් භූමියම ජයගෙන තමයි ඔබ අර ආර්ය භූමියට ප්‍රවේශ වෙන්නේ, කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය තුන් භූමියම ජය ගෙන බුදුන් වහන්සේ ත්‍රෛලෝක නාථ' සම්මා සම්බුද්ධත්වයට පත් වුනා කියන විදිහමයි** මේ අරමුණේ මේ කතාව තියෙන්නේ. අරමුණ බිත්තියද, පුටුවද, මේසෙද, අම්මාද, තාත්තාද, ඉර ද, හඳ ද ඕනම එකක්. ඒක දෙයක් වුනොත් එතන වටිනා කමක් තියෙනවා, ඒ 'කාම භූමිය.' ඒකේ තියෙන රූප සංඥාව 'රූප භූමිය.' ඒකේ දෙයක් වගේ දැනෙන 'ආත්ම සංඥාව' අරූප සංඥාව. දෙයක් වගේ දැනෙන ගතිය ඒක අරූප භූමිය'

මේ කම්පනයට මැවෙන අරමුණ ගැනයි කතා කරන්නේ. කොහෙවත් තියෙන දෙයක් නෙවෙයි. තිස් එක්ලෝක ධාතුවම තියෙන්නේ, කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය කියන තුන් භූමිය තියෙන්නේ මේ අරමුණේ, මේ සිතේ. ඒක දකින එක ලේසි නෑ. මේ ධර්මය හොඳින් අහගෙන ගියොත් ඒකත් දකින්න ලැබෙයි. සංඛාර උප්පත්ති සූත්‍ර පැහැදිලි කරන කොට තිස් එක් ලෝක ධාතුවම සිත තුළින් දකින හැටි පැහැදිලි කරා. තෙරුවන් සරණයි.

# 02

# 'මම' 'මගේ' 'මගේ ආත්මය' හැදෙන හැටි

**ආර්යයන් වහන්ස**: සිත කියන්නෙ මොකක්ද? අරමුණ නේ. සිත කියන්නෙ අරමුණ. බිත්තිය දකිනව නම් බිත්තිය දකින සිත. සද්දයක් ඇහුනත් ඒ සද්දය ඇසුන සිත. ගන්ධයක් දැනුනත් ඒ ගන්ධ සිතක්. රස සිතක්, උණුසුම, සීතල තද ගතිය ඒ සේරම සිතක් අරමුණු. අරමුණයි සිත කියන්නෙ මනෝද්වාරයෙන් ආවත් ඒක, ආයතන හයෙන්ම අරමුණු ඇති වෙනව. ඒ අරමුණු තමයි සිත කියන්නෙ. **මේ වෙලාවෙ සක්මන් කරනව නම් පොළවට කකුල තියනකොටම කොතනද අරමුණ තියෙන්නෙ, ඒ අරමුණ තමයි සිත කියන්නෙ. සිතුවිල්ලක් පහළ වෙනව. අරමුණමයි සිත කියන්නෙ.** අරමුණු ආයතන 6න්ම පහළ වෙනව මේක එච්චර පටලවා ගන්න යන්න එපා. ඔය අරමුණු තමයි දකින්නෙ සකස් වන ආකාරය. එක අරමුණක් කොහොමද සකස් වන්නෙ කියන එක තමයි මේකෙ 'චුතුපපාත ඥාණය' කියන්නෙ. ත්‍රිවිද්‍යා කියන්නෙ නිවන් මඟ, ඉන් එහා නිවන් මගක් කොහේවත් නෑ. මුලු නිවන් මගම තියෙන්නෙ ත්‍රිවිද්‍යා විතරයි. හරිම ලේසියි.

ත්‍රිවිද්‍යා කියන්නෙ අරමුණු. මේ මුලු ධර්මයම තියෙන්නෙ අරමුණක් ගැන. මේ අරමුණ දෙයක් වෙනවද නැද්ද කියන තැන තමයි මුලු ධර්මයම තියෙන්නෙ. එතකොට බුද්ධ දර්ශනය හරි පිරිසිදුවට දකින්න පුළුවන්. පොඩ්ඩක්වත් පටලැවෙන්නෙ නෑ. හරිම සරලයි. ඉස්සෙල්ලාම යායුතු මාවත ලිපිනය පිරිසිදු වන්න ඕන. බුද්ධ දර්ශනය කියන්නේ 'සත්‍ය ඥානය' කියන එක. අපි සත්‍ය දන්නෙ නෑ. මේ ලෝකේ සත්‍ය දකින අයයි නොදත් අයයි කියල කොටස් 2ක් ඉන්නවා. මොකක්ද මෙතන වෙන්නෙ. හැම

කෙනෙකුටම හිතෙන්නෙ එයා ඉන්නව කියල. කොහෙන්ද ආවෙ, කවුද ඉන්නෙ, මැරුනම කොහේද යන්නෙ ඔය වගේ ප්‍රශ්න ටිකක් තියෙනවනේ හැමෝම ළඟ. ඇය ඉපදුනේ ඇය ජීවත් වන්නෙ, ඇය මැරෙන්නෙ සිතට ආගමක් ආදාළ නෑ, හැමෝටම තියෙනවනේ. අන්ධයෙක් වගේ ඉපදිල, අන්ධයෙක් වගේ ජීවත් වෙලා, අන්ධයෙක් වගේ මැරිල යනව. කවුද ඒ ? සත්‍ය දන්නෙ නැති කෙනා. ඇත්තටම මොකක්ද වෙන්නෙ කියල දන්නෙ නෑ. ඇත්ත දන්නෙ නැති කෙනා කියන්නෙ, මිථ්‍යා දෘෂ්ටිකයා කියන්නෙ එයාට තමයි. ඇත්ත දන්නෙ නෑ. ඒක තමයි ෆියුචර් එක.

ආගම සේරම බිඳ වැටෙනව නේ. ආගම්වලට වැඩි කල් ආයුෂ නෑ. ආගම් කියන්නෙ බොරුවක් සිතට ආගමත් බොරුවක්. ඒක මේ මිනිස්සු හිත හදාගන්න ගත්ත පොඩි මායාවක් විතරයි. ආගමක කවදාවත් ඇත්තක් නෑ. දෙවියෝ ලෝකය මැවීම කියන පට්ටපල් බොරුව වැඩිකල් පවතින්නේ නෑ. ඒක තමයි ලෝකයේ තියෙන ලොකුම බොරුව. ඒක බුදුසමයෙන් එහෙමයි. අදත් එහෙමයි. ලෝකයේ තියෙන ලොකුම බොරුව මොකක්ද කියල කවුරු හරි ඇහුවොත් ඕක තමයි මනුෂ්‍ය වර්ගයා රැවටිලා ඉන්න තැන. මනුෂ්‍ය වර්ගය සතුන්ටත් වැඩිය ලොකු මිථ්‍යා දෘෂ්ටියේ නෑ. මිථ්‍යා දෘෂ්ටියක ඉන්නවා සත්තු ඒ මනුස්සයා ඉන්න මිත්‍යා දෘෂ්ටිය තමයි දෙවියෝ ලෝකය මැව්වා කියන එක. සියලු ආගම් බිඳ වැටෙනව කිව්වෙ, ඔන්න ඔය බොරුව බිඳ වැටෙනව. මිනිසුන්ට තේරෙනව ඕක බොරුවක් කියල. මේ ආගම කියන්නෙ බොරුවක් කියල. එතකොට ලෝකයේ ඇත්ත මොකක්ද?

සත්‍යය සොයන කොටසක් ඉන්නව. ඒක බුදුසමයෙත් එහෙමයි. අදත් එහෙමයි. මීට අවුරුදු දශක ගණනකට කලිනුත් එහෙමයි. කම්කිසි ඥානවන්ත පිරිසකට කොයි යුගයෙත් මේ ඇත්ත මොකක්ද කියන එක සොයන්න හිතෙනව. ඒක සාමාන්‍ය ස්වභාවය. ලෝකයේ ඇත්ත මොක්කද? අනාගතයේ මොකක්ද සිදුවන්නේ තව අවුරුදු 100ක් 200ක් යන කොට බලන්න පුළුවන්. ඔතනට තමයි ලෝකය කැරකෙන්නෙ. මනුෂ්‍ය වර්ගයාගේ ඊළඟ ස්ටෙප් එක ඕක. ඒ නිසාම තමයි ආර්යයන් වහන්සේගේ දේශනා විශාල ප්‍රමාණයක් දාන්නේ 'සත්‍ය ධර්මය' අවදි විය කියලා. බුදුන් වහන්සේ සෙව්වා සත්‍ය මොකක්ද කියල. ඒ යුගයේ සිටියා සත්‍ය ගවේෂණය කරන අය. අදත් ඉන්නව. ලෝකයේ ඇත්ත මොකක්ද? 'බුද්ධ දර්ශනයයි සත්‍ය ධර්මය නිවීම.

'සත්‍ය ඥානය' ඇතිහුටයි 'කෘත්‍ය ඥානය'. කෘත්‍ය ඥානය ඇතිහුටයි 'කෘත ඥානය. සත්‍ය, කෘත්‍ය කෘත 'තිපරිවට්ටං ද්වාදසාකාරං' කියලා. බුදුන් වහන්සේ බුද්ධත්වයට පත් වෙන කොට මුලින් කල ධර්ම දේශනාවේ 'දම්සක් පැවතුම් සූත්‍රය' අපට හමුවෙනව 'ඒකායන මග්ගො අයං භික්ඛවේ', එතන තමයි මාර්ගය තියෙන්නෙ සත්‍ය කෘත්‍ය කෘත. සත්‍ය ඥානය ඇතිහුටයි කෘත්‍ය ඥානය, කෘත්‍ය ඥානය ඇතිහුටයි කෘත ඥානය. ඕක තමයි 'විෂන්' එක යා යුතු මාවත ලිපිනය. ඕක තව විදියකින් බැලුවොත් එතනින් තව අඩියක් ආවොත් ඔය 'සත්‍ය ඥානය' කියන්නේ, සත්‍යය මොකක්ද? ලෝකය මැවෙන්නෙ සිතේ. ඕකයි සත්‍යය.

අප මරණයක් ගැන කතා කරනව. මැරෙන්නෙ සිතද කයද? සිත නැති නිසයි කය වලලන්නෙ. ආශ්වාස ප්‍රශ්වාස වැටෙනකම් 'සෙන්සස්' ටික මෙතන 'ස්පාක්' වෙනකොට චිත්ත ස්වභාවයක් සකස් වෙනව 'සෙන්සස්' 6ට අරමුණු 6 ආකාරයකට සකස් වෙනව, ඒ කියන්නෙ සිතුවිලි. ආශ්වාස ප්‍රශ්වාස නවතිනවා කියන්නේ, සිතිවිලි නවතිනව සිතයි නවතින්නේ. ඒ කියන්නෙ සිතයි මැරෙන්නෙ. කයෙන් වැඩක් නෑ ගිනි තියල දානව. අවුරුදු 5ත් සිතුවිලි නැවතුනත් එකයි අවුරුදු 10න් නැවතුනත්, 20ත් නැවතුනත් කයෙන් වැඩක් නෑ. අශ්වාස ප්‍රාශ්වාස නැවතුන ගමන් කය ගිනි කියල දානව. එතකොට සිතක් නෑ 'ස්පාක්' එක නවත්තන්ට, අපි දන්නවා ලෝකය මැවෙන්නෙ එහෙනම් මේ සිතේ. ඉපදීම මරණය කියන එක තියෙන්නෙ සිතේ, කයේ නෙවෙයි. ඉපදුනේ සිතමයි, ඉපදුනොත් මැරෙන්නෙත් සිතමයි. සිතුවිල්ලක් තමයි ඉපදිලා තියෙන්නෙ. ආත්මය කියන්නෙත් මේ සිතටයි. සිත කියන්නෙ මොකක්ද කියල බැලුවම සිත කියන්නෙ අරමුණ.

මේ මොහොතෙ බිත්තිය දකිනව. බිත්තිය දකින මමත් ඉන්නව අරමුණමයි ආත්මය කියන්නෙ. ඒකමයි සිත කියන්නෙ. **ඔය අරමුණ හඳුනන්නෙ කොහොමද කියල බලන එක තමයි 'ත්‍රිවිද්‍යා' කියල කියන්නෙ. ඕක නොදන්නකම අවිද්‍යාව. මේ අරමුණේ සත්‍ය දකින එකයි සත්‍ය ඥානය කියන්නෙ. 'බුද්ධ දර්ශනය' කියන්නෙ එහෙනම් සත්‍ය කියන්නෙ.** ලෝකය මැවෙන්නෙ සිතේ, තියෙන එකමයි එන්නෙ 'චිත්තෙන නීයති ලෝකෝ චිත්තේන පරිකස්සති' සිතක මැවෙන ලෝකය. ලෝකය කියන්නෙ, අප ජීවත්වන්නෙ සිතිවිලිවල. අපියි කියන්නෙ අඹ ගහ කියල.

අඹගහ කියන්නෙ නෑ අඹ ගහ කියල, එහෙනම් ඒක සිතුවිල්ලක්. හරිම සරලයි, හරිම කෙටියි. දැන් තියෙන්නෙ අරමුණ දකින්න විතරයි. ලෝකය කියන්නෙ සිතුවිලි ලෝකයක්. සිත හැදෙන හැටියි බලන්න ඕන.

සිත හැදෙන හැටි බලන්ට කියන්නෙ මේ අරමුණ කොහොමද සකස් වන්නෙ කියල බලන එක. ආත්මය කියන්නෙත් ඒකමයි. ඉපදීම කියන්නෙත් ඒකමයි. මරණය තියෙන්නෙත් එතනමයි, සිතුවිල්ල ඉපදෙන්නෙ, සිතුවිල්ලයි මිය යන්නෙ. සිතුවිලි කියල කියන කොට, ඒක එන හැම අරමුණක්ම සිතිවිලි බවට පත් වෙනවා. ඒකට තමයි සිතුවිල්ල කියන්නෙ. එක සිතක් දැක්කොත් එහෙම, හැම සිතක්ම ඒ ආකාරයට එන්නේ කියන එක අපට හසුවෙනවා. අඹගහේ කොල 5000ක් තිබුනට එක අඹ කොලයක නාරටි වින්‍යාසය දැක්කොත් අඹ ගහේ කොළ 5000 ම දැක්කා වෙනව. එක සිතක් දකින එකයි දැන් මෙතන 'ක්‍ෂණ සම්පත්තිය' කියන්නෙ. දැන් මේ මොහොතෙ සිතක් පහළ වෙනවා අරමුණක් බිත්තිය දකින සිත, ඔන්න එක සිතක් දකිනව. බිත්තිය කොහෙන්ද ආවෙ? දැන් මේ අරමුනේ කොහේද බිත්තිය. සිතක් අපි දකින්නෙ කොහොමද මේ සිත හැදෙන්නෙ කියල.

මේ මොහොතෙ බිත්තිය කියල එන්න විදියක් නැහැනේ. **එහෙනම් මේ බිත්තිය ඇල්ලුවොත් තද ගතියක් තියෙන්නෙ. බිත්තිය ඉඹල බැලුවොත් සුවඳක් තියෙනව. බිත්තිය ලෙව කාල බැලුවොත් රසක් තියෙනව. ඇසට බිත්තිය වර්ණයක් තියෙනව කණට බිත්තිය කියල සද්දයක් ඇහෙනවා.** ඇත්තටම බිත්තිය කියන්නෙ මොකක්ද? මේ බිත්තිය, මේ අරමුන කොහොමද දෙයක් වන්නෙ? **මේ මොහොතෙ මේ සිත අරමුන බිත්තිය කොහෙන්ද ආවෙ. අන්න බිත්තිය එන හැටියි බලන්න ඕන. බිත්තිය හැදිච්ච හැටියි බලන්න ඕන. අරමුණ හැදුන හැටියි බලන්න ඕන. මේ අරමුණ තමයි ලෝකය කියන්නෙ**, බිත්තිය ඉර හඳ ගහ කොළ සේරම ලෝකයක්. ඔක්කොම තියෙනව කියන්නෙ ලෝකෙ තියෙනව, ලෝකය තියෙනව කියන්නෙ මාත් ඉන්නව. හැබැයි දැන් 'ලෝක විදූ' ලෝකෙම ජයගත්තා වෙනවා මේක අවබෝධ කරන්න. ලෝකෙම මේ අරමුණමයි, අපි මේ ලෝකෙම අවබෝධ කරා වෙනව, සත්‍ය අවබෝධ කලා වෙනව. මේ ධර්මය අවබෝධ කිරීමෙන් බිත්තිය හැදෙන හැටි දැකීමෙන්, එහෙනම් හැම සිතක්ම හැදෙන්නෙ ඒ විදියටයි. එක සිතක් දකින එක. බිත්තිය

කොහෙන්ද ආවෙ. බිත්තිය මේ මොහොතෙ තියෙනව නම් මීට කලිනුත් බිත්තිය අපි දන්නව නේ. එහෙනම් **බිත්තිය ආපස්සට ගිහින් බලනව කවද්ද බිත්තිය පටන් ගත්තෙ කියල. මොකද ඉපදෙනකොට පුංචි දරුව මව් කුසෙන් එළියට එන දරුවට බිත්ති තිබුනෙ නෑ. ඔය බිත්තිය කොහෙන්ද පටන් ගන්නෙ කියල බලන්න.** අන්න පොඩි දරුවගෙ ඉඳන් ආපස්සට බලන කොට පේනව පුංචි කාලෙ තිබුනෙ නෑ, **මොන්ටිසෝරි යන කොට පින්තූර කොලයක් ඇහැට දෙනව වර්ණයක්, දෙනව කණට ශබ්දයක් දෙනව. අල්ලල බැලුවොත් උණුසුම සීතල තද ගතිය ඔක්කොම තියෙනව.** අන්න බිත්තිය හැදෙන හැටි. අන්න අරමුනේ බිත්තිය හැදෙන හැටි. එනව තව තැනකට, පෙරසිත් කඳ පිළිවෙල දකිනව කොතනද පටන් ගත්තෙ කියල. 'පුබ්බේනිවාසානුස්සති ඥානය' දැන් හරි පෙරසිත කඳ පිළවෙල දකිනවා.

එහෙනම් 'චුතූපපාත ඥානය' මේ මොහොතේ සිත සත්‍ය දකින එක. සත්‍ය දකිනව කියන්නෙ බිත්තිය කියල එකක් කොහෙන්ද ආවේ කියල, බිත්තිය හැදෙන හැටියි දකින්නෙ. 'චුතූපපාත ඥානයට' එන්න නම් පෙරසිත් කද පිළිවෙල දකින්න වෙනව. **'පුබ්බේනිවාසානුස්සති ඥානය' තියේ නම් අන්න එතකොට අපට පේනව ඇහැට කොහොමද වර්ණ මැවෙන්නෙ. ආයේ මේ එක එක ලිහා ගන්නවා.** දැන් මොන්ටිසෝරි යනකොට 'ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහස' එකට ආවෙ, ඒක දෙයක් වගේ දැනුන එක. බිත්තිය දෙයක් වුන හැටි, අරමුණ දෙයක් වුන හැටි, ඒක දැන් අරමුණ ඇතුලේ තියෙනව ශබ්ද වර්ණ ගන්ධ රස පහස කියල ආයතන 6ක්. දැන් බලන්න 'සෙන්සස්' එක කොහොමද **හැදෙන්නෙ කියල එක අයතනයක් බලන්න ඇස කියන ආයතනය, එතකොට පේනව 'ස්පාක්' වෙන වේගෙට ආලෝකය මැවෙනව කියන එක. තත්පරයට කෝටි වරයක් විදුලි කොටනව නම් ලෝකයක් තියෙනව. ඕක තමයි ඇස කියන්නෙ. ආලෝකය කොහේවත් එළියෙ තියෙන කථාවක් නෙවෙයි. ඒක ඇසට මැවෙන්නෙ** .

ඇස හටගන්න දහමක්. තියෙන එකකුත් නෙවෙයි. 'ස්පාර්ක්' වෙන වේගෙට දෙයක් වගේ දැනෙන එක. ඇහැ ගැලෙව්වොත් එයාට වර්ණ ලෝකයක් නැහැ. එහෙනම් ඇහැට වැටෙන ලෝකය, එළියෙ තියෙනව නෙමෙයි, ඒ 'ස්පාර්ක්' වෙන වේගෙට 'චක්ඛු ප්‍රසාදය' කියන්නෙ මැවෙන

මැවීමක් 'රුප්පන්තිකෝ ආයුසෝ රූපං' කියපු තැනට එනව. රූපය කියන්නෙ අපි කියනව ආලෝකය කියලා. වර්ණ රූපය අපි මේ කතා කරන්නෙ **'චක්ඛු ප්‍රසාදය රූපය, ඒ කියන්නෙ ආලෝකය. ඒත් තවම බිත්තිය හැඳුණෙ නැහැ, ඇසට ආලෝකයක් විතරයි. වර්ණ හැඩතලයක් විතරයි. ඒක රුප්පනය කම්පනය වෙන වේගෙට මැවෙන ආලෝක හැඩතලය. ඕකට කියනව 'ස්කන්ධය' කියල. 'රූප - වේදනා - සංඥා - සංඛාර- විඤ්ඤාන'**

**ඝට්ටනය වන වේගෙට දැනෙන දැනීම තුළ ආලෝක හැඩතලය, දැනෙන දැනීම තමයි 'වේදනා' කියල කියන්නෙ. ඒක තමයි සංඥාව නිරූපණය, ඒක දිගටම එනකොට බලගැන්විලා ආලෝකය දෙයක් බවට පත්වෙලා විඤ්ඤාණය. 'රූප' කියන්නෙ 'රුප්පනය.'** කම්පනය වන වේගෙට ස්පාර්ක් වෙන වේගෙට දැනෙන දැනීමක් එනව. 'නාමය' කියන්නෙ දැනෙන දැනීමයි. **නාමරූප පච්චයා විඤ්ඤාණ. ආලෝකය දෙයක් වෙන එකයි විඤ්ඤණය කියන්නෙ. වෙන් කර දැකීම.** දැන් මේකට එනව තවත් පැත්තක්. 'තින්නං සංගති පස්සෝ' ඒ කියන්නෙ 'දිට්ඨ, සුත, මුත' තුනම එකතුව, ඒ කියන්නෙ ආයතන 5ම එකම පාරටම දැනෙන එක 'තින්නං සංගති පස්සෝ' ස්පර්ශය.

**'ඵස්ස පච්චයා' එක මොහොතෙම මේ ආයතන, තත්පරයට කෝටි වාරයක් 'ස්පාර්ක්' එකක් මේ ආයතන පහේම සිද්ධ වෙනවා.** මනායතනය තවම හැඳුණෙ නෑ. ඇහැට වර්ණයක්. කනට ශබ්දයක්. නාසයට ගන්ධයක්. දිවට රසයක්. කයට උණුසුම සීතල ස්පාර්ක් වෙනව එක මොහොතෙ. කොහොමත් 'චිත්ත නියාමය' ස්වාභාවිකව සිද්ධ වෙනව. ඒක එක මොහොතෙ දැනෙන එක ෂොට් එකක් බවට පත්වෙනව. කවුරුහරි කෙනෙක් කියනව මේ බිත්තිය, **බිත්තිය කියන කොට බිත්තිය කියන ශබ්දයයි වර්ණයයි ගඳයි, රසයි, පහසයි, උණුසුම, සීතල තද ගතිය සියල්ල මේ මොහොතේ ස්පාර්ක් වෙනව. අන්න 'ධම්ම ස්පාර්ක්' එක. 'තින්නං සංගති පස්සෝ' කියන තුන.** මොනවද දිට්ඨ සුත, මුත, දිට්ඨ සුත ප්‍රකටයි. 'මුත' නැතුව හැබැයි නෑ තුනම එන්න ඕන.

දිට්ඨ, සුත, මුත එක මොහොතෙ දැනෙන එක 'තදපි ඵස්ස පච්චය' 'තින්නං සංගති ඵස්සෝ' කියන එක ස්පර්ශය එකට දැනෙන එක.

'ධම්ම ස්පාර්ක්' එක එනවා. 'ධම්ම ස්පාර්ක් එක කියන්නෙ දෙයක් වගේ දැනෙන එක. 'තදපි ඵස්ස පච්චයා' කියන එක, ස්පර්ශයට එනව. 'පටිඝ සම්ඵස්සයට' 'අධිවචන සම්ඵස්සය', ඒආකාර ඒලිංග ඒනිමිති ඒඋද්දේස ඇති කල්හි, ඒආකාර 'පටිඝසම්ඵස්සයට' 'අධිවචන සම්ඵස්සයක්.' **අධිවචන සම්ඵස්සය කියන්නෙ නාමය, දැනෙන ගතිය මේ තියෙන්නෙ. මොකක්ද දැන් දැනෙන්නෙ,** දැන් දැනෙන්නෙ වර්ණයක් නෙවෙයි. සද්දයක් නෙමෙයි. පහසක් නෙමෙයි. ස්පර්ශයක් **නෙවෙයි. 'ඇස, කන, දිව, නාසය, කය' මේ 'සෙන්සස්' ටික නෙවෙයි මේ කියන්නෙ. ඒ ටික සේරම එකට දැනෙන එකයි 'මනායතනය' කියන්නෙ. කම්පනය වෙන වේගෙට එකට දෙයක් වගේ දැනෙන ගතිය. අන්න ඒක 'මනෝ විඤ්ඤාණයේ' දැනගැනීම, 'ධම්ම ස්පාර්ක්' කියන එක. ඒ තමයි ස්පර්ශය කියල කිව්වෙ**.

'ඵස්ස පච්චයා' - වේදනා, තණ්හා, උපාදාන, භව, දෙයක් වගේ දැනෙන එක භව. ඒකමයි උපාදාන බලගැන්වෙන අවස්ථාව. **එකපාර ඔක්කොම දැනෙන එක තමයි උපාදාය රූපය කියන්නෙ. ඒ කියන්නෙ එතනත් ස්කන්ධයක්.** ඒ කියන්නෙ 'ධම්ම ස්පාර්ක්' එකක් වදිනව. ඒක නැවත නැවත බලගැන්වෙනව වේගෙට හසුවෙනව. එතන 'රූප වේදනා - සංඥා- සංඛාර- විඤ්ඤාණ', එතනත් තියෙනව මනෝ විඤ්ඤාණයේ දැනගැනීම. රූප කියන්නෙ එතන 'ධම්ම රූපයක්' චිත්ත රූපයක්, ඒක ඊට පස්සෙ ඔක්කොම ටික එකට වැදිච්ච එකක්. අන්න ඒක බිත්තිය බලගැන්වන අවස්ථාවක බිත්තිය හැදිච්ච හැටි. 'වේදනා සංඥා සංඛාර එතනත් තියෙනව. මනෝ විඤ්ඤාණයේ දැනගැනීම අපි ඇහෙන් දෙයක් දැක්කොත් මනෝ විඤ්ඤාණයෙන්. **කනේ දෙයක් ආවත් මනෝ විඤ්ඤාණයෙන්. නාසයෙන්ද, දිවෙන්ද, කයෙන්ද, කොතනින් ආවත් මනෝ විඤ්ඤාණයෙන් දැනගන්නෙ.**

**මනෝ විඤ්ඤාණය දැනගන්නෙ එක, ඊට පස්සෙ මනෝ විඤ්ඤාණයත් නැවත නැවත 'ස්පාර්ක්' වෙන කොට දිගටම 'ධම්ම ස්පාර්ක්' එක ඇතුළෙ උපාදාන වෙනව. ඒ කියන්නෙ ඒක දෙයක් වගේ බලගැන්වෙනවා. 'ඉත්ථ භාවයත්' එනව. තියෙනව වගේ දැනෙන ගතියක් එනව. බිත්තිය තියෙනව වගේ වෙන හැටි. ඒකට වටිනාකමක් අගයක් දෙයක් වගේ දැනෙන ගතියක්, 'කාමභූමියත්' 'රූප භූමියත්'**

**'අරූප භූමියත්' තියෙනව කියන්නෙ ඔය නිසයි.** තියෙනව වගේ දැනෙන ගතිය තමයි මේකෙ එන්නෙ. බිත්තිය තියෙනව වගේ දැනෙන එක, ඕක තමයි ආත්මය කියන්නෙ. ඕක තමයි 'භව සංඥාව' ඒකත් දෙයක් කියල දැනෙන එක. බිත්තිය දෙයක් වෙන හැටි. දෙයක් කිව්වොත් ඒකෙ ජාතියකුත් තියෙනවා. 'භව පච්චයා ජාති', බිත්තිය කියන 'ජාතිය' තියෙනව. බිත්තිය කියන 'ජාතිය' දකින මමත් ඉන්නව. ආත්මයකුත් තියෙනව.

බිත්තිය දැනෙන්නෙ කාටද? දැනෙන දැනීමක් විතරයි. නමුත් ඒකට හිමිකාරයෙක් නෑ. නමුත් චිත්ත ස්වභාවයක් සකස් වෙනව මේ මට දැනෙන්න කියල, ඕක තමයි ආත්මය සකස් වන හැටි. කොහේවත් ආත්මයක් නෑ. **දැනෙන දැනීමයි ආත්මය කියන්නෙ.** 'ඒතං මම' 'ඒතෝ හමස්මිං' 'අමේසෝ අත්ථා' 'මම' 'මගේ' 'මගේ ආත්මය' හැදෙන හැටි. හැබැයි ධර්මය දකින කෙනා ධර්මය දකිනව නම්, මෙතන බිත්තිය හටගත්ත බව අවබෝධ වෙනව. ඒකයි. 'ඒතං මම ඒතෝ හමස්මිං' ධර්මය දැක්කොත් පමණයි 'අත්තගමය' සිද්ධ වෙන්නෙ, ධර්මය දැක්කොත් පමණයි.

එතකොට මේ ශබ්ද වර්ණ එකතු වෙලා සිතක් හැදුණ කියන එක ඇත්තටම බොරුවක් වෙනව. කොහොමද ආත්මයට සිතක් පහළ වන්නෙ? ගොළුවට කොහොමද සිතක් පහළ වන්නෙ. ගොළුවට ශබ්ද නැහැනේ. අන්ධයට වර්ණ නැහැනේ. එයාලටත් සිතක් පහළ වෙනව නේ. ඒක බොරුවක් වෙනව. ඇත්ත මොකක්ද, 'ධම්ම ස්පාර්ක්' එක. 'තින්නං සංගති පස්සෝ' කියන එක. ඒකෙ උණුසුම සීතල තද ගතියක් තියෙනව. දැනීම් ටිකක් තියෙනව. හැම තිස්සෙම දෙයක් වගේ දැනෙනව නම්, ඒකෙ තියෙනව දැනීම් ටික. දැනීම් නැතිව සිතක් පහළ වන්නෙ නෑ. තේරෙන්නෙ නැති කෙනෙකුට ශබ්ද වර්ණ කිව්වට ඒක නෙවෙයි ඇත්ත. එහෙම සිතක් පහළ වන්නෙ නැහැ. **'තින්නං සංගති එස්සෝ' කියන තැන තමයි සිතක් පහළ වන්නෙ. අර දෙක ප්‍රකට වෙනව. නමුත් ඒකෙ තියෙනව දෙයක් වගේ දැනෙන ගතියට. ඒකෙ 'ත' තියෙනව නැතිවෙන්නෙ නෑ.** ඒකයි 'තින්නං සංගති එස්සෝ' කියන්නෙ. එස්සය තමයි දෙයක් තියෙන්නෙ.

'ස්කන්ධානානං පාතිභාවෝ - ආයතනානං පටිලාභෝ - අයං වුච්චති ජාති' මහණෙනි, ඇසේ උපතයි උපත කිව්වෙ; දැන් ඇසින් බලල දෙයක් කියල ගත්තොත් ආයතන කෘත්‍ය කියන්නෙ මේ ටිකයි කියපු ටික. ආයතනය හැම තිස්සෙම නිරූපණය තියෙන්නෙ මනායතනයට. ඇස කියන ආයතනය ප්‍රකට වෙන්නෙ වර්ණය වුණාට, ඒක මනායතනයයේ දැනගැනීම. මොකද ඒ දැනෙන ගතියයි ආයතන කෘත්‍ය 'ප්‍රොඩක්ට්' එක. 'ඵලය' බිත්තිය, හේතුඵල දහම. 'හේතුව' ශබ්ද වර්ණ, 'ඵලය' ආත්මය. ආත්මයක් තිබ්බොත් දුකක් තියෙනව. මේ සත්‍ය දැක්කොත් දුක නැති වෙනවා, 'අත්ථගමයට යනව අතහැරෙනව. වටිනාකම අතහැරෙනව, 'නිස්සරණයට යනව. කෙලෙස් වනය දියවෙනවා. 'පුබ්බේනිවාසානුස්සති ඥාණය' මේ සිත සකස් වෙනවා දකින්න, 'චුතූපපාත ඥානයට හේතු වෙනවා, පෙර සිත් කඳපිළිවෙල දකින්න, මේ මොහොතෙ බිත්තිය ඇත්තක් නෙමයි කියන එකයි අපට හම්බවෙන්නෙ. අන්න මිදීම, සත්‍ය දැක්කොත් තමයි මිදීම සිදුවන්නෙ. 'දුක්ඛේ ඥාණං' කියන්නෙ 'අත්තගමංච' කියන තැනට යනව. 'සමුදය' කියන්නෙ හැදෙන හැටි දකින එකයි. 'දුක 'දුකට හේතුව තේරුණා. අන්න සැනසීම ලැබෙනවා. ඒ කියන්නෙ නිවන ලැබෙන්නෙ මෙය දැක්කොත් පමණයි. මාර්ගයයි ඒ දැකීම. ඒක සිහියටයි හසුවන්නෙ. සිහියට හසුවෙලා මිදෙන ආකාරය, 'ආසවඛ්‍ය ඥානය' තමයි මාර්ගයේ තියෙන්නෙ. අන්න 'ත්‍රිවිද්‍යා' ආසවඛ්‍යය ඥානය' අපට හමුවෙනවා. 'චුතූපපාත ඥානය මේ මොහොතෙ දෙයක් නැති බව දකිනව. **'පුබ්බේනිවාසානුස්සති ඥානය' මේ සිත. අරමුණ හැදෙන හැටි දකිනව. ඒ කියන්නෙ පටිච්ච සමුප්පාද ධර්මය කියනව කියන්නෙ. සිත හැදෙන හැටි දකිනව. දෙයක් හම්බ වන්නෙ නෑ, මේ හේතුඵල දහම තුළ.**

දුටු දෙයක් නැත්නම් 'භාගිය' දුටු කෙනෙක් නෑ කියන තැනටයි එන්නෙ. ඒ සත්‍ය දකිනව කියන්නෙ දෙයක් නැති බව දකිනව.

'ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්මිං අසති ඉදං නහෝති'

ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති -ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ජති' කිව්වෙ ඕකයි. දෙයක් නැති බව දකින එකයි ඔය සමීකරණයේ තියෙන්නෙ. හරි සරලයි. ඔන්න 'බුද්ධ දර්ශනය දෙයක් තියෙන්න ඕන ආත්මයක් තියෙන්නෙ. ඒකමයි ආත්මය කියන්නෙ. **දෙයක් වගේ දැනෙනව නම්, දැනෙන කොට ඒකෙ අගයක් වටිනාකමක් තියෙන්නෙ**

**කාටද?** මම. එහෙනම් මාත් ඉන්නව. හැම මොහොතෙම අරමුණමයි ආත්මය කියන්නෙ. එහෙනම් සිතමයි ආත්මය කියන්නෙ.

එහෙනම් ඉපදුණේ සිතමයි. මියගියෙත් සිතමයි. ඉපදුණා කියන්නෙ දෙයක් කියල ගත්ත කියන එකයි. හැබැයි දෙයක් කියල ගත්තෙ නැත්නම් ඉපදීමක් නෑ. මරණයක් නෑ. එහෙනම් 'භව නිරෝධය' දැකල නිවන් දකිනවා. එහෙම නැත්නම් 'භවය' ඇත්ත වෙනවා. දෙයක් තියෙනව නම් 'ජාති ජරා මරණ සෝක පරිදේව' උරුමයි. 'භව ඕඝය' 'සසර ඕඝය' හැදෙන හැටි. අප දුක් විඳින්නෙ දෙයක් තියෙනව මාත් ඉන්න නිසයි. මමයි දුක් විඳින්නෙ. ආත්මයක් තියෙන්නෙ. දෙයක් තියෙන නිසා. එහෙනම් **අපි දුකින් මිදෙන්න නම්, මෙතන දෙයක් නැති බව ආත්මයක් නැති බව අපට අවබෝධ වන්නම ඕන.**

අන්න අනාත්ම ධර්මය බුදුන් වහන්සේ ලෝකෙට හෙළි කරනවා. 'මහණෙනි ඇස නිත්‍යයද? අනිච්චං භන්තේ' ඒක ඇත්තක් නෙවෙයි. ඇත්තක් කියන්නෙ **ජේනබව. බිත්තිය කියල දෙයක් හමුවෙනවද? නෑ.** එහෙම දෙයක් කොහේවත් නෑ. එහෙනම් මහණෙනි ආත්මයක් තියෙනවද? 'නෝ හේතං භන්තේ' මුළු ධර්මයම තියෙනව ඔතන අනාත්ම ධර්මය. ඔය අනාත්ම ධර්මය තමයි ලෝකෙට විවර වෙන්නෙ. මේ මොහොත කතා කරපු විනාඩි ගණන මුළු ධර්මයම බැබලෙන්න හේතු වෙනව. මේ ලෝක සත්ත්වයාට දුකින් මිදෙන්න හේතු වෙනව. මේ පිරිසිදු 'ශ්‍රී සද්ධර්මය' බුද්ධ දර්ශනය ඕක තමයි අපේ හාමුදුරුවො කතා නොකරන්නෙ. ඕක තමයි උන්වහන්සේලා නොදන්නා රහස මේ ගෞතම බුදු සසුනේ පිබිදෙන යුගයයි. දැන් මේ සත්‍යයට අවදි වන්නම ඕන. එහෙම නැති වුණොත් මේක ඔබේම අභාග්‍යයත් බවට පත්වේවි. මේ සත්‍ය අවබෝධය තියේ නම් මිදීමකුත් තියෙනව. හැම කෙනෙකුටම මේ නිවන විවෘතව අත්දකින්න හැකියාවක් තියෙනව.

තෙරුවන් සරණයි.

# 03

# සත්‍ය දන්නෝ සහ නොදන්නෝ

**ආර්යයන් වහන්සේ:** හැම කෙනෙකුටම මේ නිවන විවෘතව අත්දකින්න හැකියාවක් ලැබෙනව. ඕනම කෙනෙකුට මේ සත්‍ය අවබෝධ වුණොත් නිවන් දකිනව. හැම කෙනාටම නිවන් දැකීමේ හැකියාවක් තියෙනව. අපි වචන ගොඩකට කොටුවෙලා ඉඳීමෙන් පළක් නෑ. 'ඝටීකාර' අනාග ාමී. ඒ කියන්නෙ 'ශුද්ධවාසෙ' ආයෙ උපදින්නෙ නෑ. ඝටීකාර ශුද්ධවාසෙ තමයි කටයුතු කරන්නෙ. සුවිසුද්ධං සත්ව පුද්ගල දෘෂ්ටියක් නෑ. ඔබට සිතක් තියේ නම් සිතේ මිදීමකුත් තියෙනව. ඔබ කරන වෘත්තිය මොකක්ද? ඝටීකාර වගේ වළං හදනවද මොකක්වත් අදාළ නෑ. මේක ප්‍රඥාවන්තයින්ගේ දහමක්. මේක විනිවිදව පේනව ඕනම කෙනෙකුට. අවුරුදු 7 ළමයි සෝතාපන්න වෙනව. ඒක ඇත්ත.

බුද්ධෝත්පාද ප්‍රධාන නාළිකාව තුළින් ඔබට හමුවෙනව. 'බෝධි අංකුර' කියල දේශනා. පුංචි දරුවා පවා මේ දහම අවබෝධ කරන ආකාරය ඒකෙ තියෙනවා. බුද්ධෝත්පාද ප්‍රධාන නාළිකාව අධ්‍යයනය කරන කොට ඔබට හමුවෙනව 'බෝසත් දරුවන්' කියල දේශනා මාලාවක්. ඒ විතරක් නෙමෙයි යූටියුබ් නාලිකාවකුත් දැන් ඇරල තියෙනව 'බුද්ධෝත්පාද' කියල. දරුවන්ගේ ඒවා වෙනම යන නාලිකාවක්.

සිතිවිලිවල ඉඳගෙන කරන හැම වැඩක්ම පොඩි දරුවො සෙල්ලම් කරනව වගේ, වැඩක් නෑ තමයි. ඒ පෘථග්ජන භූමිය. **මේ නිවන් මග දකින එක හරි සුන්දරයි. පුංචි ළමයි හීන දකිනව වගේ, අපි සත්‍ය ලෝකයේ හීනයක් දකිනව ලෝකය ඇත්තයි කියල හිතාගෙන.** ලෝකය කියන්නෙ මායාවක්. ඔය මායාවේ හැමදාම හීන බල බලා ඉන්න බැහැනේ. කවුරුහරි ඇත්ත දැනගන්න කොට ඔය හීනවලින් අවදි වෙනව. ඒ තමයි

'සුපර් වර්කන්' ඒ කියන්නෙ 'අධිගත සමාධියක්' ලබනව. ඒ කියන්නෙ සත්ව පුද්ගල ස්වභාවයෙන් මිදුණු සත්‍යයකට අවධි වෙනව. 'අරියානං දස්සාවි' අරිය ධම්මේසු කෝවිදෝ' අන්න එතනටයි එන්නෙ. පුංචි කාලයක් ඇතුළත බුද්ධ දර්ශනය හඳුනා ගත්තා. ඒ දර්ශනය තුළ ඔන්න ඔතන ඉඳන් දකින්න. එතකොට ඔක්කොම පිරිසිදු වෙනවා. පිරිසිදු නිවන් මගත් හම්බ වෙනවා.

අපි දන්නව නේ උදෑසන හිරු පායන කොට මේ නැගෙනහිර කියලා, කවුරුත් කියන්න ඕන නැහැ නේ. අපට කවුරුහරි උගන්වන්න ඕනද නැගෙනහිර කියලා. මේ ධර්මය ඔන්න ඔය වගේ. මේ ධර්මයේ දැනෙන පැත්තක් තියෙන්නෙ. ඒක තමයි 'ඤාණයට හසුවන්නෙ.' හිතන එක කියන්නෙ විඤ්ඤාණ මායාව. **හැබැයි මේ නිවන් මග තියෙන්නෙ 'ඤායස්ස අධිගමාය' 'නිබ්බාන සච්ච කිරියාය.' දැනෙන අයට විතරයි නිවන් මග විවර වෙන්නෙ, හිතන අයට නෙවෙයි දැනෙන අයට.**

'ජානතෝ අහං භික්ඛවේ 'එස්සතෝ ආසවානම් ඛෙයම් වදාමි' 'නො අජානතෝ නො අපස්සතෝ' දැනෙන්නෙ නැති කෙනෙකුට නිවනක් නෑ. ඒ කියන්නෙ මේක ප්‍රතිපදාවක් ඇතුළෙයි තියෙන්නෙ. මේක සිතුවිල්ලක් නෙවෙයි. බණ ඇහුව කියල හරියන්නෙත් නෑ. සිතුවිලිවලින් නිවන් දකින්න බෑ. මොකද සිතුවිලි කියන්නෙ විඤ්ඤාණ මායාව. එතන නිවන නෑ. සිතිවිලි අභිබවා ගිය දැනෙන ස්වභාවයන් ඔබ තුළින්ම දකින්න හැකියාවක් තියෙනවා. දකිනව කියන එක වෙනයි, දැනෙනව කියන එක වෙනයි. දකින දේ දැනෙන්නත් ඕන 'ජානතෝ අහං භික්ඛවේ එස්සතෝ.' හිතන කොට හිතන දේ මැවෙනව, හොරෙක් කියල හිතන කොට හොරෙක් කියල මැවෙනව නේ. හොඳ කෙනෙක් කියල හිතන කොට, හොඳ කෙනෙක් කියල හිතනව නේ. හිතන හින්ද නේ එන්නෙ. මේ සිත කියන්නෙ ඇත්තක් නෙවෙයි නේ. සිත කියන්නෙ කෙනෙක් පුද්ගලයෙක් නෙවෙයි නේ.

සිත කියන්නෙ ශබ්ද වර්ණවලින් නේ හැදිල තියෙන්නෙ, ශබ්ද වර්ණ ගන්ධ රස පහස නේ. 'ස්පාර්ක්' එකක් විතරයි නේ. ඒක ආත්ම කතාවක් නැහැනේ. ශබ්දය ආත්මයක්ද? වර්ණය ආත්මයක්ද? උණුසුම සීතල ආත්මයක්ද නැහැනේ. එහෙනම් මෙතන ආත්මයක් නැහැනේ. ඇත්ත

කතාව ඕකනේ. ඕක භාර ගන්න බැරිකමම තමයි ඔය දුක් විඳින්නෙ. ඒක බාර ගන්න හැටි තමයි මේ කියල දෙන්නෙ. ඇත්ත දැනගන්නකම් ඕක බාර ගන්න බැහැනේ, ආත්මයක් නෑ කියල. ආත්මයක් කොහොමද මේකෙ නැත්තෙ කියල ඉස්සෙල්ල දකින්න ඕන. මේක අවබෝධ කරන දහමක්. 'සංඛිත්තේ නිබ්බිදාය' ආත්මයක් හැදෙන හැටි අවබෝධ කරගන්න ඕන. ආත්මයක් හැදෙන හැටි දැක්කොත්, මැජික් කරන හැටි දැක්කොත් තමයි මැජික්වල මැජික් නැති වන්නෙ. මැජික්වලට රැවටෙනව නේ. දැන් අපට පේන දේ මැජික් එකක් කියල පේන්නෙ නැහැ නේ නේද?

ඔබ ඉදිරියේ මොනවද තියෙන්නෙ ආර්යන් වහන්සේ ඉදිරියේ තියෙනව කොස් ගහක්. පේන දේ නේ කියන්න ඕන. රහතන් වහන්සේට ඉදිරියේ තියෙන දේ පේන්නෙ නැතුව නෙවෙයි නේ. අන්ධ වෙලා නැහැ නේ. බිහිරි වෙලා නෑ. මන්ද බුද්ධික වෙලා නෑ. මේ දහම අවබෝධ වුණහම සාමාන්‍ය විදියම තමයි, සාමාන්‍ය විදියට කනව බොනව. නැත්නම් කොහොමද? 'බහුජන හිතාය බහුජන සුඛාය කියන්නෙ. ඉදිරියේ තියෙන්නේ පුටුවක්. ඕක ඇත්තක්ද? ඔන්න ඕක තමයි මායාව. ඒක අපි හිතනව පුටුව කියල. ඔතන අපේ ඇහැ නැත්නම් පේන්නෙ නැහැනේ. මේ ඇසට මැවෙන එකක් නේ. ඔතනයි ලිහා ගන්න තියෙන්නෙ. ඔය මායාව මැවෙන හැටියි දන්නෙ නැත්තෙ. ඒකයි මෙතන රැවටිලා ඉන්නව කියන්නෙ. විඤ්ඤාණ මායාවට රැවටිලා ඉන්න. ඕකයි දර්ශනය තුළ ලිහා ගන්න ඕන තැන. බුදුපියාණන් වහන්සේ 'මහා නිධාන සූත්‍රය' 'සංඥ්චේතනා සූත්‍ර' 'අභිසංකරණ සූත්‍ර' ඇයි මෙච්චර සූත්‍ර දේශනා ගොඩක් දේශනා කරන්නෙ. ස්කන්ධ වග්ගයක්ම තියෙනව.

මුළු සමාජයක් නොමග ගිහිල්ල තියෙන්නෙ. පටිච්චසමුප්පාද ධර්මය දන්නෙවත් නෑ. ප්‍රායෝගික පැත්තක් කතා කරන්නවත් තේරෙන්නෙ නෑ. අත්දැකීමක්වත් නෑ. එහෙම මාර්ගයක ගිහිල්ලත් නෑ. ඇත්තටම මේ යුගයේ ධර්මය සොයන්නාට ධර්මය හමුවෙනව. හැබැයි පුද්ගල සරණ ගිහිල්ල කොහේ හරි දෘෂ්ටියක් හිරවෙලා හිටියොත් එයාගෙ නිවන වැහෙනව. මොකද මේ යුගයේ තියෙන්නෙ තනිකර දෘෂ්ටි. මේ යුගයේ බුද්ධෝත්පාද දේශනා අධ්‍යයනයකින් තොරව කිසිවෙක් නිවන් දකින්නෙ

නෑ. මෙහි පුදුමාකාර සත්‍යයක් තියෙන්නෙ. සමීක්ෂණයක් කරල බලන්න පුළුවන්. මේක හොරෙන් ගන්න බෑ කාටවත්. කොච්චර කොපි කරන්න ගියත් හරි යන්නෙ නෑ. මේකම බලන්න ඕන මෙතන තියෙන ධර්මය මොකක්ද කියල. මෙතන තියෙන්නෙ බාහිර ඇත්තක් නොවන දහමක්. මේක කොහොමද සකස් වන්නෙ කියල පැහැදිලි කරන එක. මේක තමයි යුගයේ යුග පෙරළිය. සිත හැදෙන හැටි.

සිතින් මිදෙන මග, දුකින් මිදෙන මග, නිවන් දකින මග එයයි නිස්සරණ මග. අපි කතා කරන හැම වචනයක්ම බොරුවක්. ස්වභාවදහම කියල දේකුත් නෑ. ඒක අපේ කතා කරන වචනයක් විතරයි. ඇත්තටම මෙතන දෙයක් නැත්නම් එහෙම දේකුත් නෑ. දුටු දෙයක් නැත්නම් දුටු කෙනෙකුත් නෑ. මේ මායාව කුමක්ද? පුටුව පේනව කියන්නෙ ඔක්කොම මායාවක්. ඒක තමයි මායාව. දැන් පුටුව කොහොමෙද හැදෙන්නෙ. පුටුව කියන කොට ශබ්දයයි වර්ණයයි, 'උණුසුම සීතල තද ගතිය ගන්ධ රස' මේ ටික එක මොහොතෙම ස්පාර්ක් වෙන වේගෙට මේ 'ධම්ම ස්පාර්ක්' එක සකස් වන ආකාරය නුවණින් දකිනවා. නුවණින් දැක්කම මොකද වෙන්නෙ. ඇත්තටම මේක සිතුවිල්ලක් විතරයි. පුටුව කියන්නෙ සිතුවිල්ල. හිතක මැවෙන එකක් කොහේවත් තියෙන එකක් නෙවෙයි. එහෙම දෙයක් කොහේවත් නැහැ. එතකොට නැති දේකට කරන්ට් එකක් වගේ වටිනාකමක් ආවෙ කොහෙන්ද? පුටුව වටිනවා, දරුවා වටිනවා, අම්ම වටිනවා, රත්තරන් වටිනවා. කොහෙන්ද මේවා ආවෙ? මෙන්න මෙතනයි තියෙන්නෙ. දෙයක් තිබ්බොත් ඒකට අගයක් තියෙනවා. ඒක නැවත නැවත බලගැන්වෙන ආකාරය නුවණින් දකින්න තියෙනව. අභිසංකරණය වන හැටි.

ඊයේ දැකපු පුටුව අදත් තියෙනවා තුන් කාලයකුත් තියෙනවා. 'පෝනෝභවිකා' කියන ස්වභාවය පෙන්නුව නේ මේ දේශනාවල. **මේ පැත්ත බලන කොට පුටුව පේනව, මේ පැත්ත බලන කොට බිත්තිය පේනව. ආයේ මේ පැත්ත බලන කොට අර පුටුව තවම තියෙනවා. ආයේ හෙට ඇවිදින් බලන කොට ඒක දැනුත් තියෙනවා. අන්න තුන් කාලයක් ඇත්ත වෙලා. අමුතු කතාවක් හැදෙනව නේ. ලෝකයක් මැවෙනව කියන්නෙ ඕකට. ඔන්න ලෝකය මැවෙන හැටි. දැන් ලෝකය**

**මැවුණෙ කොහේද? ලෝකය තියෙන්නෙ මගේ සිතේ. මගේ සිතේ තියෙන ලෝකය සත්‍ය නොවන බව දැකපු දවසට මම දුකෙන් මිදෙනවා. එදාට මම නිවන් දකිනවා.** දැන් ඕක දැක්ක එක ඉස්සෙල්ල වෙන්න ඕන. සත්‍ය දැනගන්න එපැයි. සත්‍යයනේ සමාජයට ගිලිහිලා තියෙන්නෙ. විශාල පරාසයකට යනවා කම්පනය වන වේගෙට මේක සකස් වන ආකාරය. බුද්ධෝත්පාද දේශනා කියන්නෙ යුගයේ මහා ආශ්චර්යයක්. කොහේවත් මුක්කු ගහන්න ඉඩ තියල නෑ.

නූතන විද්‍යාඥයින්ට පවා, ඉංජිනේරුවන්ට පවා, පුංචි දරුවන්ට පවා, ගොවිතැන් කරන අම්මලට පවා ඒ ඒ අයට අවශ්‍ය විදියට දේශනා කරල තියෙනව. මොන තියරි එක ගෙනාවත් නූතන විද්‍යාඥයන් මොකක් ගෙනාවත්, කොන්ටම් නෙවෙයි තරංග නෙමෙයි මොනව ගෙනාවත් ඔක්කොම පරදිනව 'බුද්ධ ඥානය අචින්ත්‍යයි.' ඒකට හේතුව මේ සත්‍ය අවබෝධය කියන එක එසේ මෙසේ කතාවක් නෙවෙයි. වෙන සත්‍යයක් ලෝකයේ නෑ. සත්‍ය දෙකක් තියෙන්න බෑ. දෙකක් තිබ්බොත් එකක් වැටිල එකක් සත්‍ය වෙනවා. මේ සත්‍ය දේශනා කරනවා කියන එක ලේසි නෑ. සත්‍ය දැනගත්තා කියල විතරක් වැඩක් නෑ. ඒක දැනුමක් විතරයි.

දැනුමෙන් නිවන් දකින්න බෑ. හැබැයි මේක දැනගන්නත් ඕන. ඊළඟ එක බලන්න 'කෘත්‍ය ඥානය', මොකක්ද මේ කියන්නෙ? ආත්ම ස්වභාවයක් මේ දැනගන්න තැන තියෙනවා නැති වෙන්නෙ නෑ. ඇයි මේක දන්න මම ඉන්නවනේ. ඊට පස්සේ ඒක 'ධම්ම උද්දච්චය.' ධම්ම උද්ධච්චයත් අනිවාර්යෙන්ම හැම කෙනෙකුටම එනව. ඒක හැමෝම දැනගන්න ඕන. හැම කෙනෙකුටම මේක අනිත් අයටත් කියන්න හිතෙනව. ඒ හිතෙන්නෙ ආත්මය තියෙන නිසයි. අම්මට කියන්න ඕන. අයියට කියන්න ඕන. මේක අහවල් යාළුවට කියන්න ඕන. ඔය එන්නෙ ආත්මය තියෙන නිසයි. හැබැයි එකක් හොඳට මතක තියා ගන්න. බුදුනු වහන්සේගේ සුළු මව ප්‍රජාපතීවත් මේක දැනගෙන හිටියෙ නෑ. සැරියුත් හිමියන්ගෙ අම්මාවත් මේක දැනගෙන හිටියෙ නෑ.

දැන් ඉන්න අය හිතනව ඉස්සෙල්ලම ගිහින් අම්මට කියන්න ඕන කියල. කොහොමද මේ වෙනස වුණේ. උන්වහන්සේලා දන්නව මෙතන ධම්ම උද්ධච්චය එන බව. ආත්මයක් තියෙනකම් එනවා. මේක කිව්වට

කාටවත් එහෙම තේරෙන එකක් නෙවෙයි. ඉස්සෙල්ලාම තමන් නිවන් දැකල ඉන්නම ඕන. එහෙනම් මේ කියන්න යන අදහසක් ආත්මයක් තියෙනව කියල දැනගන්න ඕන. ඒක එන්නෙ මාර සංඥාවකින්. ආත්ම සංඥාවකින්. **ආත්මය තියෙනකම් විඤ්ඤාණ මායාව එක එක රංගන දානව. ඔය එක රංගනයක්. ඕකට කියනව 'ධම්ම උද්ධච්චය' කියල. ඔබ දන්නවද ඕකෙන් වෙන වැඩේ. ඔබේ නිවන වැහෙනව. ඇයි ඔබ තවම නිවන් දැකල නෑ. ඔබ නිවන් දැක්කොත් ඔය 'ධම්ම උද්ධච්චයට' හසුවෙලා ඔය වැඩේ කරන්නෙත් නෑ ඔබ නිහඬ වෙනවා.** මේ ධර්මය භාගෙට දැනගත්තොත් ඔබ ධම්ම උද්ධච්චයට හසුවෙලා ලොකු පටලැවිල්ලක් සිදුවෙනවා. ආර්යයන් වහන්සේ අවුරුදු දෙකක් නිහඬව සිටිය නේ.

අපේ හාමුදුරුවන්ට කිව්වත් මේක තේරෙන්නෙ නෑ. ඊට පස්සෙ ආර්යයන් වහන්සේ සම්පූර්ණයෙන්ම නිහඬ වෙනව. කොරෝනා වසංගතයට පින්සිදු වන්නට දැන් දිගටම මේක කියාගෙන යනව. ඇයි නිහඬව සිටියේ? ඇයි ආර්යයන් වහන්සේ අම්මටවත් මේක කියල නැත්තෙ. අම්මට කියන්න නම් අම්ම ඉන්න කාලෙ ආර්යයන් වහන්සේට මේ අවබෝධය තිබුණෙ නෑ. ඇයි ආර්යයන් වහන්සේ ළඟ ඉන්න අයට කියන්නෙ නැත්තෙ.

ඇයි ආර්යයන් වහන්සේ පාඩුවේ ඉන්න උත්සාහ ගත්තෙ. ඔබටත් මේ දහම අවබෝධ වුණොත් ඔබත් ඒ දේ කරාවි. ඇත්තටම මේ දහම අවබෝධ වුණාහම මෙතන කෙනෙක් නෑ. මෙතන කෙනෙක් හම්බ වෙන්නෙ නෑ කෙනා දියවෙනව. **කෙනා දියවෙලා ගියාට පස්සෙ ආත්ම ස්වභාවය, ඉන්නව වගේ දැනෙන ස්වභාවය ඇත්තටම දියවී ගෙන යනවා. ඊට පස්සෙ ඇත්තටම මැරුණා හා සමානයි. ජීවත් වෙලා ඉන්න කොටම මරණය ජය ගන්නව. ඊට පස්සේ ලී කැබැල්ලක් වගේ.** ඒක කිසි කෙනෙකුට තේරෙන්නෙ නෑ.

බුදුන් වහන්සේත් 'උපකට' බණ කියන්න ගියේ නෑ. එහෙම තේරෙන්නෙ නැහැනේ කාටවත්. පස්වග තවුසන් උත්සාහ කර කර සිටියට මොකක්හරි. ඒකනේ පස්වග තවුසන්ට කියන්න බලන්නේ. ඒ වගේ තමයි ආර්යයන් වහන්සේත් ආරණ්‍යවල ඉන්න හාමුදුරුවන් එක්ක කතා කරන්න බලනව. හරියන්නෙ නෑ වැඩේ. තේරෙන්නෙ නෑ. ඒ අය

අල්ගන්නෙ නෑ. මේක කියන්න පුළුවන් කෙනෙක් නෑ. මේක කියන්න තේරෙන කෙනෙක් නෑ. ඊට පස්සේ ආර්යයන් වහන්සේ නිහඬ වෙනව. කතා කරන්න කෙනෙකුත් නෑ. කතා කරන්න කෙනෙක් හදාගන්න ඕන කියල ආර්යයන් වහන්සේට තේරුණා. කොරෝනා හැදුණාට පස්සේ ආර්යයන් වහන්සේ හොඳටම දන්නව කොයිවෙලාවෙහරි මේ ශරීර කූඩුව කොහොමත් පවතින්නෙ නෑ. මේක අනිවාර්යයෙන්ම හෙළි කරන්න ඕනෙ කියල. ඉන්න බලාගෙන නෙවෙයි කොයි මොහොතෙ හරි නැතිවෙන බව දැනගෙන.

මේක ලේසි නෑ. මේක ගන්න කෙනෙක් ගනීවි. හැබැයි මේක දාගෙන යන අතරේ ආර්යන් වහන්සේට තේරෙනවා පොඩ්ඩ පොඩ්ඩ දැන් කට්ටිය අල්ලගන්න ඉඩක් තියෙන බව. ඊට පස්සෙ කෙනා කෙනා එකතු වෙනවා. ඊට පස්සෙ ආර්යන් වහන්සේ මේක ඇතුළෙම කට්ටිය හදා ගන්නව. කතා කරන්න පුළුවන් අය. හැබැයි මේකෙ දේවල් අහගෙන අහගෙන යන අය ආර්යන් වහන්සේ සමග කතා කරනව. එතකොට ආර්යන් වහන්සේට තේරෙනව ඒ අය එක එක මට්ටම්වල තමයි අල්ල ගන්නෙ. එකපාරටම තේරෙන්නෙ නෑ. සිත කියල දෙයක් නෑ කිව්වොත් කවුද කතා කරන්නෙ කියල අහනව. මේක ලේසියෙන් තේරුම් ගන්න බෑ. ඊට පස්සේ මේ අය අතරින්ම යම්කිසි විදියකට කතා කරන්න පුළුවන් අය මතුවෙවී එනව. අන්න ආර්යන් වහන්සේට භූමිකාවක් හැදෙනවා. යම්කිසි පිරිසක් හැදීගෙන එනව. ඊට පස්සෙ තමයි සාකච්ඡා එන්නෙ. දැන් ආර්යන් වහන්සේ කරන්නේ ඒ අයම දියුණු කරල ඒ අයටම බණ කියල ඒ අයගෙම ප්‍රශ්නවලට උත්තර දෙනව. ඕක තමයි දැන් කරන්නෙ. දැන් බුද්ධෝත්පාද දේශනා අහල ඒව තුළම විදර්ශනාව මතු කරගෙන ඒක තුළ තම තමන්ට එන සියුම් තැන් ගලවල දෙන එක තමයි ආර්යන් වහන්සේ කරන්නෙ.

ඔය විදියට තමයි මේ කටයුතු සිද්ධ වන්නෙ. ඒක මහා ආශ්චර්යයක්. නිවන් දකින පිරිස නියපොත්තට ගත්ත පස් ටික වගේ. බොහොම ටික දෙනයි මේ සත්‍ය අවබෝධ කරන්නෙ. කාටවත් තේරෙයිද බාහිර ඇත්තක් නෙවෙයි කියන එක. ගොඩක් වෙලාවට අප ධර්මය තුළ ඇහුවෙ එළියෙ තියෙන එකක් ඇහැට එනව කියල. එළියෙ තියෙන ශබ්දයක් කනට එනව කියල. ඇත්තටම එහෙම එකක් නැහැ.

එළියෙ තියෙන ආලෝකය ඇහැට එනව කිව්වොත්, එයා නිවන් දකින්නෙත් නෑ. එළියෙ තියෙන සද්දයක් කනට එනව කිව්වොත් එයා නිවන් දකින්නෙත් නෑ. ඇයි ශබ්දය ඇත්ත වෙලා නේ. බාහිර නෑ කියල හිතන එකක් විතරයිනේ. එයා නිවන් දකින්නෙ නෑ. මේ ආයතනවලට මැවෙන එකක් එළියෙ කොහේ හරි තියෙනව කියල කියපු ගමන්ම එයා මිථ්‍යා දෘෂ්ටිකයෙක් වෙලා. ඕක ඉතාම සියුම්. ආයතනවලට මැවෙන එක සළායතන ලෝකය කියල දැක්කෙ නැති කෙනා නිවන් දකින්නෙත් නෑ. ඔතන තියෙනව මහා ගැඹුරු තැනක්. 'සත්තානං විසුද්ධියාය' කියන තැනක්. ඒ කියන්නෙ සත්ව ඉත්ථභාවය තියෙනව කියල දැනෙන එක, ශුද්ධ වන්නම ඕන. මේ නිසා තමයි විශාල පරියායක් දේශනා කරනව කම්පනය පෙන්වන්න. කම්පනයට මැවෙනව කියන එක පෙන්වන්න. ඊට පස්සෙ පෙන්නුව 'සෙන්සස්' 5යි තියෙන්නෙ. මෙතන විශාල පරියායක් තියෙන බව. ආයතන පහට මැවෙන ඒව කොහේවත් තියෙනව නෙමෙයි කියන්න හේතුව.

විඤ්ඤාණ මායාවෙන් තොර අත්දැකීමක් අපට ඇත්තෙ නෑ. ඒක නිසා අපට බාහිර අත්දැකීමක් නෑ. අපි දකින, අපට පෙනෙන, අපට දැනෙන කිසිම දෙයක් ඇත්තටම කොහේවත් තියෙනව නෙවෙයි. ඇල්ලුවොත් තද ගතියක් තියෙනවා. හංකඩේ අපේ හිරිවැටෙනව නම් මේක දැනෙන්නෙ නෑ. එහෙනම් මේ 'සෙන්සස්' එක නිසයි දැනෙන්නෙ. කන්බෙරය හිල්වෙලා නම් ශබ්ද නෑ. 'සෙන්සර්' නිසයි දැනෙන්නෙ. ඇහැ අන්ධ වෙලා නම් වර්ණ නෑ. 'සෙන්සස්' එක නිසයි දැනෙන්නෙ. 'සෙන්සස්' එනව දැනෙනව කියන එක කොහේවත් තියෙනවා නෙවෙයි කෙනා කෙනාගේ 'සෙන්සස්'වල හැටියට මැවෙන එකක්.

ඒකයි මනුෂ්‍ය ජනගහනයෙන් කෝටි 800ට ලෝක කෝටි 800ක් මැවෙනව කියන්නෙ. ලෝකය කොහෙද තියෙන්නෙ එතකොට. කෙන කෙනාගේ සිතේ. එළියෙ මොකක්ද තියෙන්නෙ. එළියෙ අන්ධකාරයි. එහෙමද එළියෙ එකක් ගැන අපට කියන්න බෑ. දැන් කොහොමද සිතුවිලි ලෝකය. එතකොට ආර්යන් වහන්සේ මේ අල්ලන්නෙ, අල්ලන්න 'සෙන්සර්' එක තමයි එතකොට මේ පේන්නෙ ඒත් 'සෙන්සර්' එක තමා එතකොට. මේ දැනෙන්නෙ, ඒත් 'සෙන්සර්' එක. එතකොට

අනික් කෙනාටත් දැනෙන්නෙ එයාගෙ 'සෙන්සර්' එකට. එතකොට ඔය ගෙවලහෙම හදන්නෙ, මේක හිතාගෙන කරන විජ්ජාවක් තියෙන්නෙ. 'විජ්ජා ලෝකයක්' 'ෆැන්ටසි' ලෝකයක් හිතන නිසා දැනෙනවා.

ඇස් නැති අයත් ගෙවල් හදනව. මොනව දැකලද හදන්නෙ. වේයත් ගෙවල් හදනව. එයාට මනුෂ්‍යයාට වගේ පේන්නෙ නැහැනේ. මේක තමයි අපි කිව්වා 'පූසා' 'කුප්පමේනියා' කනව වගේ කියල. 'බල්ලා' 'රතු පස්' කනව වගේ කියල. **අපි කිව්වා නේද 'ජාන' ගැන, දැනෙන එකක් තියෙනව කියල. දැනෙන එක 'ඥානය' කියල පෙන්නුව නේද? නිවන් මගත් මෙහෙම දෙයක් තියෙනව. ලංකාවේ ඉපදිලා ඉන්න සිංහල බෞද්ධ 'ජානවල' මේක තියෙනවා. මේ අය නිවන් දකින්නයි ඉපදිලා තියෙන්නෙ.** මේ අයට නීතියක් නෑ. මේ අය නීති ගණන් ගන්නෙ නෑ. මේ අයට නීති දමන්න හරි අමාරුයි. මේ අයගේ ජානවල තියෙනව අවුරුදු දහස් ගණනක් ඈතට. මේ අය සංවර වන අය, මේ අය රිදවන්න අමාරුයි.

**මේ නිවන් මග යන අයට තියෙනව ඒ අයට ආවේණික වුණ කිසිම දෙයක් ගණන් නොගන්න 'නිදහස් චින්තන ස්වභාවයක්.' ඒ නිසයි ඔය ස්වභාවය තියෙන්නෙ.** මේක කාටවත් තේරෙන්නෙ නෑ. මේ අය ඉපදිලා තියෙන්නෙ නිවන් දකින්න. මේක ජානවල තියෙන්නෙ. සිංහල බෞද්ධයාට දැනෙන ස්වභාවයන් තියෙන්නෙ. මේක විද්‍යාඥයින්ගෙ සමීක්ෂණයෙන්ම ඔප්පු වෙලා තියෙන්නෙ. ආර්යන් වහන්සේගේ විශාල කතාවක් තියෙනව මේ ගැන. 'ඥානය' කියන එක සිතුවිලි නෙවෙයි. හැබැයි සිතුවිලිවලින් මේක වැහෙනව. **අපේ අධ්‍යාපන ක්‍රමයෙන් අධ්‍යාත්මය තුළ පිබිදෙන්න තියෙන ඥානය වැහෙනව. අපිට ආවේණික අපේම ආධ්‍යාත්මික ක්‍රමයන් අපිට සකස් වෙනව.**

මේ යුග පෙරළිය මේ මොහොතේ මේ සත්‍යය, ආත්මයක් නැති බව දකින මේ ස්වභාවය. මේ නිදහස් චින්තන ස්වභාවය මේ නිවන් දකින ස්වභාවය ආධ්‍යාත්මික දියුණුව 'අභිඥ්ඥා' සකස් වන ආකාරය, ඇත්තටම කීවොත් ආසියාවේ මුතු ඇටය තුළ තියෙනව. ඇයි ඉන්දියාවේ බුදුදහම නැත්තෙ? ඇයි ලංකාවේ මෙච්චර ගල්ගුහා තියෙන්නෙ. ඇයි මෙච්චර නටඹුන් තියෙන්නෙ. ඇයි අසෝක අධිරාජයා ලංකාවට එන්නෙ,

ඇයි ඒක ඉතිහාසයෙන් මකන්නෙ. ඇයි අසෝක අධිරාජ්‍ය ලංකාවට දුවයි පුතයි එවන්නෙ. අන්තිමට අසෝක අධිරාජයාගේ භුස්ම ටික යන්නෙ කොහේද? කියල එයාලගේ ඉතිහාසයෙන් සොයන්න කියන්න. මොකක්ද මේ කාලයේ වැලිතලාවට සැඟවිලා තියෙන සත්‍යය, මේ ආධ්‍යාත්මික දියුණුව මේ ඉන්දියන් සාගරයේ මුතු ඇටය තුළින් මතු වෙනව. මේක ජානවල පවතිනව.

මොකද මේකේ රහස බටහිර විද්‍යාඥයෝ දන්නව. ආතර් සී. ක්ලාක් මේ 'ජාන' සංයුතිය නිසා සකස් වුණා මිසක් වෙන දෙයක් නෙවෙයි. ඒකෙන් තමයි ඔය තාරකා විද්‍යාඥයෝ ඔක්කොම සිහින මවන්නෙ. ඉන්දියන් සාගරයේ මුතු ඇටයේමයි මේ ලෝකයම දෙවනත් වන ස්වභාවය තියෙන්නෙ. මේක මතු වුණොත් ලේසිවන්නෙ නෑ. මෙන්න මේකයි ආර්යන් වහන්සේට මේ මොහොතේ කරන්න ඕනකම තියෙන්නෙ. මේක ටික ටික පෙන්වන්න ඕන. එකපාරට කියන්න ගියොත් මේක දරාග න්න බැහැ. එහෙම වුණොත් දෘෂ්ටි හදාගෙන තවත් මිථ්‍යාදෘෂ්ටිවල හිරවෙනවා. මෙතෙක් කාලයක් නොකියපු දේවල් ඉස්සරහට කියවෙනව. ඔබ හැම කෙනෙක්ම නිවන් දකින්නයි ඉපදිලා තියෙන්නෙ. **මේ බුද්ධෝත්පාද දේශනා අහන හැම කෙනෙක්ම නිවන් දකින්නයි ඉපදුණේ. මේ දේශනා අහන එක ලේසි නෑ. මේ අයට ආයෙ උත්පත්තියක් නෑ. හැබැයි ඒක වෙන්න නම් මේ පැහැදිලි කරන කාරණා එකින් එක මනා කොට ගළපාගන්න ඕනෑ.**

මේ ගෞතම බුදු සසුනේ නැවත පිබිදෙන යුගයයි. අපිට මේ බාහිර තියෙන දෙයක් හම්බ වෙලා නෙවෙයි. අපි සිතාගෙන බාහිර සකස් කරගෙන තියෙන ජාතියක්. මේසෙ, ගෙවල් හදනව වගේ. කූඹීන් ගෙවල් හදනව නේ. වේයෝත් හදනව ලොකු ගෙවල්, හැබැයි වේයට පේන විදියට අපට පේන්නෙ නෑ. අපිට පේන විදියට වේයට පේන්නෙත් නෑ. එළියෙ දකින්නෙ නැතුවත් ගෙවල් හදන අය ඉන්නව. ගෙවල් හදනව කියන්නෙ දැනෙන ස්වභාවය සකස් වන එකක්. ඔබ කරන කටයුතුවලින් බාගෙට වැඩිය ඔබ නොදන්නව වුණාට ඔබේ අධ්‍යාපන ක්‍රමයට වැහිලයි තියෙන්නෙ. නැත්නම් ඔබට දැනෙන ස්වභාවයට අනුවයි සිද්ධ වෙන්නෙ.

මේ සත්‍යය මතුකර ගන්න අපට අපේ අධ්‍යාපන ක්‍රමය තුළ විෂය

මාලාවක් අද නෑ. මේක බටහිරින් නොවන චක්‍රයක් විතරයි. මේ අධ්‍යාපන ක්‍රමය තුළ කිසිම දෙයක් ඉගෙන ගන්න බැරි අය ලෝකය මවිත කරන නිපැයුම් කරනව. නිර්මාණ කරනව. මේ අධ්‍යාපන ක්‍රමය අසාර්ථකයි. ඒක තේරුම් ගන්න සෑහෙන කාලයක් යයි. මීට වැඩිය අද්විතීය අධ්‍යාපන ක්‍රමයක් අපේ ජානවල තියෙනව. ඒක දකින්න ක්‍රමයක් නෑ. මේ ලංකාවෙ අය 'රූල්ස්' කඩාගෙන අමුතු දේවල් කරනව. එක 'රූල්ස්' එකක්වත් අපට දාන්න බැරි ඔන්න ඔය නිසයි. අපට 'රූල්ස්' නෑ. අපට තියෙන්නෙ ආධ්‍යාත්මය තුළ දැනෙන ගතියක් දැනෙන දේ කරන්න ඕන. ඒක තමයි ජීන්ස් එක. මේ ජානවල තියෙන කතාව. මේ ආධ්‍යාත්මය පැත්තෙන් එහෙමයි.

සමහරවිට ඔබ මේ ආර්යන් වහන්සේ කියන දේ ඇහුවත් හරියන්නෙ නෑ ඔබට දැනෙන්න ඕන. ඔබේ විදර්ශනාව ඔබ තුළින් මතුවන්න ඕන. මේ විදර්ශනාව කිසි දවසක පොතක ලියන්න බෑ. මේ විදර්ශනා ඥානය කියන්නෙ කෙනා කෙනාට සකස් වන එකක්. 'හදපු පාරු නැත මහණෙනි, පාරුව සාදා ගෙනයි යා යුත්තේ' කීවෙ ඒ නිසයි. අනුන්ගේ පාරුවල නගින්නත් බෑ, ඔබට දැනෙන දේ කරන්න. ඔබ මොන වෘත්තියද කරන්නෙ. ඔබ මොන රැකියාවද කරන්නෙ, ඔබ මොන ව්‍යාපාරයද කරන්නෙ. ඔබට දැනෙන දේ කරන්න. ඔබ ඒකෙ තියෙන සීමාමායිම් හඳුනාගෙලන ඔබ නිදහස් චින්තනයක් ඇතිව ඔබේ කටයුතු කළොත් ඔබ අද්විතීය විදියට ඒ දේ කරනව. විශේෂයෙන් මේ ලංකාවේ උපදින ජානවල තියෙන ස්වභාවය නිසයි අද්විතීය නිර්මාණ නිර්මාණය වන්නෙ.

ඇත්තටම ඒ නිර්මාණ කරන දරුවන්ට අත හිත දෙන ක්‍රමයක් අපට අවශ්‍යයි. නමුත් අපේ කරන්නෙ මේ අයට ශිෂ්‍යයන්ට දීල පිටරට යවනව. දෙමව්පියන් හිතනව අපේ දරුව පිටරට ගියා කියල ඒ අය අර වහල් මානසිකත්වය ඇතුළෙ බොළඳ සතුටක් ලබනව. හැබැයි මේ ආධ්‍යාත්මික දියුණුව මත මින් එහාට ඔය කෙණෙහිලිකම් කරන්න හම්බවන්නෙ නෑ කාටවත්. මේක අද්විතීය කතාවක්. මේ නිවන් මග විවර වන්නෙ කෙන කෙනාගේ අභ්‍යන්තරයේ. ඒ ස්වභාවය හසුකර ගන්න අර සියුම් 'ඥානය' අවදි කරගෙන.

'ඤාායස්ස අධිගමාය නිබ්බානස්ස සච්ච කිරියාය' කියන්නෙ, මේ ඥානය කියන්නෙ සිතුවිලි නෙවෙයි. ඔබට දැනෙන්න ඕන ඔබේ ආත්ම ස්වභාවය. ඔබට දැනෙන්න ඕන ඔබේ කෙලෙස් ස්වභාවය. ඔබට දැනෙන්න ඕන ඔය සිතිවිලිවල ස්වභාවය. මේ දැනෙන ස්වභාවය ඔබ ඉස්සෙල්ලම ඔබේ සිහියට හසුකර ගන්න ඕන. ඒ දැනෙන ස්වභාවය එක්කල ඔබ ගමනක් යන්න ඕන, එතන ඔබ අල්ල ගන්න ඕන. ඔබේම කම්පනයට සකස් වුණු ආත්ම ස්වභාවය. ඒක දියවන ස්වභාවයට ඔබට යන්න පුළුවන්. ඔබ නිවන් දකිනව එතකොට. ටිකෙන් ටික ඔබට 'ක්ෂය ධම්මා - වය ධම්මා' කියන එක හසුවනවා. අන්න මේ සත්‍ය දකින්න නුවණත් ඔබට පහළ වෙනව. ඒ සත්‍ය ඔබට හසුවෙනව. හැබැයි ඔබ ඒක සිතනව නෙවෙයි දැනෙන ස්වභාවයක්. ඒක තුළ ඔබට 'අධිගත සමාධියක්' උපදිනව. ඒක තුළ ඔබගේ කෙලෙස් සංසිඳෙන මග ඔබ යනව. ඒක තුළ ඒ කෙලෙස් සංසිඳුණ ඔබ නිවනට පත් වෙනවා.

ඔබ කවුරුවත් විශ්වාස කරන්න එපා. මේක විශ්වාස කරන අද්භූත එකක් නෙවෙයි. ඔබ ඔබේම අභ්‍යන්තරයට ඔබටම සාන්දිට්ඨිකව ඔබේ ආධ්‍යාත්මික දියුණුව සකස් කරගන්නව. ඒ තුළ ඔබේ නිවන් මග විර වෙනවා. එයයි යායුතු මාවත ලිපිනය. මේක ඔබ අභ්‍යන්තරයේ, ඔබටම තියෙන්න ඕන මේ පන්නරය. මේ විදර්ශනාව පොතක ලියන්න බෑ. මේක ග්‍රන්ථාරූඪ කළේ නියං සමයේ වෙන ක්‍රමයක් තිබුණෙ නැති නිසා. අපේ හාමුදුරුවෝ මේක දන්නව. මේක රහතන්වහන්සේලා දන්නව. මේක පොතක ලියන්න බෑ. තණ්හාව දැනෙන එකක් පොතක ලියන්න බෑ. දෙන්නක්ගෙ තණ්හාව සමාන නෑ. මේ නිවන දැනෙන එකක්. **නිවීම කියන එක මේ සත්‍යය අවබෝධයත් සමග එතන එතන, අර 'කෘත්‍ය ඥානය' කියන තැන දැනෙන ස්වභාවයකින් දියවී ගෙන යනව. ඒ දැනෙන ස්වභාවය නොදැනෙන ස්වභාවයක් කරා ගිහිල්ල නිවනට පත් වෙනව. ඒ 'කෘත ඥානය' බවට පත්වෙනව.**

මේක එන්නෙ අභ්‍යන්තර වෙනස්ව. ඔබ හිතන කතාව නෙමෙයි, සිතිවිලි නෙමෙයි ඔබේ මනසිකාර නෙවෙයි, ඔබට දැනෙන ස්වභාවයේ, ඒ 'ඥානය' හරහා. **ආර්යන් වහන්සේ කැලෑවල ඉඳගෙන කඳු මුදුන්වල ඉඳගෙන ආර්යන් වහන්සේට හමුවුණේ මෙන්න මේ රහසයි. ආර්යන්**

**වහන්සේට අභ්‍යන්තරයේ දැනෙන ගතිය, ඒ ස්වභාවය මෙහෙම කියන කොට ඔබට වැටහෙනව. 'අභිඥේඥා ඥාණයට' හසුවන පරම සත්‍ය කියල දේශනා කරන්නෙ මෙන්න මේ ධර්ම දේශනායි.** මේවා පොතක ඇත්තටම හම්බ වෙන්නෙ නෑ. මේ ස්කන්ධය වේගයක් කියන එක කවුරුවත් කියපු එකක් නෙවෙයි. මේ ක්ෂණයේ 'පටිච්චසමුප්පාදය' කිසි කෙනෙක් දේශනා කරල තිබුණෙ නෑ. මෙය අභ්‍යන්තරයේ ඥානයට හසුවන ධර්මයක් ආර්යන් වහන්සේ දේශනා කරන්නෙ. ඒ ධම්ම අභිඥේඥාවෙන් ධර්ම දේශනා කරනව කිව්වෙ ඒකයි. ආර්යන් වහන්සේ හැමදාම සෙව්වෙ මේ සත්‍යය කුමක්ද කියලයි. ආර්යන් වහන්සේ දන්නව සැඟවුණ සත්‍ය මොකක්ද කියල. ඒ ආර්යන් වහන්සේට දැනෙන ස්වභාවයක්. ඔබ ඒ මග යන්න.

ඔබේම අභ්‍යන්තරය ඔබට නොපෙනෙන ඔබ හිතන ඔය ක්‍රමයට නෙවෙයි වෙනත් විදියකට ඔබේ අභ්‍යන්තරයේ සත්‍යය මතුවෙනවා. ඒ තුළ ඔබට නිවන් මග විවර වෙනවා. එය ඔබේ සිහියට හසුවෙනවා. ඒ ආර්යන් වහන්සේ පෙන්වන ක්‍රමවේදය ඔබ මතුවන ආකාරයට තියෙන්නෙ. ඒ නුව ඔබටම 'එව බලව' කියන විදියට 'ඒහිපස්සිකෝ', 'ඕපනයිකෝ' කියන විදියට ඔබට මේ දහම හසු වෙනව. 'සාන්දිට්ඨික, ඒහිපස්සික, අකාලික, ඕපනයික, පච්චුප්පන්න ධර්මය' ඔබට අත්දකින්න ලැබෙනවා. මේක තමන්ට සාන්දිට්ඨික වන එකක්. මේක තමන්ගෙම අභ්‍යන්තරයෙන් මතුවන ස්වභාවයක්. ඒ ඥාණයට හසුවෙනවා කෙලෙස් සංසිඳෙන ආකාරය, එය සංසිඳීගෙන සංසිඳීගෙන නිවනට පත්වන ආකාරය.

තෙරුවන් සරණයි.

04

# සංඥා අභිසංකරණයක්ය මහණෙනි ජීවත්වීම

**ආර්යන් වහන්සේ: 'කමල් අඹ ගසට නගී' කියල පොතේ කියවන කොට, කමල් කියන කොට පුංචි දරුවාට ශබ්දයක් දීලා තියෙන්නේ. අඹ ගස කියනකොට ශබ්දයක් දීල තියෙන්නේ. නගිනවා කියන්නෙත් ශබ්දයක් දීල තියෙන්නේ. එතකොට කමල් අඹ ගහට නගී කියල පොත කියවන කොට කිසිම ශබ්දයක් පිටවෙන්නේ නැහැ නේද? පැහැදිලිද? එතකොට එතන ශබ්දයක් නොවෙයිද තියෙන්නේ. එහෙනම් ශබ්ද සංඥා වේ ශබ්ද නැහැ නේද? එහෙනම් ශබ්දයක් කියන්නේ සංඥාවක් කියන්නේ භෞතිකව එළියේ තියෙන දෙයක් නොවෙයි නේද? කරන්ට් එකක් නේද? එහෙනම් 'ස්පාර්ක්' එකක් කියල කියන්නේ ශබ්දයක් නොවේ.** ශබ්ද සංඥාවක ශබ්ද නෑ කිව්වේ ඒකයි. ශබ්ද සංඥාවක ශබ්ද නැහැ. වර්ණ සංඥාවේ වර්ණ නැහැ. එහෙනම් 'ගඳ - සුවඳ රස - පහස, කිසිම සංඥාවක ඔය ගඳසුවඳ රස පහස නැහැ. අපි හීනයක් දකිනවා, හීනෙ දකින්නෙ ඇස්දෙකෙන් නොවේ. හැබැයි හීනෙ වර්ණ සංඥා තියනවා. එතකොට එතන ඇස් දෙකෙන්ද බැලුවෙ, වර්ණ සංඥාවේ වර්ණ නැහැ නේද? එහෙනම් ස්පාර්ක් එකක් කියන්නේ කරන්ට් එකක් වගේ නේද?

දැන් ගෙදරට කරන්ට් එක ගත්තොත්, ඒ ගෙදර කරන්ට් එකෙන් ඔබට පුළුවන් ලයිට් දාගන්ඩ. රස්නය හදා ගන්ඩ, හීතල හදා ගන්ඩ. ඕන දෙයක් කරගන්ඩ පුළුවන් නේද කරන්ට් එකෙන්. කරන්ට් එක කියන්නේ, මේ අපි කියන 'ශබ්ද, වර්ණ, ගන්ධ, රස, පහසවල ස්පාර්ක් එකක් විතරයි. එකම කම්පනයකින් මේ සියල්ල සකස් වෙනවා කියල අපි කීවේ ඒකයි. කම්පනයක් විතරයි අපි කීවේ ඒකයි. රසයි නේද? සුවඳයි

නේද? ගඳයි නේද? ලස්සනයි නේද? කැතයි නේද, මේ හැමතැනම හොඳට දැනෙන කම්පනයක් ස්පාර්ක් එකක් **අපි හීන දැක්කෙ ඇස් දෙකෙන් නොවේ. අපි හීනෙන් කතා කළේ කටින් නොවේ. අපි හීනෙන් අහන් හිටියෙ, කනින් නොවේ. අපි හීනෙන් හීතල උණුසුම, තද ගතිය, පහස වින්දේ කයින් නොවේ; දැන් මේ කතාව කොයිතරම් සියුම්ද? මේ මොහොතේ ඔබට පේන්නේ දැනෙන්නේ දිවෙන් නාසයෙන් නොවේ. කම්පනයක් නොවේ. කරන්ට් එකක් වගේ දැනෙනවා. ඔබට දැනෙන දේට ශබ්දත් නෑ, වර්ණත් නෑ, ගන්ධත් නෑ. පහසත් නෑ. ඒ අනාගාමී භූමියයි**.

ලෝකයේ මේවා තියනවා කියලා හිතන තාක් කල් ඕලාරිකව ඔබ කියනවා කියන තැනක, ඔබ කම්පනය වෙනවා. අර සිරස, දෙරණ, හිරු වගේ. ලෝකෙ තියෙද්දි මට මැරෙන්ඩ බැහැ, දරුවො ඉන්දැද්දි මම කොහොමද යන්නෙ දරුවා දාලා, මේකයි ඔබේ කම්පනය. **මේක ඔබේ සිතුවිල්ලක්. සිතුවිල්ලක බලගැන්වුණ ඔබේම 'ෆ්‍රීකොන්ස්' එකක්. ඔබ මොහොතක් මොහොතක් ගාණෙ නිර්මාණය වෙනව, හරියට 'සිරස, දෙරණ, බලනවා වගේ ඔබේ දිහා ඔබ බලන් ඉන්නවා.** ඔබ 'සිරස' මාරු කරල 'දෙරණ' බලනවා වගේ, ඔබේම අභ්‍යන්තරයේ ආකල්ප වෙනස් වෙනකොට ඒ කතාව වෙනස් වෙනවා. ඔබ සමහරවිට ඉස්සර කැමති වුණේ එක දේකට. පුංචි කාලේ ඔබ බෝනික්කන්ට කැමැතියි, ලොකු උනහම ඔබ ඒ දිහා බලන්නෙත් නැහැ. ඊට පස්සෙ ඔබ විභාගවලට කැමැති වෙනව. ශිෂ්‍යත්ව, ඕ-ලෙවල්, ඒ ලෙවල් කරනව. ඊට පස්සෙ ඒ දිහා බලන්නෙත් නෑ, ගෑනු ළමයෙක් ගැන හිතනවා. පිරිමි ළමයෙක් ගැන හිතනවා. පුංචි කාලෙ අම්මා ගැන ආදරයෙන් බලපු පුතා, අන්තිමට කසාද බැඳල අම්ම දිහා බලන්නෙ නැතිව නෝන ගැන හිතනවා.

ඒ මොකක්ද වෙන්නෙ, මේ කතාව 'සිරස, දෙරණ' වගේ ඔබේම කම්පනය වෙනස් වෙන ආකාරය. මේ අනුව තමයි ඔබ මනුස්ස ලෝකේ උපදින්නෙ. 'කර්මඵල' ස්වභාවය සකස් උනාම, ඔබේ රාග, මෝහ, ස්වභාවය වෙනස් වෙනව. ඔබට තිරිසන් ස්වභාවයක් තියනව. අර සිරස, දෙරණ මාරුවෙලා චැනල් අහුඋනා වගේ. තිරිසන් සතෙකුගේ විඥ්ඤාණ උපතක් සකස් වෙනව, මේ ඔබේ 'සසර ඕඝයයි' මේ 'ටෙලිපති සිස්ටම්' එකයි. මෙයයි සමතන්තරය' කියල අපි කතා කළේ, මේ සත්ත්වයාගේ

භවගාමී ස්වභාවයයි. හිතන්න පුළුවන්ද මේක කොයිතරම් ගැඹුරුද, ඔබට ඔබේ අභ්‍යන්තරය දැනෙන්නෙ නැහැනෙ. ඈත තියෙන කඳු වළලු. අහස පේනවා පුදුමාකාර විදියට. ආර්යන් වහන්සේ හරියට අහස වගේ, මේ ස්ථානයට යටින් වලාකුළු යනව වගේ පේනවා. සමාන මට්ටමින් වලාකුළු එනවා පේනවා. ඊට උඩින් තියෙන වලාකුළුත් පේනවා. මේ ස්ථානයට මුළු අහසම එකම රවුමක් වගේ පේනවා පුදුමාකාර ස්වභාවයක් දකින්නට ලැබෙනවා.

නොපෙනෙන තරම් ඈතට කුරුල්ලෝ පියාඹායනවා, මේ කුරුල්ලන් රොකට් වගේ උඩ යනවා. ආයෙ ගිහිල්ලා වහන්ඩවත් තැනක් නැහැ. හැබැයි මේ කුරුල්ලෝ පියාසර කරන ආකාරය බලන කොට කුරුල්ලන්ට අනාගතය ගැන කතාවක් නෑ, හිටියත් එකයි, නැතත් එකයි. කුරුල්ලාට ඒ මොහොත විතරයි දැනෙන්නේ. හරියට මේ කුරුල්ලන්ට දැනෙන ස්වභාවය ඇස්පිල්ලන් ගහනවා වගේ ස්වභාවයක්. මේ කුරුල්ලෝ මනුස්සයා වගේ මෙච්චර හිතන එකක් නැහැ. එවෙලෙම දැනුණ දේ කලා ඉවරයි වගේ දැනෙනවා. ඊත් මනුස්සයාට ප්‍රශ්න වැඩියි. ඊත් හුඟක් දියුණුයි. ඊත් මනුස්සයා තරම් සත්තු දුක්විඳින්නේත් නැහැ කියලයි අපට තේරෙන්නේ. මනුස්සයාට මෙවැනි 'චිත්ත ස්වභාවයක් පහළ උනේ ස්වභාවදහමේ න්‍යායක් නිසා මනුස්සයාට ඉත්ථභාවය' රැකගන්ඩ. ස්වභාවදහමින් සකස් වුණ ස්වභාවයක් තමයි මේ නිවන කියන එක. නමුත් අද ඒක භාවිත වෙනව වැරදි ආකාරයකට. මනුස්සයා 'රාග, ද්වේෂ, මෝහ' කෙලෙස්වල අතරමංවෙලා ඉන්නෙ, සත්තුන්ට තියෙන සැනසීමවත් අද මනුස්සයාට නැහැ.

මේ රහතන්වහන්සේලා වැඩ සිටි මේ භූමිය දිහා බලන කොට, මේ ස්ථානයට වෙලා නිකං වාඩිවෙලා හිටියත් සමාධිය වගේ දැනෙනවා. ඇත්තටම මෙතන සිත වැඩ කරන්නේ නැහැ කිව්වොත් එය නිවැරදියි; හිත නැතුව නොවෙයි හිත වෙනදා විදියටම තියනවා, හැබැයි ඒ හිත හරිම සැහැල්ලුයි, සුකුම ස්වභාවයක්, කිසිම වෙහෙසක් නැහැ. පුදුම නිස්කලංක බවක් තියෙනවා. අවුරුදු දහස් ගණනක් පැරණි ගල්ලෙන් අටක් එහෙමම තියෙනවා. අපි ඔබට කිව්වොත් බුද්ධෝත්පාද ආර්යන් වහන්සේ අන්න අර ලෙනේ සිටිනවා කිව්වොත් ඔබ එන්ඩ සතුටුද?

මෙවැනි දෙයක් තමයි ඉදිරියේදී සිද්ධවෙන්නේ. මේ 'බුද්ධ ස්වභාවයට' ඔබටත් අවදි වෙන්ඩ පුළුවන්, කෙනෙක් පුද්ගලයෙක් හදන්න නොවේ. බුද්ධෝත්පාද ආර්යන් වහන්සේ කියල කෙනෙක් නැහැ. ආර්ය භූමියේ සත්ව පුද්ගල ස්වභාවයක් නැහැ. මේ සුළඟ මේ අහස ගස්කොළන්වල අතු සෙලවෙන ආකාරය එතන එතන සිද්ධියක් විතරයි. සත්ව පුද්ගල කතාවක් නැහැ. අපි කියනව 'විඤ්ඤාණය අනිදස්සනං' කියල.

'විඤ්ඤාණ අනිදස්සනං - අනන්තං සබ්බතෝපහං'
එත්ථ අපොච පඨවිච - තේජෝ වායො න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච - අණුං ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච - අසෙසං උපරුජ්ජඣති
විඤ්ඤාණස්ස නිරෝධන - එතෙථතං උපරුජ්ජඣති'

අනන්තය දක්වා මේ විඤ්ඤාණයට බැසගන්න තැනක් නැහැ, අතනද මෙතනද කොතනද හිත පතිතවෙලා තියෙන්නෙ. හැමදේකින්ම මිදුණා නම්, ඔය හිත කොහෙවත් පතිතවෙන්නෙ නැහැ නේද? **ඔබ කොහේවත් හිරවෙලා නැහැ නේද? දැනෙනවාද මේ අනන්තය දක්වා යන එකම ස්වභාවය 'මහා මෛත්‍රිය' මොකක්ද කියල. ඒ ස්වභාවයයි 'අප්ප්‍රමාන චේතෝ විමුක්තිය' කියන්නෙ. ඒ කියන්නෙ ඔය ශබ්දයකවත් වර්ණයකවත් ගන්ධයකවත් කිසිම දෙයක් ඔබට හමුවෙන්නේ නැති බව ඔබට අවබෝධ උන දවසට, එය අභ්‍යන්තරයෙන්ම ප්‍රත්‍යක්ෂ උන දවසට ඔබට කිසිම 'සැකසංකා' 'විචිකිච්ඡා' නැති කතාවක් හමුවෙයි.** සිතිවිල්ලකවත් දෙයක් නැති බව ඔබට වැටහෙයි. මේ ආයතනවල ශබ්ද ලෝකය, ගන්ධ ලෝකය, වර්ණ ලෝකය, රස ලෝකය, පහස කොහෙවත් නැති බව හොඳට අවබෝධ වෙයි. පාවෙනවා වගේ හරිම සැහැල්ලුවක් දැනේ.

මේ සතාට ඕනෙ කෑම ටිකක් විතරයි. කෑම ටික ගත්තට පස්සෙ ඒ සතාට වෙන මොනවත් අවශ්‍ය නැහැ. සුළඟ වගේ හරි සැහැල්ලුවෙන් ඉන්නෙ. මනුස්සයා පුදුම දුකක ඉන්නෙ. මේ කෑම ටිකක් කාල තවත් කෑම හොයනවා. තව කෑම හංගලත් තියනවා, තව කෑම රැස් කරනවා. **මනුස්සයාට සැප තියනවා, තියෙන සැපයක් දැනෙන්නේ නැහැ. හීන**

**බල බල හීන ඇතුළෙ දුක් විඳල මැරිල යනවා.** නුවණින් මේ සත්‍ය දැකල මිදෙන්නෙ බොහොම ටික දෙනයි, නියපොත්තට ගත් පස් ටික වගේ. ඒක බුදුන්වහන්සේගේම උපමාවක්.

**මිනිස් පුළුටක් නැති දිවි වලසුන් ගැවසෙන මහා ඝන වනාන්තරයක් මේ ගස්කොළන්වල ගල්ලෙන්වල සුන්දරත්වය දැක්කේ එදා වැඩ සිටි රහතන් වහන්සේලා, 'කාය විවේකය' 'චිත්ත විවේකයට' හේතු වෙනවා. සිතේ කයේ 'සුඛුම ස්වභාවය' 'චේතෝ විමුක්තියට' ළංවෙනවා.** ඒ නිසා තමයි වන අරණක තියන සුන්දරත්වය ගැන බුදුන් වහන්සේ දේශනා කළේ. බුදුන් වහන්සේ අන්ද වනයට වඩිනවා භික්ෂූන් වහන්සේලාගේ වාද විවාද නිසා.

තෙරුවන් සරණයි සියලු දෙනාට.

# 05

# ධර්මයේ සිසිලස ඔබමය

**උපාසිකාවඃ** ආර්යන් වහන්ස, ගොඩක් වෙලාවට අපි මේ ගිහි ජීවිතේ ගත කරන්නෙ රැකියාවක් කරනව, නමුත් ගින්නක් වගේ දැනෙනව හැම වෙලාවෙම. මේ සියුම් ධර්ම කරුණුවලින් අපි නිවී සැනසීමට පත්වෙනවා. අසනීපයක් ආවත්, ගෙදරදී දරුවොත් එක්ක ඉන්න කොටත්, පෘථග්ජන භාවයෙන් ඇතිවන සිතිවිලිත්, ඒවා ඔක්කොම නිවී සැනසී ගිහිල්ලා පුදුම සැනසීමක් ලැබෙනවා. ඒක නම් ඇත්තටම ආර්යන් වහන්ස, මේ බුදු කෙනෙක් පහළ වෙලා ඉන්නවා වගේ කියල හැඟීමක් එනව සමහර වෙලාවට. 'සූම්' දේශනාවල සියුම් කාරණා උපමාවලින් දක්වන ඒවා ඒ කරුණු හරිම ආශ්චර්යයි. ඒ දේශනා ප්‍රාතිහාර්ය ගැන ඇත්තටම හිතාග න්නවත් බැහැ.

මේ වගේ මුනිවරයෙක් පහළ උනේ ඇත්තටම මොනවහරි ලොකු භාග්‍යයක්මයි මට හිතෙනවා මේ දේශනා අහන්න ලැබෙන එකම. මුළු ජීවිතයම කැප කරල මේ දේශනා අහනවා. මේ දේශනා ධාරණය උනාට පස්සෙ හැම වෙලාවෙම ක්‍රියාවක් කරන කොට පුංචි දේකින් හරි හිතේ දැවීමක් හරි සතුටක් හරි එන වෙලාවට මමය මතුවෙනව අත්දකිනවා. මම ඊයේ පෙරේදා දවසක රාජකාරි වෙලාවෙදි මට අසනීප තත්ත්වයක් ඇති උනා. ඒ හැම අවස්ථාවේදීම මට මමය මතුවෙන හැටි දැනුණා. ඒ වගේම ජීවිතයේ ගොඩක් දේවල් වෙනස් වෙලා ආහාර ගැනීම පවා අඩුවෙලා දවසකට එක පාරක් වගේ ආහාර ගත් අවස්ථා තිබුණා. පෙරදී හොඳින් පිනව පිනවා තිබූ ආයතන ඔක්කොම වෙනස් උනා. ඒත් දරුවන්ට වෙනසක් කරන්නේ නැහැ. නමුත් අපේ ආයතන සෑහෙන දුරකට පාලනය වෙලා පුදුම ගමනක් ගිහින් තියෙන්නෙ. ආර්යන් වහන්ස, මේක හරිම ආශ්චර්යයි.

**ආර්යන් වහන්සේ:** ඇත්තටම හරි පුදුමයි. හරි වාසනාවන්තයි. ඇත්තටම අපේ මුළු සමාජයම හිතන් හිටියෙ මේ භවයේ නිවන් දකින්ඩ බැහැ කියල නේද? අපි දශක ගාණක් පුදුමාකාර කතාවක් ඇහුවා. පතනා බෝධිය ගැන කිව්වා. මේ ආත්මයේ නිවන් දකින්ඩ බැහැ කිව්ව. පාරමිතා මදි කියල කිව්වා. පින් දහම් කරන්න කිව්වා. පාරමිතා පුරන්න කිව්වා, මෛත්‍රී බුදුන් පහළ වෙනකම් බලන්න කිව්වා. දශක ගණනක් මේව අහගෙන පහුකරල ඇවිත් තියෙන්නෙ. දෘෂ්ටි ගොඩක හිරවෙලා කර්මය කියල මිනිස්සු කර්මය කරේ තියාන කොයිතරම් දුක්විඳිනවාද කියලද ඔබ හිතන්නෙ? ඇයි මනුස්සයාට හේතුඵල දහම දේශනා කරන්නෙ නැත්තෙ. ඇත්තටම අපේ හාමුදුරුවරුන් කර්මය දේශනා කරනවා. කර්මය දේශනා කරාට වරදක් නැහැ. බුදුන් වහන්සේ දේශනා කරපු හේතුඵල දහම අපි දැනගන්ඩ ඕන. මේ මනුස්සයා දුකෙන්නේ. ඒකනෙ පටිච්චසමුප්පාද ධර්මය ගැන අවබෝධයක් නැතිකමයි මීට හේතුව.

බුදුන් වහන්සේ ලෝකයට හෙළි කළේ කුමක්ද? බුදුන් වහන්සේ දේශනා කළේ කර්ම භූමියද? අර අස්සජී මහ රහතන් වහන්සේ හඳුන්වපු විදිහ ඒකයි අපි කියන්නේ. සැරියුත් හිමියන් ගිහි කල 'උපතිස්ස පරිබ්‍රාජකයා විදියට, අස්සජී මහ රහතන්වහන්සේගෙන් අහනව 'ස්වාමීනී, මට ධර්මය දේශනා කරන්න. මම ධර්මය දේශනා කරන්ඩ වැඩිය දන්නේ නැහැ. හැබැයි තථාගතයන් වහන්සේ හොඳින් දන්නව. උන්වහන්සේ දේශනා කරන්නේ හේතුඵල දහමයි. 'යේධම්මා හේතුප්පභවා තේසං හේතුං තථාගතො ආහ', ඒ තථාගතයන් වහන්සේ දේශනා කරන්නේ හේතුඵල දහමයි. ඒක කියන්ඩ බැරිඋනේ අපේම තියන දෘෂ්ටි නිසා. අපේම පොත්වල අපේම පොත් ලියා ගන්නවා කර්මඵලය. ඒක තමයි අර බුදුන් වහනසේ කියන කතාව. අනාගතයේ භික්ෂූන් වහන්සේලා ධර්මය කියල ධර්මය වගේ එකක් හදාගන අධර්මය දේශනා කළොත් ඔබ කොහොමද ධර්මය හොයා ගන්නේ? ආර්යන් වහනසේ ලෑස්තියි හේතුඵල දහම වෙනුවෙන් පෙනී සිටින්නට. ඒ නිසා දේශනා දහස් ගණනක් දානව. සූත්‍ර පිටකය අකුරෙන් අකුර කියනව, සූත්‍ර පිටකයේ බුදුන්වහන්සේ දේශනා කළ හේතුඵල දහම කුමක්ද කියලා. මේක ඇස් ඇත්තෝ දකිත්වා කිව්වා වගේ පුදුම කතාවක්. ඇත්තටම කිව්වොත් යකඩ මළකඩ කාලා යකඩය නැසෙන්නා සේ බුදුන්වහන්සේ 'ආණී සූත්‍රවල' 'අනාගත භය' සූත්‍රවල දේශන කරල තියෙනවා මේ ගෞතම බුද්ධ ශාසනය විනාශ වෙන්නේ

කවුරුත් නිසා නොවේ කුරුස දාගත්ත අය නිසාවත් තොප්පි දාගත්ත අය නිසාවත් නොවේ, මේ ගෞතම බුද්ධ ශාසනය විනාශ කරන්නේ සංඝයා වහන්සේලා ධර්මය විදියට අධර්මය දේශනා කිරීම නිසා. ඔවුන් දන්නේ නැහැ ධර්මය මොකක්ද කියලා. ඔවුන් ධර්මය කියල හිතාගන්ඩ බැරි දෙයක් දේශනා කරනව. හැබැයි ඒක බලන කොට අධර්මේ. එදාට කොහොමද ධර්මය හොයා ගන්නේ. මෙතෙක් ඉපදුණ හැම දරුවෙක්ම කර්ම භූමියෙන් එහා දෙයක් කතා කරන්ඩ දන්නේ නැහැ.

අද වැඩිහිටියො මොනවද කියන්නෙ. කර්මයෙන් එහා දෙයක් දන්නෙ නැහැ. හේතුඵල දහමක් දන්නෙ නැහැ. පින් දහම් කරන්න භාවනා කරන්න ඔන්න ඔහොම දෙයක් තියනව. එච්චරයි දන්නෙ, වෙන මුකුත් දන්නෙ නැහැ. **අපි තවම ජීවමානව ඔබට මේ දහම දේශනා කරනව. ඔබට පුළුවන් සාකච්ඡා කරන්න. අපි දන්නවා මේ ධර්මය තුළ අපි පැහැදිලි කරන කාරණා ලේසි නැහැ තේරුම් ගන්නට. එය ඉතාම ගාම්භීරයි. අවුරුදු තිහක් සමථය වඩල වනාන්තරවල කඳු මුදුන්වල රෑ එළිවෙනකම් පහන් කරමින් ඒ අරූප ධ්‍යානවලට වෙලා ඉඳලා අවසානයේ බුද්ධ වචනයට අනුගතව සත්‍ය විමර්ශනය කළා.** ඒ සත්‍ය අවබෝධ කිරීම ලේසි නැහැ. මේ කියන වචනයක් වචනයක් ගාණෙ ඔබට දැනේවි. අද මේ කතා කරන්නේ එවැනිම ස්ථානයක සිටයි.

දිවයිනේ තියන විශාලම ලෙන්කුටියේ ඒ පර්වතයේ, මේ රහතන් වහන්සේලා වැඩ සිටි ලෙනක්. මේ ලෙන ඔබට සාක්ෂි දරයි ආර්යන් වහන්සේ කොයිතරම් නම් කාලයක් මේ ලෙනට වෙලා කටයුතු කළාද? ධර්මය මෙනෙහි කළාද? ඔබට මේ සත්‍යය නිකම්ම අවදි උනා නොවෙයි. ඔබට මේ සත්‍යය පොතකින් ආවා නොවෙයි. මේ ආර්යන් වහන්සේගේ අභ්‍යන්තරයෙන් පැන නැගුණ සත්‍යය මේ යුගයේ මහා මුතු වැස්සක් වගේ කාන්තාරයට සිසිල් දිය බිඳක් වගේ අන්ධකාරයේ මිත්‍යා දෘෂ්ටිවල සසර දුකට වැටිල හිටපු මේ මනුස්ස වර්ගයාට සැනසුම් සුසුමක් ලබාදීමට. මේක පුදුම කතාවක්. ඒත් ඇත්ත කතාවක්. හොඳයි හැම කෙනෙකුටම ආයෙමත් දවසක ඒ උතුම් මුතුකැට පිනි පොද, ඒ සිසිල් පහස ධර්මයේ සිසලස ලබන්න අවස්ථාවක් ලැබෙයි.

හැමෝටම තෙරුවන් සරණයි.

# 06

# අනුත්තර ස්වභාවයි නිවනේ අත්දැකීම

**උපාසක :** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස, ඔබවහන්සේ පුද්ගලයෙක් විදිහට නෙමෙයි ආර්යන් වහන්සේ දේශනා කරන දහම තුළින් ආර්යයන් වහන්සේ සමග පිළිසඳරක යෙදෙනවා වගේ තමයි මට යම් යම් අවස්ථාවලදී දැනෙන්නේ. උදාහරණයක් විදිහට ගත්තොත් යම්කිසි ගැටලුවක් මතුවුණාහම බැස ගැනීමක් වගේ වුණාහම ආර්යයන් වහන්සේගෙන් මම අහනවා, මා තුළ සිටින ආර්යයන් වහන්සේ ඒක ඔබටම සාන්දිට්ඨිකයි ඕකයි කියන්නේ. ඔබවහන්සේ දේශනා කරපුවයින් අහල. ඒක මනසිකාරයක්ද කලින් පැහැදිලි කළා වගේ දැනෙන තමන්ගෙම මනස තමන්ගේ මායාව ප්‍රකාශ කිරීමක්ද එහෙම තත්ත්වයක් තමයි මට පැහැදිලි කරගන්න ඕන.

**ආර්යයන් වහන්සේ :** ඒ කියන්නේ ආර්යන් වහන්සේ එක්ක සාකච්ඡා කරනවා වගේ කියන ස්වභාවයක්ද මනසිකාරයක්ද කියලා අහන්නේ.

**උපාසක :** ඔව් ඔව්. ඒක එහෙම නෙමෙයි කියලත් දැනෙනවා. ඒකත් මනසිකාරයක් තමයි. අර කලින් තිබුණ තත්ත්වයක් මනසිකාරයක් වගේ. දහම තුළම ඉන්න ගතියක් තියෙනවා. කොළ හෙළවෙන එකක් දැක්කත් ළමයෙක් වැටෙන එකක් දැක්කත් ඒකේ කිසි දෙයක් දැනෙන්නේ නැහැ. ඉතින් මේකේ කලින් මාතාව කිව්වා වගේ මේක සෙන්සස්වලට දැනිලා එන එකක්, මේක දහම තමයි මේක කියල වැටහුණේ.

**ආර්යයන් වහන්සේ :** ඔතන ස්වභාව කිහිපයක් තියෙනවා. ඒ කියන්නේ දැන් ඔය ආත්ම ස්වභාවය තියෙනවානේ. ඔබතුමාට කොහොමද දැනෙන්නේ. ඔබතුමාගේ ආත්ම ස්වභාවය.

**උපාසක :** ආත්මය තියෙනවා වගේ දැනෙනවා.

**ආර්යයන් වහන්සේ :** කටයුතු කරන කොට කතා කරන කොට, එදිනෙදා වැඩ කරන කොට අභ්‍යන්තරය තමන්ව තමන් හසුරවනවද සිහියට.

**උපාසක :** අන්න එතන මම හිටියා කියලා ටක් ගාලා අසුවෙනවා.

**ආර්යයන් වහන්සේ :** ආර්යයන් වහන්සේ සූම් සාකච්ඡාවල ඔය ස්වභාවය කෙන කෙනා කතා කරන කොට ඒ ස්වභාවය වැටි කරනවා වගේ අහුවෙනවා නේද?

**උපාසක :** ඒ කියන්නේ කෙළින්ම කියනවා ඔන්න ඔය යන්නේ ආත්මයට කියලා ආර්යන් වහන්සේ කියනවා.

**ආර්යයන් වහන්සේ :** ආර්යයන් වහන්සේ කියන කොටම තමන්ටත් දැනෙනවා. දැන් කියන්න කලින්ම දැනෙනවා. ආර්යයන් වහන්සේ දැන් මේක මෙයාගේ මාන්නය ස්වභාවයක් තියෙන්නේ. මෙතන මේ ආත්ම ස්වභාවයක් තියෙන්නේ. මෙතන මේ ආත්මයක් තියෙන්නේ. දැන් ආර්යයන් වහන්සේ මේක කියයි කියල ඒක දැනෙනවා නේද?

**උපාසක:** ඔය සමහර වෙලාවට සමහර අය අහන ප්‍රශ්නවලදී මේ ආර්යන් වහන්සේ කියන්න කලින් මට දැනෙනවා ආර්යයන් වහන්සේ කියනවා කියලා.

**ආර්යයන් වහන්සේ :** ඒක දැනෙනවා නේද? ඒක ඔතන දකින්නේ. ඕක සිහියට අසුවෙනවා, ඕක සිහියට අසුවෙනවා කියන කොට ඕක නුවණට අසු වෙනවා මෙයා මේ පෙන්වන්නේ මේ ආත්ම ස්වභාවය කියවලා. එයාට තේරෙන්නේ නෑ විඤ්ඤාණ මායාවෙන් ඉන්නේ කියලා, තමන්ටත් ඒක සිහියට හසුවෙනවා. දැන් ඔබතුමාට වගේම දැන් මේ සූම් දේශනාවලට පවා සම්බන්ධ වෙලා ඉන්න ඔබතුමාගේ ස්වභාවය වගේම, මේ දේශනා ගැන හොඳ අවබෝධයක් තියෙන, ධර්මය ගැන හොඳ අවබෝධයක් තියෙන, ඒ තුළ ආත්ම ස්වභාවය ගැන ආර්යයන් වහන්සේ පෙන්නපු කාරණා නුවණින් දැකලා මෙනෙහි කරලා ඒක තමන්ට, විශ්වාසයක් ඇදහිල්ලක් නෙමෙයි, තමන්ටත් ඒක ප්‍රත්‍යක්ෂ

වෙලා තමන්ටත් දැනෙනවා මේ ආත්ම ස්වභාවය කියලා. එතකොට තමන්ගේ ආත්ම ස්වභාවය දැනෙනවා. අනිත් අයගේ ආත්ම ස්වභාවයන් දැනෙනවා.

**උපාසක :** දැනෙනවා. එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** දෙපැත්තම දැනෙනවා. ඕක තුළ දියවීගෙන යනවා. හැබැයි තමන්ට කරන්න බෑ. තමන්ට ආත්ම ස්වභාවය නැති කරන්න බෑ, හැබැයි ටික ටික දියවී ගෙන යනවා දැනෙනවා. ඒක තමයි ආසවඛ්‍යයා ඥානය දැන් ඕක හරි. යන විදිහ හරි. ඕක හසුවෙන්න ඕනේ. හසුනැතිකමයි තියෙන්නේ ගොඩක් අයට. ගොඩක් අයට ඕක හසුවෙලා නෑ. දැන් ඔබතුමා කියන දේ හරි. ඔබතුමා හඳුනාගෙන තියෙන්නේ ඕක සිහියටයි හසුවෙන්නේ. ඕක හිතන එකක් නෙමෙයි. ඕක අසුවෙනවා කියන කොටම අර නුවණට අසුකරගෙන මේ ධර්මයට ගැළපෙනවා. ධර්මයට විනයට ගැළපෙනවා කියන්නේ ඕක තමයි. දැන් බුදුන් වහන්සේ කියනවානේ ඇහුවත් පිළිගන්න එපා. දැක්කත් පිළිගන්න එපා. කිව්වත් පිළිගන්න එපා. පොතේ තිබ්බත් පිළිගන්න එපා. කාලාම සූත්‍රයේ තියෙනවානේ.'කාලාමවරුන්ට' දේශනා කරනවානේ.

හැබැයි ඊට පස්සේ බුදුන් වහන්සේ ක්‍රමයක් දේශනා කරනවා නේ. බුදුන් වහන්සේ කියනවා ධර්මයට විනයට ගළපලා බලන්න, ධර්ම කියන්නේ 'පටිච්ච සමුප්පාද - ධම්මේසු ධම්මං'. පටිච්ච සමුප්පාද ධර්මය කියන්නේ ඉදපච්චතාවය.

ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්මිං අසති ඉදං නහෝති
ඉමස්සා උප්පජ්ජා ඉදං උප්පජ්ජති - ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ජති

මොකක්ද මේ කියන්නේ. **මෙය ඇති කල්හි මෙය වේ කියන්නේ, ආයතනවල නිරූපණයෙන් ආත්මයක දෙයක් තියෙන්නේ. ආයතන තිබ්බොත් දෙයක් තියෙනවා. එහෙනම් ස්පාර්ක් එකක් තිබ්බොත් දෙයක් වගේ දැනෙන ගතියකුත් තියෙනවා. මෙය නැති කල්හි මෙය නොවේ. එහෙම දෙයක් නැත්නම් එහෙම දේකුත් නෑ.**

ඒ කියන්නේ දැන් අපිට ඇහැට, කනට, දිවට, නාසයට, කයට, මනට මේක මේ මැවෙන හැටි දැක්කොත් එයාට, එහෙම දෙයක් නැති බව දැනෙනවා. ඒක මායාව හැදෙන හැටි දකිනවා, දකිනකොට ඒකේ නිරූපණය මායාවක් කියන එක එයා දකිනවා. එහෙම දෙයක් දැක්කොත් එයාට ආත්ම ස්වභාවය ඒකම බව දැනෙනවා. එහෙම ප්‍රත්‍යකුත් නැති බව දැනෙනවා. ඕක තමයි ධර්මය දකින එක, නුවණින් දකින ආකාරය 'පටිච්ච සමුප්පාදය' ධර්ම දකිනවා කියලනේ. දෙයක් නැති බව අසුවෙන්නේ අන්න එතකොටයි. දෙයක් නැත්නම් දෙයක් හම්බ වෙන්නේ නෑ. මේකේ ශබ්දයවත්, වර්ණයක්වත්, ඔක්කොම එකතු වෙන දෙයක්වත් හම්බ වෙන්නේ නෑ. ඒ කියන්නේ එතන ආත්මයකුත් හම්බ වෙන්නේ නෑ. දෙයක් කියලා ගත්තොත් ඒකමයි ආත්මය, ඒකට තියෙන කම්පනයමයි ආත්ම කම්පනය. ආත්ම කම්පනය කොහොමද තියෙන්නේ. අපිට පුරුද්දට අනුසෝතය තුළ දීර්ඝ කාලයක් අවිද්‍යා භූමියේ ආත්මය හසුරෝගෙන, දුකට වැටිච්ච කෙනෙක් තමයි දුකින් මිදෙන්න හොයන්නේ. එයාට දැන් සිද්ධ වෙන්නේ මොකක්ද? හදා ගත්ත ආත්මය දියවෙන හැටි බලන් ඉන්න එක.

හදාගත්ත ආත්මය එයා කරපු දේකුත් නෙමෙයි, ඒක සිස්ටම් එකෙන්මයි ඇවිල්ලා තියෙන්නේ. ඒක තමයි ආරෝපණය වෙන හැටි, ආරෝපණය වෙච්ච දියවෙන හැටි. දැන් දියවෙන හැටි සිහියට අහුවෙනවා. දැන් ඕකේ සිහිය ගැනත් අපි කතාවක් කිව්වා. **කම්පනයෙන්, කම්පනය නොවන ස්වභාවය අසුවන්නේ බලනකොට. සිහියත් ඒක ඇතුළෙම කතාවක් තියෙන්නේ. කම්පනයක් නැතුව, කම්පනයක් නොවන ස්වභාවය අල්ලන්න බෑ. ඒ කියන්නේ සිහිය කියන එකත්, කම්පනය නිසයි සිහියක් තියෙන්නේ.** ඒකයි කිව්වේ සිහිය හිතුණ එකක් නෙමෙයි. කම්පනයට හැම තිස්සෙම කම්පනය නොවන ස්වභාවය අසුවෙනවා. ඒකයි සිහිය කියන්නේ. සිහියක් නැතුව සිතුවිල්ලක් නෑ. දෙයක් තියෙනවා නම් සිහියකුත් තියෙනවා.

පුදුම දහමක් නේද? එකම රුපියලේ පැත්ත දෙපැත්ත මාරු වෙනවා වගේ වැඩක්. පුදුම දහමක් කියන්නේ, දැන් ආත්මයක් තියා සිහිය කියල දේකුත් නෑ මේකේ. ඒ කියන්නේ දෙයක් නැතිවෙන කොට

සිහිය කියල දේකුත් නැතිවෙනවා මේකේ අවසානයේදී. දැන් නිවන මොකක්ද? නිවන් අහුවෙන්නේ සිහියටද? නෑ මේකේ අවසානය තව ආර්යන් වහන්සේ කිව්වේ නෑ. අවසාන කතාව තාම කිව්වෙත් නෑ. කිව්වොත් කිව්ව දේ තේරුණේ නැහැ කියලා ආර්යන් වහන්සේ දන්නවා. මේකේ අවසානය අසුවෙන්නේ සිහියට නෙමෙයි, ඒකයි කිව්වේ වෙනස්ම අවධියක් මතුවෙනවා කියලා. ඒක සිහිය නෙමෙයි. ඒක අසුවෙන්නේ සිහියට නෙමෙයි, ඒකයි කිව්වේ අධිගත සමාධියක්' උපදිනවා කියලා. ඒ 'අධිගත සමාධිය' තමයි ගොඩක් අයට තේරෙන්නේ නැත්තේ.

මේක අවසානයේ අද නොකියා ඉන්න උත්සාහ කරනව. මේක අවසානයේ අසුවෙන්නේ සිහියට නෙමෙයි නම් අපි පොදුවේ හැමෝගෙ න්ම ඇහුවොත් ඔය ප්‍රශ්නය මේකේ අවසානය මොකක්ද කියලා, දැන් ඔය සූම් එකට සම්බන්ධ වෙලා ඉන්න හැමෝගෙන්ම ඇහුවොත් කොහොමත් උත්තර දෙන්න බැරි වෙනවා. අපි ඔබෙන් අහනවා මේකේ අවසානය අහුවෙන්නේ ඇත්තටම සිහියද? එහෙම නැත්නම් ආර්යන් වහන්සේ කියන්නේ මොකක්ද? තමන්ට දැනෙන විදිහට කියන්න බලන්න. මේකේ අවසානය මොකක්ද? ඒ අවසානය කොහොමද යායුතු මාවත ලිපිනය අපි දැනගෙන යන්න ඕන නේ. මෙතෙක් අහපු හැම ප්‍රශ්නයකදීම බොළඳ විදිහට ගන්න එපා.

'ප්‍රඥාවන්තං ආයං ධම්මං - ඥායං ධම්මං දුප්පඥ්ඥස්ස' කියන්නේ මේක දැනුමක් නෙමෙයි. ප්‍රඥාව කියන්නේ දැනුමක් නෙවෙයි. දැනුම කියන එක නෙමෙයි, විස්ඩම් කියන්නේ. ප්‍රඥාව ගැන අපි කිව්වේ. විඤ්ඤාණ මායාවට නොරැවටෙන එක බුදුන් වහන්සේ එය විග්‍රහ කරේ.

'ප්‍රඥා භාවේ තබ්භං - විඤ්ඤාණං පරිඤ්ඤෙයයං' කියලා. විඤ්ඤාණ මායාවේ සත්‍ය දකින එකයි ප්‍රඥාව කියන්නේ. තව පැත්තකින් කිව්වොත් විඤ්ඤාණ මායාවට නොරැවටෙන තැනයි ප්‍රඥාව කියන්නේ.

මේ යුගයේ මේ නිවන් මග යන යෝගාවචරයිනට මේ බුද්ධෝත්පාද දේශනා පුදුමාකාර දායාදයක්. ඇත්තටම මේ දේශනා අධ්‍යයනය කරන ගොඩක් අයට වැටහෙනවා හැම කෙනෙක්ම කොහේ හරි අතරමං වෙලා සිටිය බව. මේ දේශනා ඇසීමෙන් පසු ඒ අතරමං වුණු තැනින් ගොඩ ආ

බව. ඒක නොරහසක්. ඒක හැමෝටම අත්දකින්න ලැබෙනවා. මේ බුද්ධ වචනයයි. මේ බුද්ධ වචනයට පිටුපාන්න කිසි කෙනෙකුට බෑ. මොකද ඔවුන් යන්නේ ඒ මග. ඒ පණිවුඩය පොතක නෑ. ඒ පණිවුඩය විදර්ශනාව තුළයි තියෙන්නේ. ග්‍රන්ථ ධුරයේ ඒක හම්බවෙන්නේ නෑ. නමුත් ග්‍රන්ථ ධුරය යන්න පුළුවන් සීමාවක් කරා යනවා. ඉන් එහාට ඔබට යන්න බැරි නම් ඔබට නිවනකුත් නෑ. මේ විදර්ශනාව තම තමන් තම තමන්ගේ අභ්‍යන්තරයෙන්, ඒ විදර්ශනා නුවණ සාදා ගත යුතුයි. ඒ ප්‍රඥාව අවදි කරගත යුතුයි. එහෙනම් ඒ තමන්ගෙම අභ්‍යන්තරයේ ඒ සැඟව තියෙන ඒ නුවණ ඒ ඥාණයන් අවදි විය යුතුයි. ඒ ඥානය කුමක්ද කියලා පොතේ කොච්චර පිටු පෙරළ පෙරළ බැලුවත් පිටු ගලව ගලවා බැලුවත් අසූහාර දහස් ධර්මස්කන්ධයම පීරලා හෙව්වත් ඔබට හම්බ වෙන්නේ නෑ.

ඒ ඔබගේම අභ්‍යන්තරයේ සැඟවිලා තියෙන, ඒ ඥාණයට හසුවන ඒ සත්‍ය පොතක ලියන්න බෑ. එහෙනම් ඒ ඥානය අවදි කරගත යුතුයි. තණ්හාව පොතේ ලියන්න පුළුවන්ද කියලා ඇහුවේ ඒ නිසයි. අපි දහ දෙනෙක් පේළියට තිබ්බොත්, ඒ දහ දෙනාගෙන් තණ්හාව ගැන ඇහුවොත් ඒ කෙන කෙනාගේ තණ්හාව, කෙන කෙනාගේ තණ්හාව දහ ආකාරයක්. තව කෙනෙක්ට දැනෙන දේ නෙවෙයි, තව කෙනෙක්ට දැනෙන්නේ. තණ්හාව පොතේ ලියන්න බෑ කිව්වේ ඒ නිසයි. පොතේ තියෙන තණ්හාව කියන වචනෙ ලක්ෂයක් කියෙව්වොත්, ලක්ෂ ආකාරයක තණ්හාවක් තියෙන්නේ. දැනෙන දේ කෙන කෙනාගේ අභිසංකරණය අනුවයි තීරණය වෙන්නේ. කිසි දවසක ලියන්න බෑ. ඒකයි මුඛ පරම්පරාවෙන් රහතන් වහන්සේලා මේ නිර්වාණ මාර්ගය ගෙනාවේ. මේක විදර්ශනාවක්, විදර්ශනා ඥානයක්. හොඳයි ඉතාම ගැඹුරු ප්‍රශ්නයක් උත්තර දෙන එක ලේසි නෑ. මේකේ අවසානය සිහියට හසුනොවන බව.

මොකද කම්පනයේම, කම්පනය නොවන ස්වභාවයයි සිහිය කියන්නේ. කම්පනය නොවන ස්වභාවයට, කම්පනය වුණොත් තමයි කම්පනය නොවන ස්වභාවයට අහුවෙන්නේ කම්පනය වුණොත් තමයි, කම්පනය නොවන ස්වභාවය කම්පනය අසුවෙන්නේ. එහෙනම් සිහිය කියන්නේ හැම තිස්සෙම. වර්ණ, ශබ්ද, ගන්ධ, රස, පහසවලින් හැදුණ මේ දෙයක්

කියල ගත්ත මේ හැම තැනකම, විඤ්ඤාණ මායාව දෙයක් කියලයි දෙන්නේ. හැබැයි ඒක හසුවුණේ හැම තිස්සෙම මොකක්හරි, විඤ්ඤාණ මායාවට මැවුණ එක හසුවුණේ සිහියට. හැම තිස්සෙම කම්පනය වන ස්වභාවය හරි කම්පනය නොවන ස්වභාවය හරි, ඒ කියන්නේ ආත්ම කතාවක් නෙමෙයි. මේ 'සිස්ටම්' එකේ 'ප්‍රොසෙස්' එකක්. 'ක්‍රියේෂන්' එකේම කතාව. එතන ආත්මයක් නෑ, සත්ව පුද්ගල කතාවකුත් නෑ. ඒකේ තියෙන්නේ 'සිස්ටම්' එකක් නියාම ධර්මයක්. චිත්ත නියාමය අවබෝධ කරන එකක්, මේ සිත හැදෙන හැටි අවබෝධ කරන එක. ඒ තුළයි මේ කතාව ලිහෙන්නේ ඒකෙන්. මහා ගැඹුරු ඥානයකට මේක හසුවෙන්නේ. ඒ අභිඤ්ඤා ඥානයට හසුවන පරම සත්‍ය අතිගාම්භීරයි.

ඔබේ විඤ්ඤාණ මායාවට මැවෙන ලෝකය ඒ, මේ ලෝකය ලෝකය කියලා කතා කරනවා. **සත්ව ලෝකය අපරිමිත දහම 'බුද්ධ ඥානං අචින්ත්‍යයි' කියන තැන. මේක සත්ව පුද්ගල දෘෂ්ටිය අභිබවා ගිය ඒ සත්වයා කියන මිනිස් සිත අභිබවා ගිය, ඥානයකට හසුවෙන්නේ මොකක්ද මෙතන වෙන්නේ කියලා.** එහෙනම් කම්පනය වන ස්වභාවය හසුවෙන්නේ කම්පනය නොවන ස්වභාවය කියන කොට සිහියට කියනවා වගේ, හැම සිතකටම සිහියක් තියෙන බව කිව්වේ ඒ නිසයි. අපි ඔබෙන් අහපු ප්‍රශ්නය මොකක්ද? ඉතාම ගැඹුරුයි. ඒක අහන්න ඕන හරි නම්, හෙට. අන්තිම හුස්ම බිංදුව යනවා නම් අද අහන්න ඕන ප්‍රශ්නයත් ඒකයි. එහෙනම් ඔබ ඔය අවසානය කියල හිතාගෙන ඉන්නෙ, කම්පනය නොවන ස්වභාවය අසුවෙන්නේ සිහියටද? කොහොමද මේකේ අවසානය අසුවෙන්නේ.

**උපාසිකාව :** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස අධිගත ඥානයකට.

**ආර්යයන් වහන්සේ :** හොඳයි ප්‍රශ්නය ඇවිල්ලා මේකේ අවසානය හසුවෙන්නේ සිහියටද? නැත්නම් කොහොමද කියන එක. කැමැති උත්තරයක් දෙන්න පුළුවන්. අපි විග්‍රහ කරමු.

**උපාසිකාව :** ආර්යයන් වහන්ස. මම ප්‍රකාශ කළේ. වෙනද වගේ ඇහෙනවා දැනෙනවා පේනවා, නමුත් අභ්‍යන්තර සිහියට අභ්‍යන්තර ඥානයට හසුවෙනවා. වෙනද වගේ ඒ දැනෙන පෙනෙන ඇසෙන දේ

සම්බන්ධයෙන් කිසිදු කම්පනයක් සිදුනොවන බවක්.

**ආර්යයන් වහන්සේ :** ඥානයට හසුවෙනවා කියන කොට ඒකත් එන්නේ සිහියට.

**උපාසිකාව :** ඥානය කියන්නේ අභ්‍යන්තරයට දැනෙනවා.

**ආර්යයන් වහන්සේ:** ඔව් ඒක ඥානයට අසුවෙනවා. 'ඥානය' කියන්නේ නොදැනෙන ස්වභාවයක් නේ ඔය කතා කරන්නේ. වෙනද විදිහටම පේනවා. ඇහෙනවා, නමුත් කම්පනය නොවන ස්වභාවයක් ගැනනේ කතා කරන්නේ. දැනෙනවා කියන්නේ, ඒක දැනෙන්නේ කම්පනය නොවන ස්වභාවයක්. දැනෙනවා කියන්නේ සිහියටනේ, සිහියට තමයි දැනෙන්නේ. ඒත් උත්තරයට එන්නේ සිහියට කියලා. දැනෙන ක්‍රමයක් නැහැනේ සිහියටනේ දැනෙන්නේ.

**උපාසිකාව :** එහෙමයි ආර්යන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඒක නෙමෙයි ඔය ආර්යන් වහන්සේගේ උත්තරය. ඒකේ අවසානේ සිහියට නෙමෙයි හසුවෙන්නේ. ඔය කියපු උත්තරය නෙමෙයි. ඕක හසුවෙනවා. ඕක නෙමෙයි අවසානය. මේ මග අවසානේ යන කොට එක අවස්ථාවකදී ඔය හැමදේම වෙනද විදිහට, හැම දේකින්ම මිදෙන ස්වභාවය සිහියට අසුවෙනවා. කම්පනය වන ස්වභාවය දියවෙලා යනකොට, කම්පනය නොවන ස්වභාවය ඒක අසුවෙනවා. නමුත් ඒ කම්පනය වන ස්වභාවය කම්පනය නොවන ස්වභාවයට අසුවෙනවා, නමුත් අවසානයේ මිදීම සිහිය එකපාරට කම්පනය නොවන ස්වභාවය අසුවෙන්නෙ විදිහක් නැහැනේ. ඒක ටිකක් ගැඹුරයි.

**උපාසිකාව :** අවසරයි ආර්යන් වහන්ස අභිඥේඥාවට හසුවීම.

**ආර්යයන් වහන්සේ :** දැන් ඕක විග්‍රහ කරන්න ඕන. කලින් අර මහත්මයත් කිව්වා 'අධිගත සමාධිය' කියලා. එතකොට වචනයක් විතරයි. මෙච්චර කාලයක් අධිගත සමාධිය කියලා 'දසධම්ම සූත්‍රයේ' කියන්නේ මොකක්ද කියලා කවුරුවත් දැනගෙන හිටියේ නෑ, 'අලමරිය

ඥාන දර්ශනය' කියන්නේ මොකක් කියලා දැනගෙන හිටියේ නෑ. විග්‍රහ කරන්න ඕන ප්‍රායෝගික පැත්තෙන්.

**උපාසිකාව :** ආර්යයන් වහන්ස ඔතන ක්‍රියාවලියක් කියල අපි අඳුර ගන්නවනේ ධර්මතාවක් විත්තිය. එතකොට එතෙන්දි අර සොබා දහමට එකතු වෙනවානේ. එතකොට අපට සතෙක් තව සතෙක් කෑවත් ගාණක් නැහැනේ.

**ආර්යයන් වහන්සේ :** හැබැයි ඕක දැනුමක් නේද? ඕක ඇවිල්ලා හිතනවානේ ඔය විදිහට.

**උපාසිකාව :** නෑ ආර්යයන් වහන්ස. අර මම ඒක හොඳටම අවබෝධ කරගත්තේ අපේ පුතා අර 'සෙන්සස්' හයි කරලා වාහන හදලා. එතනදි අර මමය නැතුව දකින්න හොඳටම ඒ අවස්ථාව මට ප්‍රයෝජනවත් වුණා.

**ආර්යයන් වහන්සේ :** ඒක හසුවෙන්නේ සිහියට නේද? හොඳට බලන්න.

**උපාසිකාව:** ඔව්. සිහියට.

**ආර්යයන් වහන්සේ :** එතකොට මේ ආර්යයන් වහන්සේ කියන්නේ, මේකේ අවසානය සිහියට අසුවෙනවා නෙමෙයි කියලා.

**උපාසිකාව:** ඔව්. එතකොට ආර්යයන් වහන්ස එතන අර ක්‍රියාවලියක් විත්තිය අපි දකිනවා නේ.

**ආර්යයන් වහන්සේ :** ඔව්. ඒක එතන හිතනවා, දැන් ක්‍රියාවලියක් නෙමෙයි කියලා දකිනවා. කියන්නේ ඒක මෙනෙහි වෙනවා. එතන තියෙන්නේ අර මෙනෙහි වන ස්වභාවය, සවිතක්ක ස්වභාවය.

**උපාසිකාව:** එතකොට ආර්යයන් වහන්ස, අපි දවසෙම දකින 'ධම්ම ස්වභාවයට' එන, ආයතනවලින් එන ස්වභාවය අපි දකිනවා නේ මෙතන දෙයක් නැති ස්වභාවය.

**ආර්යයන් වහන්සේ :** ඔව් ඒක දකිනවා කියන කොට ඒක නුවණට

හසුවෙනවා. හැබැයි ඒක ඊට පස්සේ ඒක නෙමෙයි සවිතක්ක ස්වභාවයක්. ඒ කියන්නේ මාර්ගයේ ස්වභාවයක්. නුවණට හසුවෙනවා. ඔය කියන විග්‍රහය අනුව මේ කියන්නේ.

**උපාසිකාව :** ඔව් දැනෙනවා නේ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** දැනෙන කොට ඒක අනිත් පැත්තට එනවා, **දකිනවා එකයි දැනෙනවා එකයි දෙකක්. දකිනවා කියන්නේ මාර්ගයක්, ඒක නුවණට හසුවෙන්නේ. දැනෙනවා කියන්නේ ඒකේ 'ඵල' අවස්ථාව අවිතක්ක ස්වභාවයයි.** මෙතන විග්‍රහ කරනකොට හැමෝටම තේරෙනවා මෙතන කොයිතරම් ධර්මයක් කියවෙනවද කියලා. ඉතාම ගැඹුරු තමයි සියුම්තමයි. නමුත් මේක ඔය නුවණින් දකින එක, එතකොට මාර්ග ස්වභාවය හැබැයි අර මිදෙන ස්වභාවය සිහියට අසුවෙනවානේ. ඒක එතකොට 'ඵල ස්වභාවය'. මේ කියන්නේ අවසානයේදී මේක සිහියට අසුවෙනවා නෙමෙයි කියපු එක මොකක්ද කියපු එක කියලා.

**උපාසිකාව :** එතනදී ආර්යයන් වහන්ස දැන් අපිට ඇක්සිඩන්ට් එකක් වුණොත්, රණ්ඩුවකදී වුණත් ඒක අර දැනෙන්නේ නැති ස්වභාවය අර සුන්දරව දකින්න ලැබෙන්නේ.

**ආර්යයන් වහන්සේ:** ඒකට කම්පනය නොවන ස්වභාවය.

**උපාසිකාව:** ඔව් කම්පනය නොවන ස්වභාවය.

**ආර්යයන් වහන්සේ:** ඒක සිහියට නේද අසුවෙන්නේ. හැබැයි මේ කියන්නේ ඒක නෙමෙයි කියලා. අවසානය මේක සිහියට අසුවෙන්නේ නෑ කියලා කියන්නේ. ඒ මොකක්ද කියලයි අහන්නේ. තමන්ට අත්දැකීමක් තිබුණොත් දැනෙයි. මොකක්ද මේකේ අවසානය.

**උපාසිකාව:** දෙයක් නැති ස්වභාවය ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** හැම තිස්සෙම දෙයක් කියලා පෙන්වන කොට, ඒකේ දෙයක් කියලා පෙන්නන එක, ඒක සිහියට අසුවෙනවා. දෙයක් සිහියට අසුවෙනවා වගේ දැනෙනවා, අභ්‍යන්තරයේ කම්පන ස්වභාවය සිහියට අසුවෙනවා නේද?

**උපාසිකාව:** නිමිත්තක් නැති ස්වභාවයද ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** ඔව් ඔව් නිමිති පනවන්න බෑ. 'අනිමිත්ත ස්වභාවය.' නිමිත්ත කියන්නේ දරුවෝ, ගෙවල් දොරවල්, අම්මා, තාත්තා 'ඕලාරික' ස්වභාවයක්. හැබැයි මේකේ අන්තිමට යන්නෙ සම්පූර්ණම අනිමිත්ත ස්වභාවයකින් - 'අරූප' පැත්තට යන්නේ. 'අරූපය' කියන කොට අනිමිත්ත පැත්තට එන්නේ, එතකොට නිමිති පනවන්න බෑ. එතන අරූපය පැත්තට එන්නේ. එතෙන්ට එනකොට අනිමිත්ත පැත්තට එන්නේ, අම්මා, තාත්තා, ගෙවල්, දොරවල් නෙමෙයි කම්පන ස්වභාවයක් විතරයි. අර අනාගාමී භූමියෙන් පස්සේ එහාට යනකොට, ලෝක සංඥාවලින් මිදුණු ස්වභාවයක් එන්නේ ආකාස ස්වභාවය. ආකාස ස්වභාවයෙන් විඤ්ඤාණ ස්වභාවයෙන්, අකිඤ්ඤා ස්වභාවයට ගිහිල්ලා 'න සංඥා' කියන මේ කතා කරන්නේ. මේ අරූප ධ්‍යාන විදර්ශනාවේ තියෙනවා.

දැන් මේ ගොඩක් අය දන්නේ නෑ, **විදර්ශනා සමාධිය තුළත් රූප ධ්‍යානයයි අරූප ධ්‍යානයයි මේ සමථයේ පෙන්වන විදිහට නෙමෙයි පෙන්නන්නේ. සමථ භාවනා කරන අයට ඒක හම්බ වෙන්නේ නෑ මේ කියන විදිහට, මේක ආත්ම ස්වභාවය දියවෙච්ච ස්වභාවයකින් අසුවෙන්නේ. අත්දැකීම් දෙකක්.** එකම අත්දැකීම් නෙමෙයි. දැන් මෙතන ගොඩක් අය ඉන්නේ, ගොඩක් අයට හම්බ වෙන්නේ ආත්මය තියාගෙන ඔය ස්වභාවය ඉන්න එකක්. හැබැයි ආත්ම ස්වභාවය දියවෙච්ච ස්වභාවයක් තුළ ඒ ස්වභාවය තුළ, ඇත්තටම අර දැන් අපට මේ ප්‍රතිපදාව තුළ මේ දෙපැත්ත වෙන් වෙන්නේ. ප්‍රතිපදාව තුළ මේ දෙපැත්ත දීර්ඝ කාලයක් පත්තියම් කරන්න ඕන ප්‍රතිපදාවක් තියෙනවා. ඒක තමයි මමය නැතුව කටයුතු කරන එක. ඒක තමයි බුදුසමය තුළ අපි දකින්නේ. මේ යෝගාවචර භූමියේ විශාල පරිශ්‍රමයක් දරල තියෙනවා. මේ ප්‍රතිපදාව ඇතුළේ කටයුතු කරන්න.

අපට හම්බ වෙනවා මේක, ඇත්තටම 'සතර සතිපට්ඨානයම' තියෙන්නේ මමය, නැතුව දකින්න. මේක ගොඩක් අයට තේරෙන්නෙ නෑ. 'විනෙය්‍යය ලෝකේ - අවිද්‍යා දෝමනස්සානං' කියන කොට, මේ ලෝකය කියන එකම කෙනෙක් නිරූපණය කරනවා. කෙනෙක් නිරූපණය කරන ස්වභාවය, සතර සතිපට්ඨානයක් ගැනයි කතා කරන්නේ. මේකේ

සම්පූර්ණයෙන්ම තියෙන්නේ, සතර සතිපට්ඨානය කියන්නේ කෘත්‍ය පැත්ත. මේකේ සත්‍ය දර්ශනය තුළයි, මේකේ මේ 'විනෙය්‍ය ලෝකේ' කියන තැනට එන්න ඕනි. **දර්ශනය නැතුව කෙනෙකුට 'සතර සතිපට්ඨානය' වඩන්න බෑ. බුද්ධ දර්ශනය අවබෝධය තුළ මෙතන එන්නේ මොකක්ද? ලෝකයෙන් මිදෙන අනාත්ම ධර්මය.** ආත්මයක් කියාගෙන ලෝකයක් තියාගෙන සතර සතිපට්ඨානය වඩන්න බෑ. ඉස්සෙල්ලාම සෘතමය ඥානයෙන් ඒක දැනගෙන ඉන්න ඕනේ. කල්‍යාණ මිත්‍රයාගේ පණිවුඩය අවශ්‍යයි. දර්ශන අවබෝධය අවශ්‍යයි. ඊට පස්සේ ප්‍රායෝගික කරගන්න සතර සතිපට්ඨානය අවශ්‍ය වෙන්නේ එතෙන්ට, එන්නේ පස්සේ කෘත්‍ය ඥානය පැත්තට මේකේ.

සත්‍ය ඥානය නැතුව කෘත්‍ය ඥානයක් නෑ. ඒ කියන්නේ බුද්ධ දර්ශනය ගිලිහිලා තියෙන්නේ. සමාජෙට බුද්ධ දර්ශනයයි තියෙන්න ඕනෑ. රාහුල කුමාරයා අවුරුදු 07න් සෝතාපන්න වුණා. රාහුල කුමාරයාට වතුර කඩිත්තක් පෙන්නලා මේකමයි සිත මේ ප්‍රතිබිම්භය කියලා, බාහිර තියෙන දෙයක් නෙවෙයි මේ හිතේම ප්‍රතිබිම්භයක් තමයි බාහිර කියලා බුදුන් වහන්සේ පෙන්නුවා නේ මේකෙන්. හේතුඵල දහම දරුවන්ට පෙන්වා දෙන්න ඕනෑ මේ සේරම සිතුවිලි කියලා. මේක කිව්ව ගමන් කර්ම භූමිය බිඳ වැටෙනවා. දරුවෝ බෞද්ධයන් බවට පත් වෙනවා. එහෙනම් බාහිරෙන් මරාගන්න යන්නේ නෑ. හොරකම් කරන්න බාහිරෙන් දඟලන්නේ නෑ. 'පංච ශීලය' රැකෙනවා. ඊට වඩා ඉහළට ගිය 'උපාදානස්කන්ධයෙන්' මිදෙන 'ශීලය' රැකෙනවා. දරුවෝ සෝතාපන්න වෙනවා. කම්පන ස්වභාවය අසුවෙන්නේ කම්පන නොවන ස්වභාවයට. ඒකට අපි කිව්වා සිහිය කියලා. ඔය සිහිය මොකක්ද කියලා තමයි ඔය පෙන්නුවේ. මේක සිහියට අසුවෙන්නේ. හැබැයි මේකේ අවසානය එතන නෙමෙයි. ඒකත් පැහැදිලි කරන්න.

***උපාසිකාව :*** අධිගත ඥාන දර්ශනය. ගිනි ගොඩක් මැද්දේ අයිස් කැටයක් තිබ්බා වගේ.

**ආර්යයන් වහන්සේ :** ඒ 'අධිගත ඥාන දර්ශනය' තුළ මේකේ අවසානය නිවීමට පත්වෙනවානේ. මේ නිවනේ අත්දැකීමනේ මේ කතා කරන්නේ ඒක දැනෙන්නේ මොන විදිහටද කියලයි අහන්නේ. ඒක

දැනෙන්නේ කොහොමද? අපි හිතමු ඔබතුමිය නිවන් දකිනවා කියලා නේද? ඔබතුමියට ඒක කොහොමද දැනෙන්නේ. දැන් ගිනි ගොඩක් මැද්දේ අයිස් කැටයක් තිබ්බා වගේ නේද? ඒක අසුවෙන්නේ සිහියටද? ප්‍රශ්නය මේක සිහියටද අසුවෙන්නේ කියන එක. කෙනෙකුට හිතෙයි ඔව් සිහියටනේ අසුවෙන්නේ ඇයි ගිනි ගොඩක් මැද්දේ අයිස් කැටයක් තිබ්බානේ. එතකොට ගිනි ගොඩක් මැද්දේ අයිස් කැටයක් කියන්නේ උපමාවක්නේ. ඒක ආර්යන් වහන්සේ දීපු උපමාවනේ. කොහොමද ඒක අසුවෙන්නේ. දැන් උපමාවට උපමේය ගන්නකෝ. ආත්ම ස්වභාවය දියවෙන එකනේ මේකේ වෙන්නේ. ඒක කොහොමද අසුවෙන්නේ. මේක සිහියටද අසුවෙන්නේ කියලා.

**උපාසිකාව :** ඥානයට ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඒ කියන්නේ සිහියටයි. දර්ශන ඥානයෙන්නේ ඔතෙන්ට එන්නේ. ඥානයට තමා අසුවෙන්නේ. ඥානය කියන්නේ සිහිමයි. සිහිය කියන වචනය පාවිච්චි කරන්නේ හැමෝම තේරෙන නිසා. ඔය ඥානයට තමයි අසුවෙන්නේ. ඥානය කියන්නේ සිහිය තමයි. හැබැයි මේක අසුවෙන්නේ මොකක්ද මේ අසුවෙන්නෙ අපි එහෙම ඇහුවොත්.

**උපාසිකාව :** අවසරයි ආර්යන් වහන්ස ඒක අසුවෙන්නේ කම්පනය වන ස්වභාවයට.

**ආර්යයන් වහන්සේ :** කම්පනය වන ස්වභාවය, දැන් කම්පනය වන ස්වභාවය දියවී ගෙන යනවානේ. අභ්‍යන්තර ආත්ම කම්පනය නේ දියවීගෙන යන්නේ අන්තිම ටිකේ. අන්තිම ටික ආත්ම කම්පනය යන්නේ. ආත්ම කම්පනයනේ දියවීගෙන යන්නේ. දැන් ආත්ම කම්පනයනේ දියවෙන්නේ. තමන්ගේ සිහියට නේ ඒක අසුවෙන්නේ. තමන්ගෙම තියෙන මේ ආත්ම ස්වභාවය, තියෙන මේ ආත්ම ස්වභාවය තමන්ගෙම අභ්‍යන්තරය හැම තිස්සෙම මමයා ලොකු වෙන ඒවා කතා කරන එක. අනිත් අයගේ ඕපාදූප හොයන එක, අනිත් අයගේ ඒවා කියවන එක, ඔක්කොම ආත්ම ස්වභාවයනේ. වැරදි අඩුපාඩු පේනවා ඔක්කොම තියෙන්නේ දෙයක් පේන හින්දනේ, ආත්ම ස්වභාවයනේ. හරි වැරදි අන්න ඔක්කොම තියෙන්නේ ආත්ම ස්වභාවයනේ. ආත්ම ස්වභාවය හැම

තිස්සෙම දෙයක් නිරූපණය කරනවා. ඒක දියවීගෙන යනවානේ. ඒක දියවී ගෙන යන බව සිහියට අසුවෙනවා. ඒක ආසවඛ්‍යය ඥානයනේ අසුවෙනවා, සිහියට අසුවෙනවා කියන්නේ එකම කතාවනේ. ඥානයෙන් නේ එන්නේ, එන එක ඥානයට අසුවෙනවා. මේකේ අවසානය එතකොට නොදැනෙන ස්වභාවයට එනවානේ. ඒ නොදැනෙන ස්වභාවය සිහියට අසුවෙනවා නේ. ඥානයට තමයි සිහිය කියන්නේ. හරි ඒක ආසවඛ්‍යය ඥානය නේ. ක්ෂය වී ගෙන යනවානේ. ක්ෂය වීගෙන යන එක මාර්ග ස්වභාවය නේ. එතකොට 'ඵල' ස්වභාවය ඒක සිහියට අසුවෙනවා නේ දිය වේගෙන යන බව.

**උපාසිකාව :** ඵල ස්වභාවය නිවන.

**ආර්යයන් වහන්සේ :** ඔව් ඒක තමයි කතා කරන්නේ මොකක්ද ඒ දියවීගෙන යන ස්වභාවයත් සිහියට අසුවෙනවා. ඒක හරි නොදැනෙන ස්වභාවයත් සිහියට අසුවෙනවා. ඒකත් හරි. එතන ඇත්තටම නිවන් දැකලද? මොකක්ද ඒ අත්දැකීම. නොදැනෙන ස්වභාවය. දැන් ඔන්න ආත්ම ස්වභාවයෙන් මිදුණා කියමුකො. ආත්ම ස්වභාවය දියවීගෙන ගියා කියමුකෝ. ආත්ම ස්වභාවය එතන මතුවෙන්නේ නැහැනේ.

**උපාසිකාව :** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** දැන් එතකොට කම්පන ස්වභාවය දියවෙලා ගිහිල්ල නේ. එතකොට කම්පනය නොවන ස්වභාවයක් මතු වෙනවානේ. එයාට තමන්ගෙම ආත්ම ස්වභාවය දියවෙන ස්වභාවය. ඒ පාරේ ඉන්න එපැයි. ඒ මාවතේ යන්න එපැයි. ආත්මයක් නිරූපණයක් වෙනවද කියලා තමන්ටම සිහියක් තියෙන්න එපැයි. සාන්දිට්ඨික වෙන්න එපැයි. සිහියට අසුවෙනවානේ ආත්ම ස්වභාවය දියවී ගෙන යනවා කියලා. එයාට කම්පන ස්වභාව ඔක්කොම දියවෙන ස්වභාවයක් අසුවෙනවා නේ. ඒක නොදැනෙන ස්වභාවය අසුවෙනවා නේ. ඊට පස්සේ දියවී ගෙන ගිහිල්ලා ඒකත් ඒ ඥානයට අසුවෙනවනේ නොදැනෙන ස්වභාවය. මේ අකම්පිත ස්වභාවයක් අසුවෙනවා නේ. ඒකද වෙන්නේ. ඔය ඒකද නිවනේ අත්දැකීම. ආසවඛ්‍යය ඥානය තමයි මේ කතා කරන්නේ.

**උපාසිකාව :** ඒක 'ශූන්‍යද' කියන එක.

**ආර්යයන් වහන්සේ :** ඔය වචනයක් විතරයි 'ශූන්‍ය' කියන්නේ. දැන් කොහොමත් මෙතන දෙයක් නිරූපණය වෙන්නේ නැහැනේ. කොහොමත් ශූන්‍ය වෙන තැන නේ. 'නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ' මේ කතා කරන්නේ මේ අත්දැකීම නෙමෙයි. මේකේ අවසානය අත්දැකීම ඒකද කියලයි අහන්නේ. ඒ අත්දැකීම ඒක අත්දැකපු දවසටයි තේරෙන්නේ. එහෙමද කියන්න වෙන්නේ.

**උපාසක:** කම්පනය නොවන ස්වභාවය එතන සාමාන්‍ය ස්වභාවයකට එන්න බැරිද?

**ආර්යයන් වහන්සේ:** සාමාන්‍ය ස්වභාවයක් තමයි මේ හැමතැනම තියෙන්නේ. මේ කතා කරන්නේ සාමාන්‍ය ස්වභාවයක් තමයි. දැන් අපි මෙහෙම ගමු. රහතන්වහන්සේ සාමාන්‍ය ස්වභාවය කියන්නේ මේකයි, රහතන් වහන්සේගේ ඇස් පේනවානේ. රහතන් වහන්සේට කන් ඇහෙනවනේ. රහතන් වහන්සේගේ ආයතන ටික සාමාන්‍ය විදිහට වැඩ කරනවා නේ. එතකොට සාමාන්‍ය ස්වභාවයක් තමයි තියෙන්නේ. එහෙම බැලුවොත් ඔබතුමා කියන විදිහට බැලුවොත් සාමාන්‍ය ස්වභාවය ඒ විදිහමයි. රහතන් වහන්සේත් ආහාර ගන්නවා. දානේ වලඳනවා, රස දැනෙනවා, ගඳ සුවඳ දැනෙනවා, මුකුත් වෙලා නෑ, නමුත් අභ්‍යන්තරයේ මමත්වයක් තියෙනවානේ හැම කෙනෙකුටම මම ඉන්නවානේ. මම විඳින එකක් තියෙනවනේ. මේ රස දැනෙන එක වෙනයි, රස මම විඳින එක වෙනයි නේ. මමෙක් මෙතන පෝෂණය වෙනවනේ කාටවත් දෙන්නැතුව කන එකකුත් තියෙනවනේ. මේක ඇතුළේ. මමෙක් පේනවනේ. මමයා හොයා ගන්න එපැයි ආත්මය, ඒ ආත්මය දියවෙන්න එපැයි. දැන් කන එක නැති වෙන්නේ නෑ. රස දැනෙන එක නැති වෙන්නෙත් නෑ, හැබැයි මේක අර විඳිනකෙනා නැති වෙනවා. තේරුණා නේද? ඒකනේ මේ අකම්පිත ගමන 'ක්ෂය ධම්මා - වය ධම්මා' කියන්නේ ආත්මය, ආත්ම සංඥාවනේ දියවී ගෙන යන්නේ. මේක මේ දෘෂ්ටියෙන් මිදුණාට පස්සේ මේ කතා වෙන්නේ.

සිතුවිල්ලෙන් මම ඉන්නව කියන සිතුවිල්ල මිදිලා තියෙන්නේ, මෙතන 'සෙන්සස්' ටිකනේ. මෙතන 'සෙන්සස්' ටික දකින කෙනාටයි මේක අහුවෙන්නේ. එතකොට එයා හසුවෙනවා මේ කම්පන ස්වභාවයට

ආත්ම ස්වභාවය, අන්න දියවෙන ස්වභාවය හසුවෙනවා. කම්පනය යන්තම් හරි තියෙනවනේ කෙනෙක් වගේ, නිරූපණයක් විඳින කෙනෙක් ඉන්නවා නේ. දුක් විඳින කෙනෙක් ඉන්නවා නේ. සැප විඳින කෙනෙක් ඉන්නවා නේ. ආශාවක් ඇතිවෙන කෙනෙක් ඉන්නවා නේ. අන්න එයා දිය වෙනවා නේ. දැන් රස ගඳ සුවඳ ප්‍රශ්නයක් නෙමෙයි නේද? කෙනා දියවෙන එකක් නේද තියෙන්නේ.

**මරණ බිය එන්නේ කාටද? ඇහැටද? කනටද, දිවටද, රසටද? කාටද? ඒක දියවෙනවා නේද? කෙනා දියවෙනවා නේද? කෙනා දියවෙලා ගිහිල්ලා අන්තිමට කෙනා ගාණක් නැති ස්වභාවයක් එනවා. මැරුණත් එකයි හිටියත් එකයි වගේ තැනකට එනවා නේද?** එහෙම කෙනෙක් නැති නිසානේ එන්නේ. කෙනා නැති නිසානේ අවබෝධයට පත්වෙන තැන ඔතන නේ. ඒ කියන්නේ මමයා දිය වෙන එකම තමයි. ඒකම තමයි කෙලෙස් ආසවඛ්‍යය. ඒ කියන්නේ රාග, ද්වේෂ, මෝහ කෙලෙස් දියවෙන ස්වභාවයත් ඒකම නේද?

***උපාසක :*** එහෙමයි.

**ආර්යයන් වහන්සේ :** කම්පනය කියන්නෙත්, එක්කෝ ඇලෙනවා ගැටෙනවා කියන එකනේ. ඇලෙනවා ගැටෙනවා කියන්නේ රාග ද්වේෂ මෝහනේ. ඒකනේ කෙලෙස් දියවෙන එකනේ. මේ ආත්මය දියවෙන එක කියන්නේ දෙකම එකමනේ. කෙලෙස් දැනෙන්නේ නැහැනේ. ඇහැට කෙලෙස් දැනෙන්නේ නැහැනේ. දිවට කෙලෙස් දැනෙන්නේ නැහැනේ. නාසයට කෙලෙස් දැනෙන්නේ නැහැනේ. රශ්මියට, උණුසුමට සීතල ඒක සිතමනේ, සිතට කියන්නේ එතනත් කෙනෙක් ඉන්නවා කියලා අරගෙන මටනෙ මේ ඔක්කොම වෙන්නේ. මම නේ විඳින්නේ මමනේ කන්නේ. මමට තව ඕන කන්න. මම හැදුණා නේද? ඒක තියෙන්නේ දෘෂ්ටියක් එක්කලා. හැබැයි දෘෂ්ටිය නැතිවෙන කොටම මොකද වෙන්නේ. එතන විඳින කෙනා නැති වෙනවා නේද? ඊට පස්සේ ඒත් එයාට දැනෙනවා නේද එයා ඉන්නවා වාගේ. ඒකත් දියවෙන ගතියක් එනවා නේද? ඒ ගැනයි අපි කතා කරන්නේ.

ඒ කම්පනය දියවෙන එක ගැනයි කතා කරන්නේ. ඒ කම්පනය දියවෙන එකත් සිහියටනේ හසුවුණේ. මමයා දියවෙන එක. එතකොට

ඒක දියවෙලා දියවෙලා ගිහිල්ලා සිහියට හසුවෙනවා. දැන් නොදැනෙන ස්වභාවයක් එනවා මමයා දියවෙලා. දැන් මමයා නෑ මතුවෙන්නේ නෑ. සැහැල්ලුවෙන් ඉන්නවා. ඒ කියන්නේ මේකේ අවසාන අත්දැකීම ඔය ටික අසුවෙන්නෙ. ඔය වෙන දේ තමයි කිව්වේ. අකම්පිත ස්වභාවය ඥානයට හසුවෙනවා. ඒකත් හරි. ආසවඛ්‍යය ඥානයත් හරි. සියල්ලම හරි. නමුත් මේකේ අවසාන අත්දැකීම ඕක නෙමෙයි.

**උපාසිකාව :** තෙරුවන් සරණයි ආර්යයන් වහන්ස. සැහැල්ලු ස්වභාවය.

**ආර්යයන් වහන්සේ :** සැහැල්ලු ස්වභාවය නේද සිහියට අසුවෙන්නේ, අවසානයේ මුකුත් නොදැනෙන ස්භාවයට. මේකේ අවසානය අපි ඔබට මීට කලින් කිව්වා. වෙනස් කතාවක් තියෙනවා කියලා. මේක අත්දකින කෙනෙකුට අත්දැකීමක් විදිහට කාට හරි ලැබුණොත් තමයි තේරෙන්නේ. මේක හිතලා ගන්න බෑ. හිතලා කියන්න පුළුවන් වෙන්නේ ඒක දියවීගෙන යනවා. දියවීගෙන යන ස්වභාවය තුළ අර දැනෙන ස්වභාවය, නොදැනෙන ස්වභාවයක් කරා යනවා. ඊට පස්සේ ගින්න දැනෙන්නේ නැති ස්වභාවයට එනවා. හිතලා කියන්න පුළුවන් ඔච්චරයි. ඒක සිහියට හසුවෙනවා. ඒක ඥානයට හසුවෙනවා. ඒක 'ආසවඛ්‍යය' ඥානය කියනවා. නොදැනෙන ස්වභාවය අන්න අරහත්වයට පත්වෙනවා කියලා ඔච්චරයි හිතලා කියන්න පුළුවන්. ඕක හිතලා කියන එකක්. හැබැයි ඕක දැනෙන එක නෙමෙයි. ඔය ස්වභාවයට පත්වුණු කෙනෙකුට විතරයි කියන්න පුළුවන්. මොකක්ද ඔතන වෙන්නේ කියලා.

අත්දැකීම ඕක නෙමෙයි. ඔය අත්දැකීම ලැබෙනවා. හැබැයි ඔය අත්දැකීමට එහා ගිය වෙනස් ස්වභාවයක් මතුවෙනවා. එයයි අරහත්වයේ අරහත්ත සමාධිය. ඒ අරහත්ත සමාධිය ඕක නෙමෙයි. 'යන්හී යන්හී තත්‍ර තත්‍ර විපස්සතී' කියන තැන. නිරෝධ සමාපත්තිය පරම සුඛයයි තථාගතයන් වහන්සේ නොකියම් කියලා කිව්වනේ. තථාගතයන් වහන්සේ පරම සුඛයයි කිව්වේ නැහැනේ. නිරෝධ සමාපත්තිය. ශූන්‍යතා සූත්‍රවල හම්බ වෙනවානේ. ඒක මෙ කියනවා නේ. බුදුන්වහන්සේ නිරෝධ සමාපත්තිය පරම සුඛයයි නොකියම් කියලා බුදුන්වහන්සේ 'පරම සුඛය කිව්වේ කුමක්ද?

'යන්හී යන්හී තත්‍ර තත්‍ර විපස්සතී' එතන එතන දැනෙන සුවයක් ගැන කිව්වා. මොකක්ද ඒ බුදුරජාණන් වහන්සේ කියූ පරම සුඛය. **ඒක පෙන්නුවා බුදුන්වහන්සේ 'අනුත්තර' ස්වභාවය කියලා. ඒ අනුත්තර ස්වභාවය මොකක්ද? මොකක්ද ඒ අත්දැකීම. ඒ 'විමුක්තිසාරා' වෙමු කිව්වා ඒ අභ්‍යන්තරය දක්වා යන 'මහා මෛත්‍රිය' කියලා කිව්වා. මොකක්ද ඒ ස්වභාවය.** දැන් ඕක කියන කොට රැවටෙන්න එපා. 'තෙලුත් ඉවරයි' තිරත් ඉවරයි' පහන නිවී ගියේය. ගිය තැනක් කොයින්ද? ඒ නිවනේ උපමාව. අන්තිමටම කියන්නේ වෙන දෙයක්. කියන්න දෙයක් නෑ. ඒකට හේතුව ආර්යන් වහන්සේ අත්දැකීම් ලෝකයට හෙළි කරන්නේ.

**උපාසිකාව :** 'විමුක්ති සාරා' ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ:** 'විමුක්ති සාරා' ගැන තමයි මේ කතා කරන්නේ.

**උපාසිකාව :** සොබා දහමට සමාන වීම.

**ආර්යයන් වහන්සේ :** සොබාදහම කියන්නේ සිතුවිලි, ඒක ඉස්සෙල්ලා හොඳට විග්‍රහ කරගන්න ඕන. සොබාදහම කියන්නේ සිතුවිල්ලක්. සොබාදහම කියලා දෙයක් නෑ. අපි මේ වචන භාවිත කරනවා සන්නිවේදනය සඳහා එච්චරයි. මොකක්ද සොබාදහම කියන්නේ. දැන් අපි කියනවා මේ හුළං හමනවා. වලාකුළු යනවා. ගස්වල අතු සෙලවෙනවා. මේ රමණීය වනපෙත හරි සුන්දරයි. ඒක බුදුන් වහන්සේට පහළ වුණු සිතුවිල්ලක්. බුදුන් වහන්සේටත් සිතුවිලි පහළ වෙනවා. ඒක සිතුවිල්ලක්. කවුරුහරි කිව්වොත් මේ සුළඟ හරි සුන්දරයි කියලා, ඒක සිතුවිල්ලක්. ඒක සුන්දරයි තමයි, ඒක නැහැයි කියන්න බැහැ. අර හැම දේකින්ම මිදුණ ස්වභාවය තුළ එවැනි ස්වභාවයක් තමයි තියෙන්නේ. හැබැයි ඒක ඔය සිතුවිල්ලකින් තමයි ඔය කියන්නේ. ඒක ඇවිල්ලා සිතුවිල්ලක් විදියට සන්නිවේදනය කරන එකක්. හැබැයි දැනෙන එක ඔය සිතුවිල්ලේ නැහැ නේද? දැනෙන එක අර සුඛ ස්වභාවයක් නේද? මෙන්න මේකයි කතාව.

**උපාසක :** අවසරයි ආර්යන් වහන්ස. 'සිස්ටම්' එකේ ක්‍රියාත්මක වන ආකාරය, 'සිස්ටම්' එකක් නේද? ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** ඔව් ආත්ම කතාවක්, ආත්ම කතාවක්

කොහේවත් හම්බ වෙන්නේ නෑ 'සිස්ටම්' එක තමයි මේ ඕෆ් වෙලා යන්න හදන්නේ. 'සිස්ටම්' එක ඕෆ් වෙන ස්වභාවය තුළ මේකේ අත්දකින අත්දැකීමයි මේ කතා කරන්නේ.

**උපාසක :** 'ටෙලිපති සිස්ටම්' එකනේ ආර්යයන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** 'ටෙලිපති සිස්ටම්' එක කතා කරන්න බෑ මෙතන්දි. මොකද හේතුව 'ටෙලිපති සිස්ටම්' එක කතා කරන්නේ සිතක් ගැනයි. සිතින් මිදුණු ස්වභාවයක් ගැනයි මේ කතා කරන්නේ.

**උපාසක :** අර ක්‍රියාත්මක වන ආකාරය නුවණින් දකින එක නේද? මේ 'ටෙලිපති සිස්ටම්' කියන්නේ.

**ආර්යයන් වහන්සේ :** 'ටෙලිපති සිස්ටම්' එක දකින එක එතනදි, සිතේ 'සිස්ටම් එකමයි' ටෙලිපති කියලා අපි කතා කරන්නේ. සමාන්තරය ගැනයි. ටෙලිපති කිව්වේ නූතන වචනයක්. බුදුන් වහන්සේගේ පර්යාය පැහැදිලි කිරීමේ තියෙන්නේ 'සමනන්තරය' කියලා. දෙකම එකමයි. 'අබොප්පා චේතෝ විමුක්තිය' ගැනයි මේ කතා කරන්නේ.

**උපාසක :** අවසරයි ආර්යයන් වහන්ස චිත්තානුපස්සනාව තුළ ගොඩක් රහස් තිබෙනවා. කම්පනය නොවන ස්වභාවය අසුවෙන්නේ සිහියට. ඒ කියන්නේ එතන 'රූප-වේදනා-සංඥා-සංඛාරා-විඤ්ඤාණය' පතිත වෙලා. ඒ පතිත වූ 'විඤ්ඤාණයෙහි කම්පන ස්වභාවය කම්පන නොවන ස්වභාවය අසුවෙන්නේ සිහියට ආර්යයන් වහන්ස. ඒ චිත්තානුපස්සනාව තුළ ඒ දේ ගොඩාක් යනකොට ඒ සිහිය කියන ස්වභාවයත් දුරුවෙනවා ආර්යන් වහන්ස. එතන වෙන්නේ රූප-වේදනා-සංඥා-සංඛාර යෙන්ම මිදෙනවා, පතිත වෙන්නේ නැහැ විඤ්ඤාණය. ඒ ස්වභාවය තුළ ආර්යන් වහන්ස සම්පූර්ණම මිදීමක්. ඒ ස්වභාවයන් සඳහන් කරන තැනක් පතිත වෙන්නේ නෑ. එතන නිවීමක් විතරයි ආර්යන් වහන්ස.

**ආර්යයන් වහන්සේ :** නමුත් මේකේ අත්දැකීමක් තියෙනවා හිතුවොත් ඒක ඔය විදිහට තමයි කියැවෙන්නේ. නමුත් මේකේ අපි හිතමු කෙනෙකුට මේ ස්වභාවය ආත්මය ස්වභාවය දියවී ගෙන යනවා කියලා. කම්පිත ස්වභාවය දියවී ගෙන ගිහිල්ලා අකම්පිත ස්වභාවයක් කරා

යන්නේ. හැම තිස්සෙම ඔය ස්කන්ධය පෙන්නන්නේ කම්පිත ස්වභාවයක්. රූප-වේදනා-සංඥා-සංඛාර-විඤ්ඤාණ කියන්නේ ස්කන්ධය කියන එක. ස්කන්ධය කියන්නේ අපි කිව්වා වේගයක්, කම්පනයක් කියලා. එහෙනම් ස්කන්ධය කියන්නේ වේගයක් කම්පනයක් කියන කොට ඔය ආත්මය කියන එකත් ස්කන්ධයක්. **ඔය ආත්මය දැනීම ස්කන්ධයමයි. ඒක හේතුඵල දහමේ 'හේතුව' 'ඵලයට' අයිති නෑ කියනකොට, 'ඵලය' අන්තිමට වෙන්නේ හේතුව ශබ්ද වර්ණ. ඵලය ආත්මය කිව්වේ, ආත්මීය කම්පනය තමයි අන්තිමට දියවෙලා යන්නේ. මොකද අර ටික ඔක්කොම ඉවර වෙනවා. ශබ්ද කියලා දේකුත් නෑ. වර්ණ කියලා දේකුත් නෑ. රස කියලා දේකුත් නෑ. ගන්ධ, රස, පහස ඔක්කොම, අනාගාමී භූමියෙන් එහාට ඒවා නෑ ලෝක සංඥා බිඳ වැටෙනවා.** කම්පනය, එකම කම්පන ස්වභාවයක් වෙනවා.

ශබ්දයෙන් ආවත්, වර්ණයෙන් ආවත්, ගන්ධයෙන් ආවත්, රසෙන් ආවත් කොහෙන් ආවත් මෙතන දෙයක් වගේ දැනෙන ගතිය ආත්ම ස්වභාවය දැනෙන්න ගන්නවා. රුප්පනය, ඒකට තියෙන ඇලෙන ගැටෙන ස්වභාවය. මොන ද්වාරයෙන් අරමුණක් ආවත්, ඒකට ඇලෙනවා හරි ගැටෙනවා හරිනේ. කම්පනයක්, කම්පනය නේ මෙතන ආත්ම ස්වභාවය ඇලෙන ගැටෙන ස්වභාවයනේ. ශබ්දයක් ආවත් ඒකට, ඒක හොඳයි නරකයිද වගේ ඒකට ඇලෙනවාද? නැද්ද කියන එකනේ තියෙන්නේ. වර්ණයක් ආවත්, ඒකට ඇලෙනවාද නැද්ද කියන එකනේ තියෙන්නේ. ඇලෙනවද නැද්ද කියලා මේක එතෙන්ට එනවා නේ. ඇවිල්ලා ශබ්ද, වර්ණ පැත්ත ඒවා ඔක්කොම බිඳ වැටෙනවා නේ. ඒවා ඔක්කොම විඤ්ඤාණ මායාවට මැවෙන ඒවා නේ. 'සෙන්සස්' වල ඒවා ඔක්කොම බිඳ වැටෙනවා. බිඳ වැටෙන කොට මේකේ අවසානය එන්න ඕනේ. දැනෙන ස්වභාවය මොකක්ද මේ ආත්ම ස්වභාවයට එනවානේ. කම්පන ස්වභාවයට එනවානේ. කම්පන ස්වභාවයනේ මෙතන දැන් අන්තිමට එනවානේ. ඒක තියෙනකම්ම මේ ඇලෙන ගැටෙන ස්වභාවය තියෙනකම් කම්පන ස්වභාවයනේ. ඒක දියවෙනවා නේ. රාග, ද්වේෂ, මෝහ, ආසවඛ්‍යා ඥානය කිව්වේ. ඒකේ සුකුම ස්වභාවය මතුවෙන්නේ එතනනේ. ඔන්න ඔතනයි කතාව තියෙන්නේ.

ආර්යයන් වහන්සේ මේ කතාව නිතරම කියනවා. මේක අත්දකින්නම ඕන. මේක හිතන්න බැරි එකක්. දැන් අපි දන්නවා 'චික්ස් ටොෆියක්' කෑවහම ඇතුළට සිසිලසක් දැනෙනවා නේද? ඒක හිතන්න බැරි එකක් නේද? අර ලුණු රස ගැනත් හිතන්න බෑ වගේ. මේක හිතන්න බැරි එකක් නේද? **ඇත්තම කිව්වොත් මේකේ අවසානයේ සිහියත් අභිබවාගෙන යනවා. ඒක සිහියට අයිති නෑ ඒක අත්දැකීමක් විතරයි.** දැන් මේ ස්වභාවය ගැනයි අපිට කතා කරන්න තියෙන්නේ. අපිට සිහියට අසුවෙනවා කම්පනය වන ස්වභාවය. **කම්පනය දියවී ගෙන යන ස්වභාවය අර සෙනඟ ගොඩක් මැද්දේ අයිස් කැටයක් තිබ්බා වගේ. අර සෙනඟ ගොඩක් මැද්දේ කම්පනය වුණොත් ඒක කම්පනය, කම්පනය නොවුණොත් ඒක අයිස්කැටේ.** ඒ ස්වභාවය සිහියට අසුවෙනවා, කම්පනය වන ස්වභාවය සිහියට අසුවෙන එකෙන් කම්පනය නොවන ස්වභාවය නිර්ණය වෙන්නේ.

ඔය ඕභාස කියන ස්වභාවය නේද? ආයතනවලින් මිදිලා රූප දර්ශනයෙන් මිදිලා, ඕභාසය කියන ස්වභාවය කම්පනය නොවන ස්වභාවයක් තියෙන්නේ. ඕකත් දියවෙන ස්වභාවය සිහියට අසුවෙනවා. දැන් මෙතන අරහත්වයට පත්වෙන්න ඕනේ කියලනේ කියන්නේ. 'ස්ථවීර' භික්ෂූන් වහන්සේලා කියනවානේ එහෙනම් අරහත්වයට පත්වෙලා ඉන්නවා කියලා. ඇයි කම්පනය නොවන ස්භාවය තියෙනවා නම් අරහත්වයට පත්වෙලානේ. ඊට පස්සේ 'ඛේමක' භික්ෂූන් වහන්සේ කියනවනේ අරහත්වයට පත්වුණේ නෑ කියලා. ඒක ඊටත් වැඩිය තව ටිකක් එහාට යනවා නම් මේක සිහියත් අභිබවා ගෙන යනවා. සිහියත් අභිබවා ගෙන ගිය ස්වභාවයක්. සිහියට අසුවෙනවා කියන්න බෑ, ඒක ස්වභාවයක්.

**උපාසිකාව :** අවසරයි ආර්යන් වහන්ස. ඒක අත්දකින්නේ කොහොමද ආර්යන් වහන්ස. කියන්න මේක කියන්න බෑ කොහොමත් කියන්න බැරි ස්වභාවයක්.

**ආර්යයන් වහන්සේ :** නෑ මේක කියන්න පුළුවන්. මේක කියන්න බැරි පෘථග්ජනයෙකුටයි. මේක ආර්ය භූමියේ ආර්යන් වහන්සේලාට කියන්න පුළුවන්. බුදුන් වහන්සේ කියපු වචනෙ ගොඩක් අයට තේරුණේ

නැති එක විතරයි තියෙන්නේ. හැබැයි බුදුන් වහන්සේ කියපු වචනෙට වැඩිය පොඩ්ඩක් වෙනස්කරල ඊට වැඩිය ලිහිල්කරලා කියනවා. තුනී කරලා මොකද 'බුද්ධ' වචනෙත් තියෙන්නේ පාලි වචන. මේක කියන්න බැරි නම් ඔබ ඒ ස්වභාවයට පත්වෙලා නැති නිසයි බැරි. හැබැයි බුදුන් වහන්සේ ඒක කිව්වා ඒ අනුත්තර ස්වභාවයයි. අනන්තය දක්වා යන එකම ස්වභාවය. ඒ 'විමුක්ති සාරා' වෙමි. මොකක්ද බුදුන් වහන්සේ කිව්වේ. **'ඒතං ශාන්තං - ඒතං ප්‍රණීතං - යදිදං සබ්බ සංඛාරා සමතෝ'** කියපු තැන. ඒ මහා ශාන්ත ප්‍රණීත සුවය. මොකක්ද ඒ. මොකක්ද ඒ මහා සුවය. ඇත්තටම, ඔබට මේ සිහියත් අභිබවා ගිය සුකුම ස්වභාවයක් දැනෙන්න ගන්නවා. ඒක සිහියකට අසුවෙනවා කියල කියන්න බෑ. ඒක අත්දැකපු දවසකට තේරෙයි. **සිහියක් කියන එකත් දෙයක් පෙන්නුවොත් සීමාවක් තියෙනවා, මේකේ සීමාවක් නෑ. ඒකයි අනුත්තර ස්වභාවය කියලා කිව්වේ. 'එකම ස්වභාවයකට' අවධි වුණු ස්වභාවයක් දැනෙනවා. ඒක අත්දකින්න ලැබෙනවා. ඒකයි මේ හුළඟ ගැන ආර්යන් වහන්සේ කියන්නේ. ස්වභාවය දහමක් ගැන කියන්න ඕන හින්දා නෙමෙයි. ආර්යයන් වහන්සේගේ අභ්‍යන්තර පරිවර්තනය හුළඟ වගේ.**

ආර්යයන් වහන්සේ කියන හැම තැනකම කතා කරනවා. අහස දුක හිතිලද මන්දා කියල හුළඟ ගැන කතා කරනවා. ඇයි ආර්යන් වහන්සේ එහෙම කියන්නේ. හැබැයි මේ අත්දැකීම කවුරුහරි කිව්වොත් ඒක සිහියට හසුවෙනවා කියල මේක සිහිය කියල. එහෙම එකක් නෙමෙයි. සිහිය හැම තිස්සෙම දෙයක් සිහිය හැම තිස්සෙම කම්පනයක් එක්ක, කම්පනය නොවන ස්වභාවයක් සිහියට තියෙන්නේ ඒක. එතන තමයි පෙන්නන්නේ. නමුත් මේ ස්වභාවය ඔය කියන සිහියට අයිති එකක් නෙවෙයි. ඇත්තම කිව්වොත් මැරිලා ඉවරයි. ඒ මරණය තියෙන්නේ, පෘථග්ජන භාෂාවෙන් කිව්වොත් පෘථග්ජන මනුස්සයාට මරණයක් තියෙනවා. පෘථග්ජන මනුස්සයාට ඒකට කියන්නේ පෘථග්ජන භූමියේ මරණයක්. හැබැයි ආර්ය භූමියේ මේ ස්වභාවය මැරුණ කෙනෙක් හා සමානයි ඔන්න 'අනුත්තර ස්වභාවය.'

මේක නැහැයි කිව්වොත් කවුරුහරි ඔහු කවදාවත් රහත්භාවය අත්දැකලා නෑ. ඔහු හිනාවෙනවා නම් හිනාවෙන්නේ ඔහුටමයි. මේ

අන්තිම ටික අප කාටවත් මේක වෙනස් කරන්න බෑ. කිසි දවසක මේකේ ඉස්පිල්ලක්, ඇලපිල්ලක් වෙනස් කරන්න බෑ. ඒක සිහිය නෙමෙයි කියලා අහන්නත් එපා. ඔතෙන්ටයි යන්නේ. ඊට පස්සේ මොකක්ද දන්නවද කතාව, හැම මොහොතෙම මේ ස්වභාවය මතුවෙනවා. "දහවල යම් සේ රාත්‍රියත් එසේයි" "උඩ යම් සේද යටත් එසේයි." මේ හැම කම්පනයකටම අංශුවකටම අයිති නැති ස්වභාවයක් 'විමුක්ති සාරා' කියලා කියන්නේ. මේක නැතිවෙන්නේ නෑ. ඊට පස්සේ මේ 'අරහත්ත සමාධිය' 'සතර ඉරියව්වෙන්ම' තොරයි කිව්වේ ඒකයි. මේක නැති කරන්න බෑ. වෙනස්ම අවදියක් මතුවෙනවා කිව්වේ ඒකයි. ඒ මේ එකකටවත් අයිති නෑ, වෙනස්ම ස්වභාවයක් වෙනස්ම අවධියක්. ආර්යයන් වහන්සේ 'සුපර්එවකන්' කිව්වේ ඒකටයි, ඒ අනුත්තර ස්වභාවය. අභ්‍යන්තර පරිවර්තනයක් සිද්ධ වෙනවා. මේක ඉතාම වැදගත්. අභ්‍යන්තර පරිවර්තනයක් ලෝකයට දායාද කළේ. අබමල් රේණුවක්වත් මේ දක්වා පැහැදිලි කරලා තියෙන මේ දහම් පර්යාය වෙනස් කරන්න බෑ.

අනුත්තර කිව්වාට කිසිම කෙනෙකුට තේරෙන්නේ නෑ. මේක විග්‍රහ කරලා පෙන්වන එකයි ආර්යන් වහන්සේ කළේ. බුදුන් වහන්සේත් මේක නොකිව්වා නෙවෙයි. කෙනෙකුට තේරුම් ගන්න බැරිකම විතරයි තියෙන්නේ. ඒකට හේතුව ඒ අත්දැකීම් නැතුව කියන්න බෑ. අලමරියඥාන දර්ශනයත් අවසානයේ මෙන්න මේ විදියට විග්‍රහ කළා කියලා ලියලා තියන්න. මේක විසිවන සියවසේ ආශ්චර්යයක්. ගෞතම බුද්ධ ශාසනයේ නැවත පිබිදීම මෙතනයි තියෙන්නේ. හොඳමයි හැමෝටම තෙරුවන් සරණයි.

# 07

# තමාගේ ආත්ම ස්වභාවය හඳුනා ගන්න

**ආර්යයන් වහන්සේ :** ඔය සිතන ඒවා ඔක්කොම සිතිවිලි. මේ සිතිවිලි හඳුනාගන්න ඕන. **හිතන ඒවා කියන්නෙ ඔක්කොම සිතිවිලි. තමන් මේක හිතනව කියල දැනෙනව නම්, අන්න එතන දියුණුවක් තියෙනව.** තමන්ට දැනෙනව නම් මෙහෙම හිතන්නෙ මම ඉන්න හින්ද නේ කියල. මම ඉන්නව නේ ලොකුවට ඒ ආර්ය භූමිය නෙමෙයි. මමය ඉන්නව කියල හඳුනා ගන්න කොට. මේ මමය ඉන්නෙ කියල හඳුනා ගත්ත නම්, තමන්ට තේරෙනවා ආත්ම ස්වභාවය තියෙන්නෙ කියල. දරුව මතක් වෙන එකත් ආත්ම ස්වභාවයක්. ඒ දරුවා කියන ඇල්ම බැඳීම උපාදානය එනකොට ඒ තනිකරම පෘථග්ජන භූමියයි. ආර්ය භූමිය ඉස්සෙල්ලාම දැන ගන්න ඕන මොකක්ද මෙතන වෙන්නෙ කියන එක. දරුව ඉන්නෙ මට නේ, සෙන්සස්වල දරුවන් නැහැනේ. මෙතන ආත්ම ස්වභාවය කියල දැනගත්ත එකම, ඒකම දියුණුවට හේතුවක් වෙනව. දියුණුව කියන්නෙ මොකක්ද මමය දියවෙන එක නේ.

මමය, ගෙන් මිදෙන එකනේ නිවන් මග කියන්නෙ. ඒ ආත්ම ස්වභාවය කියල හඳුනා ගන්න ඕන. ඒ ආත්ම ස්වභාවය කියල හඳුනා ගන්න ඕන. ඒ ආත්ම ස්වභාවය දියවෙන මගයන්න ඕන. ඔක්කොම සිතිවිලි කියල හඳුනාගන්න ඕන. සිතුවිලි කියන්නෙ විඤ්ඤාණ මායාව නේ. විඤ්ඤාණ මායාව මවල නේ මේ ඔක්කොම දෙන්නෙ. ඔය හිතන ස්වභාවය දියුණුවක් නෙවෙයි. අභ්‍යන්තර සිහියට හසුවන එක. මේ ආත්ම ස්වභාවය කියල හිතන එක මේකමයි ක්ලේසය කියල ඒ ආත්ම ස්වභාවය සිහියට හසුවන එක. මේ මමය නේ හැම තැනම ඉන්නෙ,

කෙනෙක් ඉන්නව නේ. 'සෙන්සස්'වල කෙනෙක් ඉන්න විදියක් නැහැනේ. ආත්ම දෘෂ්ටිය තුළ ඉන්නව නේ. ආත්ම දෘෂ්ටිය හඳුනාගන්න ඕන. මමය නිරූපණය වන හැමතැනම ආත්ම දෘෂ්ටිය තියෙන්නෙ. ඒ ආත්ම දෘෂ්ටියක් මිසක් එහෙම එකක් නෑ කොහේවත්. ඒ දෘෂ්ටියට මේ මමය කියල මාව 'මේන්ටේන්' කරනව, මමය නිරූපණය වෙනව. ඒක දැනගන්න ඕන. ඒක දැනගත්තොත් මමය ගෙන් මිදෙන මග යන්න හැකියි.

ඔය විඤ්ඤාණ මායාව නේ මවල දෙන්නෙ, මනෝ විඤ්ඤාණයෙන් කෙනෙක් මවල දෙන්නෙ. මමය තමයි මතුවන්නෙ කියල දකින අය විතරයි, මමය ගෙන් යන්තම් හරි මිදෙන්නෙ. මමයගෙන් මිදි මිදී ගිය කෙනෙක් විතරයි මාර්ගයේ ඉන්නව කියල ආර්යන් වහන්සේ කියන්නෙ. අනිත් අය මාර්ගයේ නෑ. නිවන්මග නෑ. ඒ අයට නිවන් මගට එන්න මේක හඳුනාගන්න වෙනව. දැනුම තියෙන්න පුළුවන්. කොන්ටම් ගැන තරංග ගැන ආත්මය මැවෙන හැටි ඔක්කොම කියන්න පුළුවන්. හැබැයි ඒත් මිථ්‍යාදෘෂ්ටිකයි. ඇයි ඒ. ඒත් ඉන්නෙ පෝඩ්ඩිල භික්ෂුව හිටපු තැන. දැනුමත් විතරයි. දැනුම කියන්නෙ දැනුම තියෙන ආත්මයක් තියෙනව. කෙනෙක් ඉන්නව. ඒ ඉන්නෙත් කෙලෙස් ගොඩේම තමයි. කෙලෙස් ගින්නට අහුවෙලා තියෙන්නෙ. ධර්මය දැනුමක් කරගෙන තියෙනව එච්චරයි. ධර්මය දන්න කෙනෙක් ඉන්නව විඤ්ඤාණ මායාවෙ හසුවන කොට.

හැමෝටම මේ විඤ්ඤාණ මායාවත් එක්ක දන්න කෙනෙක් ඉන්නව නේ. ආත්මයක් තියෙනව නේ. එයාට හිතෙනව බණ කියන්න. ඕකම තමයි එන්නෙ, මාන, උද්දච්ච, අවිද්‍යා කියන එකට යටවෙනවා, විඤ්ඤාණ මායාවෙන් යට කරනව. ඇයි එයා ඉන්නව නේ ආත්මයක් තියෙනව නේ. එයා හිතනව දැන් දියුණුයි කියල එයා දන්නව කියල, එයා 'මාන්නය' නිසා අනිත් අයට ලොකුකම් පෙන්වනවා. මේක පිරිහීමක්. 'ධම්ම උද්දච්චය.' කිව්වෙ ඒකයි. 2015 වෙනකොට ආර්යන් වහන්සේ මේ මාර්ගය තුළ හොඳින් 'දර්ශන' අවබෝධයට පත්වෙනව. 2018 විතර ආර්යන් වහන්සේටත් ඕක වෙනව. මේක කියන්න ඕන කියලා. ඕක එන්නෙ ආත්ම සංඥාවෙන් විඤ්ඤාණ මායාවෙන්. ඊට පස්සෙ ආර්යන් වහන්සේ ලක්ෂයක් වියදම් කරල බණ කියනව. අන්තිමට මොකද වෙන්නෙ එක

බණයි කිව්වෙ. ස්ටේජ් එකට නගිනව වගේම බහි කොටම හිතුවා මේක පළවෙනි හා අන්තිම එක කියල. ආර්යන් වහන්සේට හොඳට තේරුණා මේ ඉන්නෙත් මමයම තමයි කියල. මේක හොඳට පත්තියම් වෙන්න ඕන කියල තේරුණා. මිනිස්සුත් මේක ගන්නෙ දැනුමට කියල දැනුණා, මේකෙන් මිනිස්සු නිවන් දකින්නෙ නෑ කියල හිතුණා. ඊට පස්සේ ආර්යන් වහන්සේ නිහඬයි.

ඊට පස්සේ ආරාමයකට ගිහිල්ල හාමුදුරුවන්ට මේක පැහැදිලි කළා. ගන්න බෑ කාටවත්. ඔක්කොම යන්නෙ 'ධම්ම උද්දච්චයට.' ඒ කියන්නෙ ප්‍රායෝගික පැත්ත නෑ. ඉන්පස්සෙ නිහඬයි. **ඇයි නිහඬ වන්නෙ. මමය දෙන්නෙ වෙන එකක්. විඤ්ඤාණ මායාවෙන් දෙන්නෙ.** දියුණුයි වගේ, **එහෙම එකක් නෑ මේකේ. ඒක අවබෝධ වුණාට පස්සෙ ඉවරයි ඒ කතාව. ඊට පස්සෙ 'කොටයක්' වගේ තමයි, අකම්පන ස්වභාවයක් තමයි තියෙන්නෙ.** මුලින්ම මමය සොයා ගන්න ඕන. ආත්මය තියෙනව. ආත්මය දියවෙන මග යන්න. එක එක ඒව හිත හිතා ඉඳීමෙන් පළක් නෑ. ඔය හිතන තැනම ආත්මය කියල දකින්න. තමන්ගේ ආත්මය හඳුනා ගන්න. ආත්මය දියවෙන මග යන්න. වෙන මගක් නෑ. **'ඒකායනෝ අයං භික්ඛවේ සත්ථානං විසුද්ධියා'** එකම මගයි මහණෙනි නිවනට. තමන්ගේ තියෙන ආත්ම ස්වභාවය හඳුනාගෙන දියවෙන මග යන්න. විඤ්ඤාණ මායාවලට රැවටිලා වැඩක් නෑ. සිතිවිලිවලින් මමයව මව මවා දෙන ඒව තේරුමක් නෑ.

'සබ්බ පාපස්ස අකරණං' එහෙනම් කුසලස්ස උපසම්පදා, සිහියට හසුවන්න ඕන මේ හැමතැනම විඤ්ඤාණ මායාවෙන් දෙන්නෙ කියල. එතකොට කෙනෙක් ඉන්නව නේ. යටින් ආත්මයක් නිරූපණය කරනවානේ. නැති මමෙක් හදාගෙන නිරූපණය කරනව. සද්දයට ආත්මයක් තිබුණද, වර්ණයට ආත්මයක් තිබුණද, ගඳට තිබුණද, රසට තිබුණද, උණුසුම සීතලට ආත්මයක් තිබුණද? කෙනෙක් ඉන්නව නේ. ආත්මයක් තියෙනව නේ මමනේ දරුවට කැමැති මමය ඉන්නවනේ. සිහියට හසුවුණොත්, අන්න එතන තමයි මමය දියවෙන මග යන්නෙ. ඒක හසුනොවෙනකම් ඒ මග යන්නෙ නෑ. මේ ධර්මය අහන අයත් එහෙමයි. ආත්මය තියෙනකම් හිරවෙලා ඉන්නෙ. ඇයි හම්බවෙන්නෙ නැහැනේ. යටින් ඒ

ආත්ම ස්වභාවය තුළ මට මෙහෙම කිව්ව කියල එන්නෙ ඒක නේ. ඵල කතාවක් නෑ මේකේ. කවුද ඵලයට පත්වෙන්නෙ. කොහේද කෙනෙක් ඉන්නෙ. **ආත්ම ස්වභාවය දියවී ගෙන යන තැන කොහේද? ඵලයක් තියෙන්නෙ. කවුද ඵලයට පත්වෙන්නෙ. ඵල නැතිකමයි අපේ ඵලය.** ඒ කියන්නෙ මේකෙ ආත්ම සංඥාව දියවීගෙන යන තැන තමන්ටම සිහියට හසුවෙනව. ඒ නොදැනෙන ස්වභාවය 'නිස්සත්තෝ නිජ්ජීවෝ ශූන්‍යයෝ කියන ස්වභාවය. ඒ ආත්ම ස්වභාවය දියවීගෙන යන ස්වභාවය තමයි මේකේ මමය දියවෙන තැන. මාන, උද්දච්ච, අවිද්‍යා ඔතනයි තියෙන්නෙ. දෙයක් තියෙනව නම් කෙනෙක් ඉන්නව තමන්ටම හසුවන්න ඕන, එතකම් 'සක්කාය දිට්ඨිය' ප්‍රහීන නැහැ. ඒක තමයි මග. ඒ මග යන්න ඕන මමය හඳුනගන්න ඕන. මමය දියවෙන මග යන්න ඕන. ඒ ප්‍රතිපදාව නැතිව කිසි කෙනෙක් නිවන් දකින්නෙ නෑ. මමය ඉන්නකම් උද්දච්චයට යන්නෙ.

"මහණෙනි ඇස නිත්‍යද, අනිත්‍යයද? අනිච්චං භන්තේ' 'මහණෙනි එහෙනම් ආත්මයක් තියෙනවද? 'නෝ හේතං භන්තේ' ඇසින් බලල දෙයක් කියල දරුව කියල. **දරුව හින්දා මම ඉන්න කොට, අන්න දැනෙනව සිහියට හසුවෙනවා මේ ආත්මය තියෙන්නෙ කියල. අනාත්ම ධර්මය අහුවෙලාද? නෑ. ඒක දැක්කොත් අන්න එතන 'කුසලස්ස උපසම්පදා' කුසලය දක්ෂතාව, මොකක්ද උපාදාන වෙන්නෙ නෑ ඒක. උපාදාන වෙන්න නෑ 'උපසම්පදා සීලය, 'උපාදානස්කන්ධයෙන් මිදෙන සීලය, 'ආර්යකාන්ත සීලය' දෙයක් නැතිකම දකින සීලය.' මේක තුළ ගොඩක් දියුණුව තියෙන්නෙ 'අල්පේච්ඡතාවයයි, මමයයි නැති වෙන්නෙ නිහඬවීමකට ලක්වනව.** මමය, නැති කරන්න හොඳම දේ තමයි මමය, කුඩු වෙනකම් ගහන්න ඕන. මමය කුඩුවෙන්න ගහන්න භාවිත කරන්න පුළුවන් කණ්ණාඩිය වගේ. මමය මට පෙන්වන්න, මමය දිය කරන්න ඕන කියල අහනව නම් අන්න හරි. ඒකට ආර්යන් වහන්සේ කල්‍යාණ මිත්‍රයා විදිහට ඉන්න ඕන. මමය පෙන්නල මමය කුඩුවෙන්න ගහන්න ඕන. ඒක තමයි ආර්ය භූමිය. ආත්ම ස්වභාවයෙන් මිදුණ තැන ඒ හැම කෙනෙක්ටම පුදුම සාන්ත සුවයක් දැනෙනව.

පොට්ඨපාද ඔබ නිවන් දකින්නෙ නෑ ආත්ම දෘෂ්ටිය තියෙනකම් කියල බුදුන් වහන්සේ කියනව නේ, මිදුණ දවසට නිවන් දකින්න පුළුවන්

කියනව නේ. ආත්මය තියාගෙන මොනව කළත් වැඩක් නෑ කියල. පොට්ඨපාද සූත්‍රය බලන්න පුළුවන්. ආර්යන් වහන්සේගේ දේශනා අහන අයටත් දැනුම එනවා. මමය, දියවෙන මග නැත්නම් මිථ්‍යාදෘෂ්ටිකයි. **මේකෙ දියුණු වෙන කෙනෙක් නෑ. කවුරුහරි කෙනෙක් නොදියුණුයි නම් අන්න එයා දියුණුයි. මොකක්ද ඒකෙ තේරුම. දියුණු වෙන්න ආත්මයක් තියෙනවද? මමය නැතිවෙන එක දියුණුවක්ද?**

මම දැන් දියුණුයි කියල හිතාගෙන ඒ ස්වභාවයෙන් විතක්ක මතුවෙන කොට, අපට තේරෙනවා මෙයා හරි ආඩම්බරයෙන්නේ කියන්නෙ මම දැන් දියුණුයි කියල. මට දැන් දැනෙන්නෙ නෑ කියල කියනවා. විඤ්ඤාණ මායාවෙන් මේ කියන්නෙ. එයා හිතාගෙන ඉන්නව එයා දියුණුයි කියලා. ඔය දියුණුවක් නෙවෙයි පිරිහීමක්. විඤ්ඤාණ මායාවෙන් තමයි ඔක්කොම මව මවා දෙන්නෙ.

**කවුරුහරි දියුණු නෑ කියනව නම් එයා අල්පේච්ඡතාවට ගිහිල්ල. හැම දේකින්ම පැත්තකට වෙලා හුදෙකලාව ඉන්නව. එයා තුළින් උද්දීපනය වෙන වචන කියවෙන්නෙ නෑ. ඒ විතක්කවල තියෙනව නිවීම. අන්න ඒකයි දියුණුව. තමන්ට තමන් නැතිවෙන ස්වභාවය දැනෙන කොට, එවැනි ස්වභාවයන් තමයි එන්නෙ කියන්නවත් හිතෙන්නෙ නෑ දියුණුයි කියල.**

පෘථග්ජන කෙනා හිතන්නෙ කොහොමද? ආ මෙතන මොකුත් නැහැ. ශූන්‍යයි නේ. විඤ්ඤාණ මායාවෙන් ශූන්‍යයි කිය කියා ඉන්නව. ඔය සිතුවිලි, විඤ්ඤාණ මායාවට රැවටිලා ඉන්නව. ඕක නෙවෙයි සැබෑම අභ්‍යන්තර පරිවර්තනය, ආත්ම ස්වභාවය බලන්න කතා කරන වචනවල මමය ඉන්නවද කියල. බලන්න සිතන සිතුවිල්ලේ ආත්මය නිරූපණය වෙනවද කියල. මමය මතුවෙනවද කියල. අනුන්ගේ ඒවා කියවනව නම්, ඕපදූප කියවනව නම්, අනුන්ගේ වැරදි පේනව නම් ඔය මමය ඉන්නෙ. කොහේද දියුණුවන්නෙ. දියුණුයි කියල හිතාගෙන ඉන්න හැම කෙනෙක්ම පිරිහිලා කියල හිතාගන්න.

මේකෙ තියෙන්නෙ හොඳ දියුණුවක්. පටි සංයුක්ත දේශනා තියෙන්නෙ අනුසෝතය නෙවෙයි, පටිසෝතයයි තියෙන්නෙ. **අනුසෝතය**

**තුළ චිත්ත නියාමය හැදිල තියෙන්නෙ හැම තිස්සෙම දෙයක් පෙන්වන්න. ඒ කියන්නෙ දෙයක් හැදෙනව. ඒකෙ තියෙන්නෙ හැම තිස්සෙම දියුණුවක් කියන වචනය. හැබැයි 'පටිසෝතයේ' තියෙන්නෙ දියුණුවක් නෙමෙයි. ඒකෙ 'අල්පේච්ඡතාව' වටිනාකමක් හරයක් නැති බව. කතා කරන කොට පවා උද්දීපනයක්වත් නැහැ. තමන් හැම තිස්සෙම තමාම සොයන්න ඕන. මගෙන් මිදෙන මග යන්න ඕන.** ඔය යන්නෙ මරණයට; මැරෙන්න යන්න ඕන. සම්මුතියෙ කතා කරනව නම් මැරෙන්න යනව තමයි, මරණය කියන එක තියෙන්නෙ සම්මුතියේ. පෘථග්ජනභාවයේ. එයට ලෝකයක් තියෙනව. එයත් ඉන්නව. ඇත්තටම මරණය අත්දකින්න.

**මරණය කියන්නෙ හැම තිස්සෙම දෙයක් තිබ්බොත්, ආත්මයක්, නිරූපණයක්, උද්දීපනයක්, කම්පනයක්. එහෙනම් ඒ ආත්මය උද්දීපනයක්. කම්පනයක් දියවෙන ස්වභාවය. මැරෙන්න කලින් ස්වභාවය මැරුණ වගේ ඉන්න එක. මරණයෙන් පස්සෙ ස්වභාවය දෙක සමානයි. අන්න මැරෙන මොහොත අකම්පිත ස්වභාවය එන්නේ එතකොට. මරණයක් නැති බව අවබෝධ වෙනකොට.** ඒක ලේසි නෑ, ඒක දැනුමක් විදියටයි එන්නෙ. එහෙම දෙයක් දන්න කෙනෙක් ඉන්න කොට එයා මරණය ජයගන්නව වෙනුවට. එයට තව ආත්ම දියවෙන්න එපැයි. ආත්මය තව බලවත් වෙනව. මේ දැනුම තුළ හැම තිස්සෙම ආත්මය බලවත් වෙනව. ඒ කියන්නෙ බණ කියන එකම ක්ලේෂයක්. බණ කියන කෙනෙක් ඉන්නව. බණ කියන්න බෑ විතක්කය නැතිව.

'ධම්මදින්නා' කියනව 'විශාඛට' හැම වචනයකටම යටින් විතක්ක තියෙන්නෙ කියලා. ඕකෙ තේරුම හැම බණ කියන කෙනෙක්ටම ක්ලේෂයක් තමයි තියෙන්නෙ. මේක ක්ලේෂයක් කියල දැනගෙන බණ කියන එක වෙනම කතාවක්. **බණ කියනව කියන්නෙ ක්ලේෂයක්, ධර්ම දේශනා කරන අය දැනගන්න ඕන මේ ක්ලේෂයක් බව. මොකද මේක යට තියෙන්නෙ 'විතක්ක.' මනසිකාර නොකර විතක්ක නොකර, වචනයක් කියන්න බෑ.** එතකොට හැම තිස්සෙම එතන දෙයක් නිරූපණය කරනවා, දෙයක් තියෙනව කියන්නෙ කෙනෙක් ඉන්නව. ආත්ම ස්වභාවයකින් තමයි එන්නෙ. ඒ කියන්නෙ ක්ලේෂයක්. ඒක අත්දකින එකක්., ඒකෙන් මිදෙන එක ලේසි නෑ. කොයිතරම් දක්ෂ වෙන්න ඕනෑ.

'අශ්ව ලෝමක් සියක් කඩකට පැලෙන්න විදීද ඒකත් විය හැකියි. 'ඒත් මේක සුඛර නොවේ' කිව්ව වගේ. ආර්යන් වහන්සේ මේ පැහැදිලි කරන සත්‍ය ලෝකෙට විවර වන මේ ක්ෂණයේ පටිච්චසමුප්පාද ධර්මය දෙයක් නොවන ස්වභාවය 'පටිච්ච සමුප්පාද ධම්මේසු ධම්මං.' දෙයක් නොවන ස්වභාවය දෙයක් හැදෙන හැටි කම්පනයකට මැවෙන ලෝකය බාහිර තියෙන දේවල් නොවන බව. මේ සියල්ල මේ ක්ෂණයේ ඇතුලේ ඥානයකට හසුවන ආකාරය. සිහිය කියන්නේ, කම්පනයෙම අනික් පැත්තේ නිරූපණය බව. **මුලින්ම එන්නේ සෘතමය දැනුමක්. පත්තියම් වෙන්න යනව අවුරුද්දක් දෙකක්.** ආර්යන් වහන්සේටත් එච්චර කාලයක් ගිහින් තියෙනව. ඒක නිසා තමයි ආර්යන් වහන්සේ කිසිම කෙනෙකුට කියන්නෙ නැත්තෙ දියුණුයි කියලා. කිසිම කෙනෙකුට 'එල දෙන්නෙත් නෑ.' ඵලයක් තියෙන්නෙත් නෑ. අභ්‍යන්තර පරිවර්තනය කියන එක ලේසි නෑ. ඒක එහෙම ලේසියෙන් වෙන්නෙ නෑ. මේක මතුවෙලා ටික කාලයයි. මේක අන්ත දෙකක දෝලනයක්නේ. එක් කෙනෙකුටවත් අභ්‍යන්තර පරිවර්තනයක් නෑ. දැනුමක් තියෙනව. **මේ යන්නෙ තථාගත සම්මා සම්බුදු පියාණන්ගෙ දේශනා. මේක කාටවත් අයිති නෑ, කිසි දවසක පුද්ගලයෙක් හමුවෙන්නෑ. මේ මැසෙන්ජර් එකක්.**

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මුද්‍රණය කරන එම ධර්ම ග්‍රන්ථ සඳහා ඔබටත් දායක විය හැක.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය
ගිණුම් අංක : 106161005988
බැංකුව : සම්පත් බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

බුද්ධොත්පාද ආරණ්‍ය සේනාසන කටයුතු වෙනුවෙන් දායක වමට දැන් ඔබටත් අවස්ථාව උදා වී ඇත.

බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය
ගිණුම් අංක : 100800597511
බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

කුසට අහරක් හිතට සරණක් යන තේමාව යටතේ
අසරණයින්ට පිහිට වීම උදෙසා මෙම සත්කාරය දියත් කර ඇත.
ඒ වෙනුවෙන් ඔබටත් දායක විය හැක.

මෙත්මල් අරණ සමාජ සේවා පදනම
ගිණුම් අංක : 100800598542
බැංකුව : ජාතික ඉතිරි කිරීමේ බැංකුව
ශාඛාව : බත්තරමුල්ල

**බුද්ධොත්පාද ධර්ම ග්‍රන්ථ සංසදය මගින් මෙතෙක් මුද්‍රණය කර ඇති ග්‍රන්ථ පහත සඳහන් වේ.**

1. සතිය කියන්නේ අපේ ගෙදර
2. මට මම නැතිවන හැටි
3. මොහොතට අවධිය (පළමු කොටස)
4. බුද්ධ දර්ශනය
5. නිවැරදි නිවන් මඟ හමුවිය
6. මොහොතට අවධිය (දෙවන කොටස)
7. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 1
8. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 2
9. අභිඥා ඥාණයට හසුවන පරම සත්‍යය - 3
10. The true dhamma has awakend, volume 1
11. The true dhamma has awakend, volume 2
12. The true dhamma has awakend, volume 3
13. මේ අසන මොහොතේම ඔබ නිවන් දකිනවා
14. ආර්ය කමටහන්
15. ලොවම දෙදරයි
16. සූත්‍ර දේශනා 01
17. සූත්‍ර දේශනා 02
18. සූත්‍ර දේශනා 03
19. මේ ගෞතම බුද්ධ සාසනයේ නැවත පිබිදීමයි
20. බුද්ධ ඥාණය අචින්ත්‍යයි
21. නොපෙනෙන සත්‍යය
22. සිතුවිල්ල මම නෙවෙයි
23. සබ්බ සංඛාර සමථය
24. බුද්ධ ඥානය අචින්ත්‍යයි - II (සිතක මැවෙන ලෝකය)
25. සිතුවිල්ලක දෙයක් කොයින්ද